# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 01

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

## 1 පත්‍රය

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

(01) ''සිව්සස් දහම්'' යනුවෙන් හඳුන්වන්නේ.
(1) සතර අගතිය ය. (2) චතුරාර්ය සත්‍යය ය.
(3) සතර සතිපට්ඨානය ය. (4) සතර ඍද්ධිපාදය ය.

(02) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය සිතින් දැඩිව අල්ලා ගැනීම,
(1) ජාතිය ඇතිවීමට හේතුවකි. (2) සංඛාර ඇතිවීමට හේතුවකි.
(3) භවය ඇතිවීමට හේතුවකි. (4) නාම රූප ඇතිවීමට හේතුවකි.

(03) සසර දුක ආකාර තුනකින් බුදු දහමේ විස්තර වේ. එහි ''සංඛාර දුක්ඛතා '' යනුවෙන් විස්තර වන්නේ.
(1) සාමාන්‍ය දුක ය.
(2) වෙනස්වීමේ දුක ය.
(3) ඇතිවීම් නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක ය.
(4) භෞතික සම්පත් නැතිවීමෙන් හටගන්නා දුක ය.

(04) මාර්ගාංග වශයෙන් අටකින් ද, "ශික්ෂා" වශයෙන් තුනකින් ද යුක්ත වන්නේ,
(1) දුක්ඛාර්ය සත්‍යයි. (2) දුක්ඛ සමුදාර්ය සත්‍යයි.
(3) දුක්ඛ නිරෝධාර්ය සත්‍යයි. (4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යයි.

(05) සෑම පාලකයෙකු ම තම මිතුරෙකු සම්බන්ධ ව පවත්නා හිතවත්කමට සමානව හිතවත් කමක් රටවැසියන් කෙරෙහි ද සියලුම සත්ත්වයන් කෙරෙහි ද දැක්වීමට යොමුවිය යුතුය. දේශපාලන මූලධර්මයක් වන සිව්බඹ විහරණවලට අනුව මෙම ගුණ ධර්මය,
(1) මෙත්තා නමින් හැඳින්වේ. (2) කරුණා නමින් හැඳින්වේ.
(3) මුදිතා නමින් හැඳින්වේ. (4) උපේක්ඛා නමින් හැඳින්වේ.

(06) පොළොන්නරු යුගයේ පැරණිම සිතුවම් (චිත්‍ර) පැවති ස්ථාන දෙකක් ලෙස හඳුනාගෙන ඇත්තේ,
(1) සීගිරිය හා තිවංක පිළිම ගෙයයි. (2) දිඹුලාගල ලෙන් හා තිවංක පිළිම ගෙයයි.
(3) දිඹුලාගල ලෙන් හා හිඳගල විහාරයයි. (4) මහියංගන ධාතුගර්භය හා හිඳගල විහාරයයි.

(07) අටුවා ග්‍රන්ථවල සම්මා දිට්ඨිය ආකාර පහකින් විස්තර වේ. එහි "සියල්ල අනිත්‍ය, දුක්ඛ අනාත්ම" වශයෙන් දැකීම,
(1) කම්මස්සකතා සම්මා දිට්ඨියයි. (2) ධ්‍යාන සම්මා දිට්ඨියයි.
(3) විදර්ශනා සම්මා දිට්ඨියයි. (4) මාර්ග සම්මා දිට්ඨියයි.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(08) ස්වයංවරයකින් තෝරාගත් රූමත් භද්දකච්චානා කුමරිය හෙවත් යසෝදරා කුමරිය සිදුහත් කුමරුගේ විවාහක බිරිඳ වූවා ය. ඇගේ පියා වූයේ.

(1) බිම්බිසාර රජතුමා ය. (2) මහානාම රජතුමා ය.
(3) කෝසල රජතුමා ය. (4) සුප්‍රබුද්ධ රජතුමා ය.

(09) දාගැබ් කර්මාන්තයේ යෙදුන සියලුම කාර්මිකයන්ට ආහාරපාන ඇඳුම් පැළඳුම් හා වැටුප් පිරිනැමූ බව මහාවංශයේ සඳහන්වේ.මෙම රජතුමා නම්,

(1) දුටු ගැමුණු රජතුමා ය. (2) දේවානම්පියතිස්ස රජතුමා ය.
(3) කාවන්තිස්ස රජතුමා ය. (4) සද්ධාතිස්ස රජතුමා ය.

(10) බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ගතකර ඇත්තේ,

(1) පස්වන වස්කාලයයි. (2) හයවන වස්කාලයයි.
(3) හත්වන වස්කාලයයි. (4) අටවන වස්කාලයයි.

(11) පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම, මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූතයන් යෙදවීම යන ප්‍රතිඵල දැකිය හැකි වන්නේ,

(1) දෙවන ධර්ම සංගායනාවේ දී ය. (2) තෙවන ධර්ම සංගායනාවේ දී ය.
(3) කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය. (4) අළුවිහාර සංගායනාවේ දී ය.

(12) සිල් රැකීමේ ආනිශංස පහක් පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. එම පහට අයත් නොවන පිළිතුර තෝරන්න. සිල්වන්තයා,

(1) මහත්වූ භෝග සම්පත් අත්පත් කරගනියි. (2) මරණින් මතු සුගතියේ උපදියි.
(3) ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළැඹෙයි.(4) ගින්නෙන් හා වස විසවලින් වැළකෙයි.

(13) බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනයේ දී තණ්හාව ආකාර තුනක් වන අයුරු දේශනා කොට ඇත. එහි භව තණ්හාව යනුවෙන් හඳුන්වා ඇත්තේ.

(1) කම්සැප විඳීමට ඇති ආශාවයි.
(2) පරලොවක් නැත යන විශ්වාසයයි.
(3) මම හෙවත් ආත්මය පිළිබඳ අශාවයි.
(4) මෙලොව හැකිතාක් කම්සැප විඳීමයි.

(14) මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු තිස් අටෙන් වැඩි ප්‍රමාණයක් අදාළ වන්නේ,

(1) මෙලොව ජීවිතයේ දියුණුව සඳහා ය. (2) පරලොව ජීවිතයේ දියුණුව සඳහා ය.
(3) දෙලොව ජීවිතයේ ම දියුණුව සඳහා ය. (4) පැවිදි ජීවිතයේ දියුණුව සඳහා ය.

(15) යුද ගැටුම් බහුල කාලයක් වීම, දුර්භික්ෂ කාලයක් ඇතිවීම, භික්ෂූන් ශාසනික පිළිවෙත්වලින් බැහැර වීම හා කණ්ඩායම් දෙකකට බෙදීම, රාජ්‍ය අනුග්‍රහය නොලැබීම යන හේතු ප්‍රධාන වශයෙන් බලපෑවේ,

(1) දෙවන ධර්ම සංගායනාවටයි. (2) තෙවන ධර්ම සංගායනාවටයි.
(3) අළුවිහාර ධර්ම සංගායනාවටයි. (4) කණිෂ්ක ධර්ම සංගායනාවටයි.

(16) රීස් ඩේවිඩ්ස් වැනි මහා පඬිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXT SOCITY) පිහිට වූයේ,

(1) ශ්‍රී ලංකාවේ ය. (2) එංගලන්තයේ ය.
(3) ඉන්දියාවේ ය. (4) අමෙරිකාවේ ය.

(17) ලෞකික සිත නිතරම පැරණි හුරුපුරුදුවලින් පිරී ඇත. සිත අලුත් මුහුණුවරකට ගැනීමට නම් මහත් වෙහෙසක් දැරීමට සිදුවේ. එම උත්සහය ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ හඳුන්වා ඇත්තේ.

(1) සම්මා සංකප්ප යනුවෙනි. (2) සම්මා කම්මන්ත යනුවෙනි.
(3) සම්මා වායාම යනුවෙනි. (4) සම්මා ආජීව යනුවෙනි.

(18) ජීවිතය හා ලෝකය පිළිබඳව ත්‍රිලක්ෂණයට අනුව බලමින් ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ කරගෙන අවසානයේ ප්‍රඥාව උපදවාගෙන නිර්වාණ මාර්ගය සාක්ෂාත් කරගත හැකි භාවනාව නම්,

(1) සමථ භාවනාවයි. (2) විදර්ශනා භාවනාවයි.
(3) මෛත්‍රී භාවනාවයි. (4) බුද්ධානුස්සති භාවනාවයි.

(19) ගිහි බෞද්ධයා විසින් උපයන ධනය මනාව කළමනාකරණය කිරීම පිළිබඳව අගනා දේශනාවක් "පත්තකම්ම සූත්‍රයේ" දක්වේ. බුදුරජාණන් වහන්සේ එම සූත්‍ර දේශනාව දේශනා කළේ,

(1) අනේපිඬු සිටුතුමාට ය. (2) චිත්ත සිටුතුමාට ය.
(3) මිගාර සිටුතුමාට ය. (4) කුක්කුට සිටුතුමාට ය.

(20) 1917 ඔක්තෝම්බර් 26 වන දින බුරුමයේ ධම්මිකාරාම සීමාවේදී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූයේ,

(1) සිරිදේවමිත්ත ධර්මපාල හිමියන් ය. (2) සරණංකර සංඝරාජ හිමියන් ය.
(3) රේරුකානේ චන්දවිමල නාහිමියන් ය. (4) බලංගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමියන් ය.

(21) සමථ භාවනාව වැඩීමට බලාපොරොත්තු වන කෙනෙකු තම චරිත ලක්ෂණවලට අනුව කර්මාචාර්යවරයෙකුගෙන් උපදෙස් ලැබිය යුතු චරිත වර්ග හයක් දක්වේ.එහි මුලාව, මෝඩකම අධික චරිත ලෙස දක්වා ඇත්තේ,

(1) රාග චරිතයන් ය. (2) ද්වේෂ චරිතයන් ය.
(3) මෝහ චරිතයන් ය. (4) විතර්ක චරිතයන් ය.

(22) සතර සංග්‍රහ වස්තුවල අනුන්ගේ යහපත හා අනුන්ගේ දියුණුව පිණිස කටයුතු කිරීම,

(1) දානය නම් වේ. (2) ප්‍රිය වචනය නම් වේ.
(3) අර්ථචර්යාව නම් වේ. (4) සමානාත්මතා නම් වේ.

(23) බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන් උන්වහන්සේ අනුගමනය කිරීමට පෙළඹුණු ඇතම් අය උන්වහන්සේගේ බාහිර රූපසම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය කෙරෙහි ප්‍රසාදයක් ඇති කර ගත්හ. ඒ සඳහා හොඳම නිදර්ශනය නම්,

(1) ඛේමාගේ කතාවයි. (2) රූපනන්දාගේ කතාවයි.
(3) උපතිස්ස පිරිවැජියාගේ කතාවයි. (4) වක්කලී හිමියන්ගේ කතාවයි.

(24) දොළොස්වන වස් කාලයේ වේරංජා නුවරදී බුදුරජාණන් වහන්සේට කටුක ආහාර වළඳමින් වස් තුන් මස ගත කරන්නට සිදුවීය, එම වස් ආරාධනාව සිදු කළේ,

(1) චංකී බමුණා ය. (2) උදය බමුණා ය.
(3) සෝණදණ්ඩ බමුණා ය. (4) කසීභාරද්වාජ බමුණා ය.

(25) ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධව සිව් දිසාවට මුහුණලා තනන ලද අලංකාර තොරණ වැනි අංගය,

(1) වටදාගෙය නමින් හැඳින්වේ. (2) මුරගල නමින් හැඳින්වේ.
(3) වාහල්කඩ නමින් හැඳන්වේ. (4) පියගැට පෙළ නමින් හැඳින්වේ.

(26) නීතිය ක්‍රියාත්මක කරමින් නීතිවිරෝධී අධාර්මික ක්‍රියා වැළැක්වීම යහපත් පාලකයෙකුගේ ලක්ෂණයකි. මෙය සඳහන් වන්නේ,
(1) දසරාජ ධර්මයේ ය. (2) සප්ත අපරිහානී ධර්මයේ ය.
(3) පංච සීලයේ ය. (4) දස සක්විතිවත්වල ය.

(27) භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය වශයෙන් ප්‍රකට වූ" කව්සිළුමිණ" නම් කෘතිය දඹදෙණි යුගයේ දී රචනා විය.එහි කතුවරයා වූයේ,
(1) දෙවන පැරකුම්බා රජතුමා ය. (2) ධර්මසේන හිමියන් ය.
(3) විද්‍යා චක්‍රවර්ති පඬිවරයා ය. (4) බුද්ධපුත්‍ර හිමියන් ය.

(28) පොළොන්නරුව සත්මහල් ප්‍රාසාදය චතුරස්‍රාකාර ස්තූපයක් ලෙස සඳහන් කළේ,
(1) මහාචාර්ය ශිරාන් දැරණියගල මහතා ය. (2) මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ය.
(3) මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. (4) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ය.

(29) "සෞඛ්‍ය පහසුකම් සපයාදීම හා සුදුසු අවස්ථාවන්හි විවේක ලබාදීම" යන යුතුකම් දෙක ඉටුකළ යුත්තේ,
(1) සේවකයා විසින් ස්වාමියාට ය. (2) ස්වාමියා විසින් බිරිඳට ය.
(3) ස්වාමියා විසින් සේවකයාට ය. (4) බිරිඳ විසින් ස්වාමියාට ය.

(30) ණයකාරයෙකු ණය හිමියෙකුට බැඳීමක් ඇතිවිට වහලෙකු මෙන් යටත් වේ. එහෙයින් අපගේ සමාධියට බාධාවන කාමච්ඡන්දය යටපත් කිරීමට කටයුතු කළ යුතුය. කාමච්ඡන්ද නීවරණය පිළිබඳව මෙසේ සඳහන් වන්නේ,
(1) පත්තකම්ම සූත්‍රයේ ය. (2) චූල්ලකම්මවිභංග සූත්‍රයේ ය.
(3) භද්දාලි සූත්‍රයේ ය. (4) සාමඤ්ඤඵල සූත්‍රයේ ය.

(31) ජීවිතයට හානියක් වුවද කම්සැප නොවිඳවීම හැඳින්වෙන්නේ,
(1) නෙක්ඛම්ම පාරමිතා යනුවෙනි. (2) නෙක්ඛම්ම උපපාරමිතා යනුවෙනි.
(3) නෙක්ඛම්ම පරමත්ථ පාරමිතා යනුවෙනි. (4) සීල පරමත්ථ පාරමිතා යනුවෙනි.

(32) බුදුරජාණන් වහන්සේ තම දෛනික කාල සටහන ට අනුව කටයුතු කළ සේක. එම දින චරියාවෙහි මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ සිටියේ,
(1) පෙරබත්කිස අවස්ථාවේ දී ය. (2) පසුබත්කිස අවස්ථාවේ දී ය.
(3) පෙරයම්කිස අවස්ථාවේ දී ය. (4) පැසුළුයම්කිස අවස්ථාවේ දී ය.

(33) සිවි ජාතකය හා මඛාදේව ජාතකය තුළින් ප්‍රකට වන පාරමිතා දෙක පිළිවෙළින්,
(1) දාන පාරමිතාව හා නෙක්ඛම්ම පාරමිතාවයි.
(2) නෙක්ඛම්ම පාරමිතාව හා දාන පාරමිතාවයි.
(3) දාන පාරමිතාව හා වීර්ය පාරමිතාව.
(4) වීර්ය පාරමිතාව හා දාන පාරමිතාවයි.

(34) තිරිසන් සත්ත්ව වර්ගයා අතර වෙනස්කම් පැවතියද මිනිසුන් අතර එවැනි වෙනස්කම් නොමැති බව ජීව විද්‍යාත්මකව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළේ,
(1) පොට්ඨපාද සූත්‍රයේ ය. (2) වාසෙට්ඨ සූත්‍රයේ ය.
(3) ද්‍රෝණ සූත්‍රයේ ය. (4) සිගාලෝවාද සූත්‍රයේ ය.

ජාතික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(35) බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවසන විට එහි පැමිණි තෝදෙය්‍යපුත්‍ර සුභ නම් තරුණයා පුද්ගල විසමතාවන් දාහතරක් පිළිබඳව කරුණු විමසා ඇත. එහි "දුප්පඤ්ඤා" යනුවෙන් දක්වා ඇත්තේ,

(1) දීර්ඝායු ඇති අයයි. (2) අවලස්සන අයයි.
(3) යසස් නැති අයයි. (4) නුවනින් අඩු අයයි.

(36) හේතුප්‍රත්‍ය ඇති කල ඇති වන්නා වූ ධර්මයෝ හේතුප්‍රත්‍ය නැති කල නැතිවෙත්, යන මෙකී දහම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබේ. මෙම දේශනාව කළේ,

(1) කොණ්ඩඤ්ඤ තෙරුන් විසින් ය. (2) වප්ප තෙරුන් විසින් ය.
(3) මහානාම තෙරුන් විසින් ය. (4) අස්සජි තෙරුන් විසින් ය.

(37) අගනුවර ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරික දොන් කරෝලිස් හේවාවිතාරණ හා මල්ලිකා ධර්ම ගුණවර්ධන මැතිණිය දෙමව්පියන් වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරන කුමරුවන්ට ය. ඔහු උපන්නේ,

(1) 1874 සැප්තැම්බර් 14 වන දිනයි. (2) 1933 ජනවාරි 16 වන දිනයි.
(3) 1864 සැප්තැම්බර් 17 වන දිනයි. (4) 1933 අප්‍රේල් 29 වන දිනයි.

(38) "පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඈ ........... යනුවෙන් ග්‍රන්ථකරණය සඳහා බෝසත් චරිතය හා බුද්ධ චරිතය භාවිත කළ යුතු" යැය යන උපදේශනය ඇතුළත් වන්නේ,

(1) සිඛවළඳ හා සිඛවළඳ විනිස නම් කෘතියේ ය.
(2) කව්සිළුමිණ නම් කෘතියේ ය.
(3) ලෝකෝපකාරය නම් කෘතියේ ය.
(4) සියබස්ලකර නම් කෘතියේ ය.

(39) සිසු දරුවන්ට උදවු කිරීමට තිබූ කැමැත්ත, නිරහංකාර බව, ස්ථිර අධිෂ්ඨානය වැනි ආදර්ශයන් අපට ගත හැකි වන්නේ,

(1) වැලිවිට සිරි සරණංකර සංඝරාජ හිමියන්ගේ චරිතයෙනි.
(2) මහාචාර්ය රේරුකානේ චන්ද්‍රවිමල හිමියන්ගේ චරිතයෙනි.
(3) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ චරිතයෙනි.
(4) දුටුගැමුණු රජතුමාගේ චරිතයෙනි.

(40) ගරු කළයුත්තන්ට ගරු නොකිරීම, පිදිය යුත්තන් නොපිදීම, අධික මානයෙන් යුක්ත වීම නිසා මරණින් මතු,

(1) අල්පභෝගීව ඉපදීමට හේතු වේ. (2) පහත් කුලයන්හි ඉපදීමට හේතු වේ.
(3) දුර්වර්ණව ඉපදීමට හේතු වේ. (4) ආබාධ සහිත ව ඉපදීමට හේතු වේ.

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 01

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

(01)

i. ක්‍රි.පූ. හයවන සියවසේ බුද්ධ කාලීන භාරතයේ ප්‍රධාන වශයෙන් පිළිගත් විමුක්තිකාමී ප්‍රතිපදාවන් දෙක නම් කරන්න.

----------------------------------------

----------------------------------------

ii. භාරතයේ පැවැත්වූ හතරවන ධර්ම සංගායනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

----------------------------------------

----------------------------------------

iii. පරාභව සූත්‍රයේ දැක්වෙන පරිදි පුද්ගලයෙකුගේ පිරිහීමට හේතුවන කරුණු අතරින් දෙකක් ලියන්න.

----------------------------------------

----------------------------------------

iv. ධ්‍යාන මුද්‍රාව හා අභය මුද්‍රාව ප්‍රකට වන බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න.

----------------------------------------

----------------------------------------

v. බුදු සිරිතෙන් තාදී ගුණය ප්‍රකටවන අවස්ථා දෙකක් ලියන්න.

----------------------------------------

----------------------------------------

vi. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ධාර්මිකව උපයාගත් ධනය විනාශ වන ක්‍රම දෙකක් ලියන්න.

----------------------------------------

----------------------------------------

vii. ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ රාහුල හිමියන් විසින් රචිත සංදේශ කෘති දෙකක් ලියන්න.

----------------------------------------

----------------------------------------

viii. ............................................"පිරිසිදු සිල් ගිහිණි - සියල්ලෝ වියතුන්ට සිළුමිණි" මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කර ලියන්න.

----------------------------------------

----------------------------------------

ix. එළාර රජතුමාට පෙර අනුරාධපුරයේ රජ කළ ද්‍රවිඩ රජවරු දෙදෙනා නම් කරන්න.

----------------------------------------

----------------------------------------

x. ධම්ම පදයේ සඳහන් ගාථා සංඛ්‍යාව හා නිදාන කතා සංඛ්‍යාව කොපමණ ද?

----------------------------------------

----------------------------------------

(2 x 10 = 20)

02) i. ..........................................................සෙන්ති චාපාතිඛීණාව - පුරාණානි අනුත්ථුනං මෙම ගාථාව සම්පූර්ණ වීමට අවශ්‍ය ගාථාවේ මුල්පද දෙක සම්පූර්ණ කර ලියන්න.

ii. එහි සරල අදහස ලියන්න.

iii. සීලාදී ගුණධර්මයන් නොපිරීමත්, ජීවත් වීමට ප්‍රමාණවත් ධනයක් නොමැති වීමත් නිසා වයස් ගත වූ විට පසුතැවීමට හේතු වේ. මහළු විය සතුටින් ගත කිරීමට නම් ළමා හා තරුණ අවධිවල කටයුතු කළයුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 =10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(03) i. මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු ගණන කීයද? .

ii. මහා මංගල සූත්‍රයේ සඳහන් පළමු, දෙවන හා තුන්වන මංගල කරුණු තුන පිළිවෙළින් ලියා දක්වන්න.

iii. ඉහත ඔබ දැක්වූ මංගල කරුණු තුන ඔබගේ ශිෂ්‍ය ජීවිතයේ දියුණුවට කොතරම් ඉවහල් වන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 =10)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04) i. අළුවිහාර ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

ii. එම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල දෙකක් ලියන්න.

iii. සමාජගත ගැටලුවක් මතු වූ විට ධර්ම සංගායනා ක්‍රමවේදය ඔස්සේ එය විසඳා ගැනීමේ ප්‍රයෝජන සාකච්ඡා කරන්න.

(ලකුණු 2 + 3 + 5 =10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05) i. චතුරාර්ය සත්‍ය පිළිවෙළින් නම් කරන්න.

ii. අසාර බව, අතෘප්තිකර බව, තුච්ඡ බව, අර්ථ ශූන්‍ය බව "දුක්ඛ" යන බුද්ධ වචනයේ ගැඹුරු තේරුමයි. මේ සසර දුක තුන් ආකාරයකින් ධර්මයේ විස්තරවේ. ඒ මොනවාද?

iii. විභාගයෙන් අසමත්වීම යන ගැටලුව විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය මූලධර්මය භාවිත කළ හැකි අයුරු සාකච්ඡා කරන්න.

(ලකුණු 2 + 3 + 5 =10)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(06) i. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ හිටි පිළිම වර්ග දෙකකි. එනම් ආබද්ධ හිටි පිළිම හා අනාබද්ධ හිටි පිළිම වේ. මෙම දෙවර්ගය සඳහා නිදසුන් පිළිම වර්ග දෙකක් නම් කරන්න.

ii. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී හිඳි පිළිම සඳහා යොදාගත් ආසන තුනක් දක්වන්න.

iii. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාව හෙළ කලා කරුවාගේ විශ්මිත නිර්මාණ ශිල්පයට නිදර්ශන වෙයි, පහදන්න.

(ලකුණු 2 + 3 + 5 =10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. ආරක්ඛ සම්පදා.

ii. කෝට්ටේ සාහිත්‍ය යුගය.

iii. දුටු ගැමුණු රජතුමා

iv. තාදී ගුණය.

(ලකුණු 5 + 5 =10)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
I **පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 3 | 21. | 3 | 31. | 3 |
| 2. | 3 | 12. | 4 | 22. | 3 | 32. | 4 |
| 3. | 3 | 13. | 3 | 23. | 4 | 33. | 1 |
| 4. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 2 |
| 5. | 1 | 15. | 3 | 25. | 3 | 35. | 4 |
| 6. | 2 | 16. | 2 | 26. | 4 | 36. | 4 |
| 7. | 3 | 17. | 3 | 27. | 1 | 37. | 3 |
| 8. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 4 |
| 9. | 1 | 19. | 1 | 29. | 3 | 39. | 1 |
| 10. | 1 | 20. | 3 | 30. | 4 | 40. | 2 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

II **පත්‍රය**

(01)
- i අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය .
- ii කණිෂ්ක ධර්ම සංගායනාව හා සර්වාස්තිවාදී ධර්ම සංගායනාව
- iii බාලයන් ඇසුරු නොකිරීම හා පණ්ඩිතයන් ඇසුරු කිරීම.
- iv අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව/ තොළුවිල බුද්ධ ප්‍රතිමාව (සමාධි මුද්‍රාව) අවුකන බුද්ධ ප්‍රතිමාව (අභය මුද්‍රාව).
- v 11 ශ්‍රේණිය පෙළපොත 13 පිටුව තාදි ගුණය කොටස බලන්න.
- vi රජයට අයත්වීම, සොරුන් විසින් පැහැර ගැනීම, ගින්නෙන් හෝ ජලයෙන් විනාශ වීම, තමා ප්‍රිය නොකරන අයට අයත්වීම.
- vii සැළලිහිණි සංදේශය හා පරෙවි සංදේශය
- viii සව්සත කෙළ පැමිණි - ගුරුවරුන් දෙරණ සපැමිණි
- ix සේන හා ගුත්තික
- x ගාථා 423 නිදාන කතා 299

(02)
- i අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ ධනං
- ii 11 ශ්‍රේණිය පෙළ පොත 53 පිටුව.
- iii ඉහත ගාථාවෙන් කියවෙන අදහස ඉස්මතුවන සේ පිළිතුරු ලිවිය යුතුය.

(03)
- i මංගල කරුණු 38 කි.
- ii
  - අනුවණයින් ඇසුරු නොකිරීම.
  - නුවණැත්තන් ඇසුරු කිරීම.
  - පිදිය යුත්තන් පිදීම
- iii 11 ශ්‍රේණිය පෙළ පොතෙහි 08 පාඩම පිටු අංක 67 හි මහා මංගල සූත්‍රයේ.
  ඉහත මංගල කරුණු 03 ට අදාළව ශිෂ්‍ය ජීවිතයේ සංවර්ධනයට ගළපා කරුණු ඉදිරිපත් කිරීම

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04) i. වළගම්බා රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය නොලැබීම, බැමිණිතියාසාය නම් සාගතය ඇතිවීම, වළගම්බා රාජ්‍ය සමය යුධ ගැටුම් බහුලවීම, ලක්දිව ඇතැම් භික්ෂූන් කණ්ඩායම් දෙකකට බෙදීම (ග්‍රන්ථ ධූර හා විදර්ශණා ධූර) හා ශාසනික පිළිවෙත් නොපිරීම, ධර්මය ඇසීමටත් ඉගෙනීමටත් පර්යේෂණ කිරීමටත් ඇතමුන් තුළ උනන්දුවක් නොමැතිවීම.

ii. 10 ශ්‍රේණිය පෙළපොත 104 පිටුව

iii. සමාජගත ගැටලුවක් ධර්මසංගායනා ඇසුරින් විසඳාගත හැකි අයුරු පිළිතුරෙහි ඇතුළත් විය යුතු ය.

(05) i. දුක්ඛාර්ය සත්‍යය, දුක්ඛ සමුදාර්ය සත්‍යය, දුක්ඛ නිරෝධාර්ය සත්‍යය , දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්ය සත්‍යය.

ii. දුක්ඛ දුක්ඛතා (සාමාන්‍ය දුක), විපරිනාම දුක්ඛතා (වෙනස් වීමේ දුක), සංඛාර දුක්ඛතා (ඇතිවීම් නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක)

iii. චතුරාර්ය සත්‍ය ඉගැන්වීම් අදාළ ගැටළුව විසඳා ගැනීමට උපකාර වන අයුරු පිළිතුරෙහි අඩංගුව තිබිය යුතු වේ.

(06) i. ආබද්ධ - අවුකන පිළිමය, අනාබද්ධ - මාළිගාවිල පිළිමය

ii. වීරාසනය, භද්‍රාසනය, පද්මාසනය

iii. හෙළ කලාකරුවාගේ විශ්මිත නිර්මාණ ශිල්පය ප්‍රකටවන සේ පිළිතුර සකස්විය යුතු ය.

(07) i 11 ශ්‍රේණිය පෙළ පොත20 පාඩම 147.

ii 11 ශ්‍රේණිය පෙළ පොත 19 පාඩම 140.

iii 10 ශ්‍රේණිය පෙළ පොත පිටු අංක 37, 3 .

iv 11 ශ්‍රේණිය පෙළ පොත පිටු අංක 13, 15 .

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය 02

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

## 1 පත්‍රය

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

---

(01) සිදුහත් බෝසත් කුමරු උපන් මොහොතේ සිදුවූ අසිරිමත් සිදුවීම්වලින් එකක් වන්නේ,
(1) පංච මහා විලෝකනයයි. (2) අභීත සිංහ නාදය පැවැත්වීමයි.
(3) පෙර නිමිති සතරක් දැකීමයි. (4) දෙවියන් සිදු කළ ආරාධනයයි.

(02) අභියෝගවලට මුහුණ දෙමින් යන සසර ගමනේ දී බෞද්ධයාගේ පරමාදර්ශී චරිතය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේ ය. (2) තමන්ගේ මව හෝ පියා ය.
(3) තමන් කැමතිම ගුරුවරයා ය. (4) පාලනය කළ තමාගේ සිත ය.

(03) මෙලොව දී තමා විසින්ම පිළිපැද ප්‍රතිඵල තමාගේ ඇස් ඉදිරිපිටදී ම දැක ගත හැකි නිසා ධර්ම රත්නය,
(1) ස්වාක්ඛාත නම් වන සේක. (2) සන්දිට්ඨික නම් වන සේක.
(3) අකාලික නම් වන සේක. (4) ඕපනයික නම් වන සේක.

(04) අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය හෙවත් අකම්ප්‍ය ගුණය ලෙස හැඳින්වෙන්නේ,
(1) මහා ප්‍රඥා ගුණයයි. (2) අසරණ සරණ ගුණයයි.
(3) පුරිසදම්ම සාරථී ගුණයයි. (4) තාදී ගුණයයි.

(05) "සමථය" යන වචනයෙහි තේරුම වන්නේ,
(1) "ලෝකය අනිත්‍ය ලෙස දැකීම" යන්නයි. (2) "සියලු කෙලෙසුන් නැසීම" යන්නයි.
(3) "සිත සන්සුන් කිරීම" යන්නයි. (4) "ශ්‍රද්ධාව ඇති කිරීම" යන්නයි.

(06) සිතෙහි නොසන්සුන්කම හා පසුතැවෙන ස්වභාවය,
(1) "කාමච්ඡන්ද" නම් වේ. (2) "ථිනමිද්ධ" නම් වේ.
(3) "උද්ධච්ච කුක්කුච්ච" නම් වේ. (4) "විචිකිච්ඡා" නම් වේ.

(07) බෝසතාණන් වහන්සේලා බුද්ධ කාරක ධර්ම පුහුණු කිරීමේ දී,
(1) කරුණාවෙන් තොර වෙති. (2) උපාය කෞශල්‍යයෙන් තොර වෙති.
(3) ශ්‍රද්ධාවෙන් තොර වෙති. (4) මානයෙන් තොර වෙති

(08) මඛාදේව ජාතකයෙන් පැහැදිලි වන්නේ අප මහා බෝසතාණන් වහන්සේ,
(1) නෙක්ඛම්ම පාරමිතාව පිරූ ආකාරයයි. (2) ඛන්ති පාරමිතාව පිරූ ආකාරයයි.
(3) අධිට්ඨාන පාරමිතාව පිරූ ආකාරයයි. (3) උපේක්ඛා පාරමිතාව පිරූ ආකාරයයි.

(09) වැලිවිට ශ්‍රී සරණංකර නාහිමියන්ට සංඝරාජ පදවිය පිරිනමනු ලැබුයේ,
- (1) මහා විජයබාහු රජතුමා විසිනි. (2) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසිනි.
- (3) ඇහැලේපොළ නිළමේතුමා විසිනි. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසිනි.

(10) දුටුගැමුණු මහ රජතුමාගේ ප්‍රධානතම ශාසනික මෙහෙවර ලෙස සැලකෙන්නේ,
- (1) ලෝවාමහා ප්‍රාසාදය ඉදිකිරීමයි. (2) රුවන්වැලි මහා සෑය ඉදි කිරීමයි.
- (3) තමා කළ පින් පොතක ලිවීමයි. (4) භික්ෂූන් වහන්සේට දන් පිදීමයි.

(11) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහෙන් එකක් වන්නේ,
- (1) පණ්ඩිතයන් ඇසුරට ලැබීමයි. (2) අභියෝග හමුවේ නොසැලීමයි.
- (3) නීවරණ ධර්ම යටපත් වීමයි. (4) කීර්තිය පැතිරී යාමයි.

(12) සතර ආකාර වාචසික සංවරයටත්, සම්මා ආජීවයෙන් ජීවත් වීමටත්, මග පෙන්වන සිල් පද ද ඇතුළත් ව ඇත්තේ,
- (1) ගිහි දස සීලයේ ය. (2) උපෝසථ අෂ්ඨාංග සීලයේ ය.
- (3) ආජීව අෂ්ඨමක සීලයේ ය. (4) පංච සීලය හෙවත් ගේහසිත සීලයේ ය.

(13) සිගාලෝවාද සූත්‍රය අනුව ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට ඉටු කළ යුතු යුතුකමක් වන්නේ,
- (1) තම මිත්‍රයන්ට හඳුන්වා දීමයි. (2) අවශ්‍ය කටයුතු ඉටුකර දීමයි.
- (3) යහපත් කටයුතුවල යෙදවීමයි. (4) සුදුසු අවස්ථාවන්හි විවේක දීමයි.

(14) උට්ඨාන සම්පදාව ආදී මෙලොව දියුණුව පිණිස හේතුවන කරුණු හතරක් ද ඇතුළත් දේශනාව.
- (1) සිගාලෝවාද සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
- (3) මහා මංගල සූත්‍රයයි. (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.

(15) "පටිසෝතගාමී ප්‍රතිපදාව" අනුව ජීවිත ගත කරන්නෝ,
- (1) කෙලෙස් පරදා නිකෙලෙස් වීමට වෙර දරති.
- (2) ගඟ පහළට ගලන්නා සේ දිවි ගෙවති.
- (3) රාගයෙන් රාගයට යාමට කටයුතු කරති.
- (4) සාමාන්‍ය මිනිස් ස්වභාවයට එරෙහි නොවෙති.

(16) සමාජයේ සහජීවනය ඇති කිරීම සඳහා සෘජුවම උපකාරී වන්නේ,
- (1) සමථ භවනාවයි. (2) සතර සංග්‍රහ වස්තුවයි.
- (3) ත්‍රිලක්ෂණ දහමයි. (4) විරමණ සීලයයි.

(17) සත්ත්ව වර්ගයා විවිධ ජාති කුලවලට අයත් වුවද, මිනිසුන් එකම ජාතියක් නියෝජනය කරන බව පෙන්වාදෙන සූත්‍ර දේශනාව,
- (1) පරිනිබ්බාන සූත්‍රයයි. (2) අරියපරියේසන සූත්‍රයයි.
- (3) වාසෙට්ඨ සූත්‍රයයි. (4) පත්තකම්ම සූත්‍රයයි.

(18) චූල්ලකම්ම විභංග සූත්‍රය මගින් සුභ තරුණයාට දේශනා කොට වදාළ පරිදි රූමත්ව උපදින්නේ,
- (1) අන් සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා ය. (2) පිදිය යුත්තන් පුදන තැනැත්තා ය.
- (3) ද්වේෂයෙන් කටයුතු නොකරන්නා ය. (4) තමා සතුදේ අනුන්ට දෙන්නා ය.

(19) නිත්‍ය, ස්ථිර, වෙනස් නොවන "මම" යැයි පදාර්ථයක් නොමැති බව පහදා දෙන්නේ
- (1) අනිත්‍ය ලක්ෂණය මගිනි. (2) දුක්ඛ ලක්ෂණය මගිනි.
- (3) අනාත්ම ලක්ෂණය මගිනි. (4) සමාධි ලක්ෂණය මගිනි.

(20) මෙලොව දී ම විපාක ලබාදෙන කුසලාකුසල කර්ම,

(1) දිට්ඨධම්මවේදනීය කර්ම නම් වේ. (2) උපපජ්ජවේදනීය කර්ම නම් වේ.
(3) අපරාපරියවේදනීය කර්ම නම් වේ. (4) ගරුක කර්ම නම් වේ.

(21) අනුලෝම පටිච්චසමුප්පාදය අනුව නිවැරදිව ලියා ඇත්තේ,

(1) උපාදාන නිරෝධා භව නිරොධෝ යන්නයි. (2) තණ්හා පච්චයා වේදනා යන්නයි.
(3) ජාති නිරෝධා භව නිරෝධෝ යන්නයි. (4) සළායතන පච්චයා ඵස්සෝ යන්නයි.

(22) සියලු සසර දුක් නැති කිරීම සඳහා අප විසින් පුහුණු කළ යුතු දහම් උගන්වා ඇත්තේ,

(1) දුක්ඛ ආර්ය සත්‍යයේ ය.
(2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයේ ය.
(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයේ ය.
(4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයේ ය.

(23) දිවා රෑ පින් වැඩෙන පින්කමක් ලෙස දක්වා නැත්තේ,

(1) ස්වාභාවික වනාන්තර වැවීමයි. (2) මල් පලතුරු උයන් වැවීමයි.
(3) ඇඳුම් ආයිත්තම් දන් දීමයි. (4) ඒදඬු, පාලම් පැන්හල් තැනීමයි.

(24) ජීවක අඹ උයනේ බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ දහසකට අධික භික්ෂු පිරිසක් වැඩ සිටියද, කිසිදු හඬක් නොඇසීම නිසා බියට පත් වූයේ.

(1) ජීවක වෛද්‍යතුමා ය. (2) අජාසත් රජතුමා ය.
(3) උපාලි ගෘහපතියා ය. (4) බිම්බිසාර රජතුමා ය.

(25) ලෝකයේ ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා වූ බුදුරජාණන් වහන්සේ වෙදකම් කරන ලද්දේ,

(1) තුන්දොස් නිසා වැළඳෙන රෝග සඳහා ය.
(2) කෙලෙස් නිසා වැළඳෙන රෝග සඳහා ය.
(3) ඍතු විපර්යාස නිසා වැළඳෙන රෝග සඳහා ය.
(4) පිත කිපීම නිසා වැළඳෙන රෝග සඳහා ය.

(26) භද්දාලි සූත්‍රය අනුව පමණ දැන ආහාර අනුභවයේ යහපත් ප්‍රතිඵල පහෙන් එකක් වන්නේ,

(1) රූමත් බව ඇතිවීමයි. (2) කායික රෝග ඇති නොවීමයි.
(3) සුවපහසු පැවැත්මයි. (4) සිත එකඟ වීමයි.

(27) ථේරවාද සංගායනාවලින් අපේක්ෂා නොකළ කරුණක් වන්නේ,

(1) ධර්මය ඒකරාශී කිරීමයි. (2) සාවද්‍ය කරුණු බැහැර කිරීමයි.
(3) ශාසන අභිවෘද්ධිය ඇති කිරීමයි. (4) නිකාය භේදය ඇරඹීමයි.

(28) ගර්භයේ ස්වරූපය අනුව ථූපාරාම දාගැබ් වහන්සේ,

(1) ඝන්ඨාකාර වන සේක. (2) ඝටාකාර වන සේක.
(3) බුබ්බුලාකාර වන සේක. (4) ධාන්‍යාකාර වන සේක.

(29) වැඩ සිටින ඉරියව්ව අනුව හිටි, හිඳි සහ සැතපෙන පිළිම වහන්සේලා එකම ස්ථානයක නිර්මාණය කොට ඇත්තේ,

(1) අනුරාධපුර මහමෙව්නා උයනේ ය.
(2) මාතලේ අළුවිහාරයේ ය.
(3) පොළොන්නරුව ගල් විහාරයේ ය.
(4) පොළොන්නරුව තිවංක පිළිම ගෘහයේ ය.

(30) කුරුණෑගල නිල්ලක්ගම පිහිටා ඇත්තේ මෙතෙක් හමුවී ඇති කලාත්මක බවින් උසස් ම,
(1) සඳකඩපහණයි. (2) වාහල්කඩයි.
(3) බෝධිඝරයයි. (4) කොරවක්ගලයි.

(31) නව අරහාදී ගුණ වර්ණනා කරමින් අමෘතාවහ විද්‍යා චක්‍රවර්ති පඬිතුමා විසින් රචනා කරන ලද්දේ,
(1) ධර්ම ප්‍රදීපිකාවයි. (2) බුත්සරණයි.
(3) අමාවතුරයි. (4) පූජාවලියයි.

(32) මහා මංගල සූත්‍රයෙහි "අනවජ්ජානි කම්මානි" යනුවෙන් දැක්වෙන මංගල කරුණ වන්නේ,
(1) නිවැරදි ක්‍රියා කිරීමයි. (2) නිවැරදි රැකියා කිරීමයි.
(3) නිවැරදි වචන කීමයි. (4) නිවැරදි දානය දීමයි.

(33) පත්තකම්ම සූත්‍රයෙහි සඳහන් පංච බලි අතරින් "දේවතා බලි" යනු,
(1) ආගන්තුකයන්ට සැලකීමයි. (2) මියගිය ඤායන්ට පින් දීමයි.
(3) රජයට බදු ගෙවීමයි. (4) ආගමික කටයුතු ඉටු කිරීමයි.

(34) සප්ත අපරිහානීය ධර්ම ක්‍රියාත්මක කරන ලද භාරතයේ පැවති සමූහාණ්ඩුව,
(1) වජ්ජි රාජ්‍යයයි. (2) මගධ රාජ්‍යයයි.
(3) කෝසල රාජ්‍යයයි. (4) ශාක්‍ය රාජ්‍යයයි.

(35) යම් පාලකයෙකු ජනතාවගේ කරදර විපත් දැක කම්පා වී එම ජනතාව දුකින් මුදවා ගන්නේ නම් පාලකයාගේ එම ගුණය,
(1) මෙත්තා නම් වේ. (2) කරුණා නම් වේ.
(3) මුදිතා නම් වේ. (4) උපේක්ෂා නම් වේ.

(36) දක්ෂිණ මහා ශ්‍රාවක තනතුර ද, ධර්ම සේනාපති තනතුර ද, ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අග තනතුර ද, ඉසිලූයේ,
(1) සැරියුත් මහ රහතන් වහන්සේ ය. (2) මුගලන් මහ රහතන් වහන්සේ ය.
(3) ආනන්ද මහ රහතන් වහන්සේ ය. (4) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.

(37) පුද්ගලයා හැඩගැසිය යුතු ආර්ය මාර්ගයෙහි පියවර තුන නිවැරදි අනුපිළිවෙළ අනුව,
(1) ප්‍රඥා, සීල, සමාධි ලෙස දැක්වේ. (2) සීල, සමාධි, ප්‍රඥා ලෙස දැක්වේ.
(3) සමාධි, සීල, ප්‍රඥා ලෙස දැක්වේ. (4) සීල, ප්‍රඥා, සමාධි ලෙස දැක්වේ.

(38) අවෙච්චප්පසාදය ඇතිවනුයේ,
(1) අමූලික ශ්‍රද්ධාව තුළිනි. (2) ආකාරවතී ශ්‍රද්ධාව තුළිනි.
(3) භක්තිය ඇතිවීම තුළිනි. (4) වරදින් වැළකීම තුළිනි.

(39) තමන් කරන කුසල අකුසල කර්මයන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම,
(1) කම්මස්සකතා සම්මා දිට්ඨියයි. (2) ධ්‍යාන සම්මා දිට්ඨියයි.
(3) විදර්ශනා සම්මා දිට්ඨියයි. (4) මාර්ග සම්මා දිට්ඨියයි.

(40) ඕනෑම අයකුගේ සංකල්ප හෙවත් සිතිවිලි නිවැරදි වීමට නම් එම තැනැත්තා
(1) සුදුසු අධ්‍යාපනයක් සහිත විය යුතු ය. (2) ගුරුවරුන් ඇසුරු කළ යුතු ය.
(3) නිවැරදි දැක්මක් ඇති අයකු විය යුතුය. (4) ආගමක් අදහන අයකු විය යුතු ය.

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය 02

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

i. සතර පෙර නිමිති ලියා දක්වන්න.

ii. ප්‍රඥා ශික්ෂාවට අයත් අංග දෙක ලියන්න.

iii. සීලයෙහි ප්‍රධාන ප්‍රභේද දෙක ලියන්න.

iv. "පොහොය දිනය" "ධර්ම විනිශ්චය" යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

v. "යේ ධම්මා හේතුප්පභවා......."යනාදී ගාථාව කවුරුන් විසින් කා හට දේශනා කරන ලද්දේ ද?

vi. "සමවායෝ ඒව සාධු" යන්නෙහි තේරුම ලියන්න.

vii. සිදුහත් බෝසතාණන් වහන්සේ බුදු වූ ස්ථානය සහ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ ස්ථානය නම් කරන්න.

viii කුරුණෑගල යුගයේ දී පාලි ජාතකට්ඨ කථාව සිංහලයට නැගීමෙන් රචිත කෘතිය කුමක්ද?

ix. දසරාජ ධර්මවල එන "තපස"යනු කුමක් ද?

x. "දුමින්දාගමනය" යන්නෙන් අදහස් කරනුයේ කුමන සිදුවීම ද?

(02) i. "කර්මය" යන්නෙහි අදහස කුමක් ද?

ii. තිදොර අනුව කර්මයේ තුන් ආකාරය ලියන්න .

iii. තිදොර සංවර යහපත් මිනිසෙකු වීම සඳහා දස අකුසල්වලින් වැළකී කළ යුතු දස කුසල් පහදා දෙන්න.

(03) i. "අසවලා මට බැන්නේ ය.... මා පැරදවූයේ ය..... ආදී ලෙස සිතමින් වෛර බඳින්නන්ගේ වෛරය නොසන්සිඳේ" මෙම අදහස ඇති ගාථාව ලියන්න.

ii. ධම්මපදය පිළිබඳ මූලික තොරතුරු තුනක් ලියන්න.

iii. සමාජ සංවර්ධනය ඇති කර ගැනීම සඳහා ධම්මපද උපදෙස්වල වැදගත්කම සාකච්ඡා කරන්න.

(04) i. බුදුරජාණන් වහන්සේ කාලාම සූත්‍රය දේශනා කොට වදාළේ කාට ද?

ii. කාලාම සූත්‍රය අනුව යමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නුසුදුසු කරුණුවලින් තුනක් ලියන්න.

iii. මිනිසාගේ සිතීමේ, විමසීමේ නිදහස තහවුරු කරන නිර්ණායක සතරෙහි අගය පැහැදිලි කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05) i. තෙවන ථේරවාදී සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණ කුමක් ද?

ii. එම සංගායනාව පැවැත්වූ ස්ථානය, ප්‍රධානත්වය සහ අනුග්‍රහය ලියා දක්වන්න.

iii. පිරිසිදු දහමේ පැවැත්ම උදෙසා ථේරවාද සංගායනාවලින් සිදුවූ මෙහෙය පැහැදිලි කරන්න.

(06) i. අනුරාධපුර යුගයට අයත් චිත්‍ර වර්තමානයේ දී ද, දක්නට ලැබෙන ස්ථාන දෙකක් ලියන්න.

ii. මහනුවර යුගයෙහි චිත්‍ර කලාවෙහි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

iii. බෞද්ධ චිත්‍ර කලාවෙහි ඇති වැදගත්කම පහදා දෙන්න.

(07) පහත මාතෘකාවලින් දෙකක් පමණක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න

i. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා.

ii. මහින්දාගමනය.

iii. අනවජ්ජ සුඛය

iv. බෝධිසරය.

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 4 | 21. | 4 | 31. | 2 |
| 2. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 2 |
| 3. | 2 | 13. | 1 | 23. | 3 | 33. | 4 |
| 4. | 4 | 14. | 4 | 24. | 2 | 34. | 1 |
| 5. | 3 | 15. | 1 | 25. | 2 | 35. | 2 |
| 6. | 3 | 16. | 2 | 26. | 3 | 36. | 1 |
| 7. | 4 | 17. | 3 | 27. | 4 | 37. | 2 |
| 8. | 1 | 18. | 3 | 28. | 1 | 38. | 2 |
| 9. | 2 | 19. | 3 | 29. | 3 | 39. | 1 |
| 10. | 2 | 20. | 1 | 30. | 3 | 40. | 3 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01) i මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රුවක්.
ii සම්මාදිට්ඨි, සම්මා සංකප්ප.
iii සමාදාන(සිරිත්, චාරිත්‍ර), විරමණ (විරිත්, වාරිත්‍ර)
iv රේරුකානේ චන්දවිමල මහ නාහිමි.
v අස්සජි මහ රහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජියාට.
vi "සමඟිය ම යහපතකි".
vii ඇසතු බෝරුක් සෙවනේ දී, උපවර්තන සල් උයනේ දී
viii පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
ix පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියාකිරීම.
x ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලංකාවට වැඩමවීම.

(02) i සචේතනික (සිතෙන් සිතා කරන) කායික , වාචසික, මානසික ක්‍රියා.
ii කාය කම්ම, වචී කම්ම, මනෝ කම්ම.
iii පර පන නැසීමෙන් වැළකී අන් අයගේ ජීවිත රැකදීම සොරකමින් වැළකී අන් සතු ධනය රැක දීම ආදී ලෙස දස කුසල්වලට අදාළව විරමණ සීලයත් සමාදාන සීලයත් යන දෙඅංශයම විස්තර කොට තිබිය යුතුයි.

(03) i අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්ති
වේරං තේසං න සම්මති
ii 1. ධම්මපදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ය.
2. ධම්මපදය බෞද්ධයාගේ අත් පොතයි.
3. වර්ග 26 යටතේ ගාථා 423 ක් ද නිදාන කතා 299 ක් ද ඇත.
iii සිසුන් උගත් ගාථා කීපයක් ඇසුරින්, අකුසල්වලින් වැළකී කුසල් කරමින් ද දියුණුවට අදාළ වන ගුණධර්ම ඇතිකර ගනිමින් ද කටයුතු කිරීමට ධම්මපදයෙන් ලබා දෙන උපදෙස්වල වැදගත්කම පහදා තිබිය යුතුය.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04) i. කේසපුත්ත ගම්වැසි කාලාමයන්ටයි .

ii ආරංචි මඟින් එන දේ, පරපුරෙන් පැවතෙන දේ,
තර්කානුකූල දේ, න්‍යායානුකූල දේ,
තම දෘෂ්ටියට ගැළපෙන දේ, සුදුසු බව පෙනෙන දේ,
තමන්ගේ ශ්‍රමණයා හෝ ගුරුවරයා කියන දේ,
(මින් ඕනෑම තුනක්)

iii යමක් පිළිගැනීමේදී හෝ ප්‍රතික්ෂේප කිරීමේ දී කාලාම සූත්‍රය මඟින් උගන්වා වදාළ නිර්ණායක වන,

- කුසල් ද අකුසල් ද කියා විමසීම.
- නිරවද්‍ය ද සාවද්‍ය ද කියා විමසීම.
- නුවණැත්තන් ගරහයි ද පසසයි ද කියා විමසීම.
- ප්‍රතිඵල යහපත් ද අයහපත් ද විමසීම යන කරුණු අගය කරමින් පහදා තිබිය යුතුයි.

.

(05) i ලාභ අපේක්ෂාවෙන් දුසිල්වතුන් සසුන්ගත වීම.

ii ස්ථානය - පැළලුප්නුවර අශෝකාරාමය
ප්‍රධානත්වය - මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ
අනුග්‍රහය - ධර්මාශෝක රජතුමා

iii ථේරවාද සංගායනා හතර ම ඇසුරෙන් සිදුවූ මෙහෙය පැහැදිලි කොට තිබිය යුතුයි.

(06) i සීගිරිය, හිඳගල.

ii 1. රේඛා කර්මය, වර්ණ පූර්ණය යන අංග දෙක භාවිතය
2. චිත්‍රවලින් ස්වාභාවික ස්වරූපය නොදැක්වීම
3. එළිය, අඳුර හෝ පර්යාවලෝකනය මතු නොකිරීම
4. කහ සුදු සිතුවම් රතු පසුබිමක දැක්වීම
5. අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් නිර්මාණය
6. දෘශ්‍ය ගෝචර වුවද බුද්ධි ගෝචරනොවීම
(මින් ඕනෑම තුනක්)

iii පවට ලැජ්ජාව සහ බිය ඇති කිරීම, අකුසලින් වැළකීමටත් කුසලට යොමුවීමටත් මඟ පෙන්වීම බෝසත් සිරිත හා බුදු සිරිත ගැන දැනුම ලබාදීම ශ්‍රද්ධාව ඇති කිරීම, දෙලොව දියුණවට මඟ පෙන්වීම මැඳුම් පිළිවෙතට මඟ පෙන්වීම ආදිය විස්තර කොට තිබිය යුතු ය.

(07) i 11 ශ්‍රේණිය - 05 පාඩම 45 පිටුව

ii 11 ශ්‍රේණිය - 17 පාඩම

iii 11 ශ්‍රේණිය - 20 පාඩම 148 පිටුව

iv 10 ශ්‍රේණිය - 20 පාඩම 112 පිටුව



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 03

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

### 1 පත්‍රය

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

---

(01) සතර පෙර නිමිති පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මහල්ලෙක්, ලෙඩෙක්, පැවිදිරුවක්, මළකඳක්
(2) මහල්ලෙක්, පැවිදිරුවක්, මළකඳක්, ලෙඩෙක්
(3) ලෙඩෙක්, මහල්ලෙක්, පැවිදිරුවක්, මළකඳක්
(4) මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදිරුවක්

(02) "සුපටිපන්න" නම් සඟ ගුණයෙන් අර්ථවත් වන්නේ,

(1) ගරු බුහුමනට සුදුසු ධර්ම මාර්ගය අනුගමනය කිරීමේ යෙදුන බවයි.
(2) ඍජු වූ ධර්ම මාර්ගය ඍජුව හෙවත් අවංක අනුගමනය කිරීමේ යෙදුන බවයි.
(3) යහපත් ධර්ම මාර්ගය අනුගමනය කිරීමේ යෙදුන බවයි.
(4) පරලොව සුව පතා දෙන දානය පිළිගැන්වීමට සුදුසු බවයි.

(03) උද්ධච්ඡ කුක්කුච්ඡ නම් නීවරණයෙන් අදහස් වන්නේ,

(1) නොසන්සුන්කම සහ කළ නොකළ දේ පිළිබඳ ඇතිවන පසුතැවිල්ලයි.
(2) සිතේ ඇතිවන තරහවයි.
(3) නිදිබර බව, උදාසීනකමයි.
(4) විවිධ කරුණු පිළිබඳ සිතේ ඇතිවන සැකයයි.

(04) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු,

(1) පංච නීවරණයි.
(2) පංචස්කන්ධයයි.
(3) පංචචේන්ද්‍රියයි
(4) පංච විලෝකනයයි.

(05) ත්‍රිලක්ෂණ භාවනාව ලෙස හඳුන්වන්නේ,

(1) විදර්ශනා භාවනාවයි.
(2) සමථ භාවනාවයි.
(3) බුද්ධානුස්සති භාවනාවයි.
(4) ආනාපානසති භාවනාවයි.

(06) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයකි.

(1) බුදුගුණාලංකාරය.
(2) සාරාර්ථ සංග්‍රහය.
(3) කාව්‍ය ශේඛරය.
(4) ලොවැඩ සඟරාව

(07) බෞද්ධ ලෝකයේ මුදුන් මල්කඩක් ලෙස හඳුන්වන්නේ,

(1) රුවන්වැලි සෑයයි.
(2) ලෝවාමහාපායයි.
(3) සීගිරියයි.
(4) ජේතවනාරාමයයි.

(08) ලෝවාමහා ප්‍රාසාදය ඉදිකරන ලද්දේ,

(1) නිශ්ශංකමල්ල රජතුමා විසිනි.
(2) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.
(3) දුටුගැමුණු රජතුමා විසිනි.
(4) දේවානම්පියතිස්ස රජතුමා විසිනි.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(09) ධම්මපදය ග්‍රන්ථයේ සඳහන් වන ගාථා ගණන වනුයේ,
(1) 420. (2) 421. (3) 422. (4) 423.

(10) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන පරිදි දකුණු දිශාවෙන් පිළිබිඹු වන්නේ,
(1) ගුරුවරුන් ය. (2) දෙමව්පියන් ය.
(3) පැවිදි උතුමන් ය. (4) අඹු දරුවන් ය.

(11) නොඇසූ දේ කියාදීම,
(1) ගිහියන්ගේ යුතුකමකි. (2) පැවිදි පක්ෂයේ යුතුකමකි.
(3) ගුරුවරුන්ගේ යුතුකමකි. (4) මව්පියන්ගේ යුතුකමකි.

(12) "සමග්ගා හෝථ මා විවදථ" යන්නෙහි අර්ථය වන්නේ
(1) සමඟි වන්න විවාද නොකරන්න යන්නයි.
(2) සමඟියම යහපත් යන්නයි.
(3) සමඟියෙන් කටයුතු කිරීම අවශ්‍යයි යන්නයි.
(4) මම සමඟිය අගය කරමි යන්නයි.

(13) විපාක දෙන අනුපිළිවෙළ අනුව කර්මයේ ප්‍රභේද වන්නේ,
(1) ජනක, උපත්ථම්භක, උපපීඩක, උපඝාතක ය.
(2) දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය, අහෝසි ය.
(3) ගති සම්පත්ති, උපධි සම්පත්ති, කාල සම්පත්ති, ප්‍රයෝග සම්පත්ති ය.
(4) ගරුක, ආසන්න, ආචිණ්ණ, කටත්තා ය.

(14) සියලු දෙය "මගේ ය, මම ය, මම වෙමි" යන සංකල්පය අතහැර දමා බුදුරජාණන් වහන්සේ වදාළ සත්‍ය වන්නේ,
(1) අනිත්‍ය ලක්ෂණයයි. (2) දුක්ඛ ලක්ෂණයයි.
(3) අනාත්ම ලක්ෂණයයි. (4) විපරිනාම ලක්ෂණයයි.

(15) අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ යන ගාථාව සඳහන් වන්නේ,
(1) පරිනිබ්බාන සූත්‍රයේ ය. (2) රතන සූත්‍රයේ ය.
(3) කරණීයමෙත්ත සූත්‍රයේ ය. (4) මහාමංගල සූත්‍රයේ ය.

(16) හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත්ද, ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළ බව දක්වමින් බුදුරජාණන් වහන්සේ හඳුන්වා දෙන ලද්දේ.
(1) මුගලන් තෙරණුවන් විසිනි. (2) අස්සජි තෙරණුවන් විසිනි.
(3) මහා කාශ්‍යප තෙරණුවන් විසිනි. (4) සැරියුත් තෙරණුවන් විසිනි.

(17) චතුරාර්ය සත්‍ය ඇතුළත් පළමු ධර්ම දේශනාව වන්නේ,
(1) අනන්ත ලක්ඛණ සූත්‍රයයි. (2) ගිරිමානන්ද සූත්‍රයයි.
(3) ධම්මචක්කප්පවත්වන සූත්‍රයයි. (4) මහානිදාන සූත්‍රයයි.

(18) කාම තණ්හාව යනු කුමක් ද?
(1) කම් සුව අත්හැරීමයි.
(2) ඊළඟ භවයක උපත ලැබීමේ ආශාවයි.
(3) පරලොවක් නැතැයි සිතා හැකි තාක් සැප විඳීමේ ආශාවයි.
(4) පංච ඉන්ද්‍රියයන් පිනවීමේ ආශාවයි.

(19) බුදුරජාණන් වහන්සේ පස් වන වස් කාලය ගත කළේ,
(1) විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි ය. (2) මකුල පර්වතයෙහි ය.
(3) පාරිලෙය්‍යය වනයෙහි ය. (4) බරණැස ඉසිපතනාරාමයෙහි ය.

(20) බුදුරජාණන් වහන්සේ සිංසපා සූත්‍රය දේශනා කළේ,
(1) චම්පා නුවර අසල ගග්ගරා පොකුණ සමීපයේ දී ය.
(2) ඇට්ටේරියා වනයක දී ය.
(3) කෙත් යායක දී ය.
(4) ජීවක අඹ උයනේ දී ය.

(21) නැඟිට ගැනීමටත් බැරි තරමට කෑම ගෙන එහිම පෙරළී සිටින තනැත්තා හඳුන්වන්නේ,
(1) ආහාර හත්ථක නමිනි. (2) අලංසාටක නමිනි.
(3) තත්ථාවට්ටක නමිනි. (4) කාකමාසක නමිනි.

(22) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ගනු ලැබුවේ,
(1) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
(2) සබ්බකාමී මහරහතන් වහන්සේ ය.
(3) මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ ය.
(4) ආනන්ද මහ රහතන් වහන්සේ ය.

(23) කට පාඩමින් රැගෙන ආ ධර්මය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ,
(1) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමෙන් පසුව ය.
(2) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමෙන් පසුව ය.
(3) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමෙන් පසුව ය.
(4) සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීමෙන් පසුව ය.

(24) ලක්දිව බුදුදහම ස්ථාපිත වීමත් සමඟ ගොඩනැගුණු මුල්ම ස්තූපය ලෙස සැලකෙන්නේ,
(1) මහියංගනය ස්තූපයි. (2) රුවන්වැලි සෑයයි.
(3) ථූපාරාම දාගැබයි. (4) මිරිස වැටිය චෛත්‍යයයි.

(25) ස්තූප ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ආකාර,
(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි.

(26) බුදුරජාණන් වහන්සේගේ පුරිස ධම්ම සාරථි ගුණය වර්ණනා කෙරෙන ග්‍රන්ථයක් වන්නේ,
(1) බුත්සරණයි. (2) අමාවතුරයි. (3) ධර්මප්‍රදීපිකාවයි. (4) කව්සිළුමිණයි.

(27) බුද්ධ කාලීන භාරතයේ පැවති ගණ තන්ත්‍ර පාලන ප්‍රතිපත්තියකට උදාහරණයක් වන්නේ,
(1) දස රාජ ධර්ම. (2) දස සක්විතිවත්.
(3) සතර සංග්‍රහ වස්තු. (4) සප්ත අපරිහානිය ධර්ම.

(28) උදය බමුණාගේ ආරාධනාවෙන් වේරංජා නුවර වස් විසීමට වැඩම කළ බුදුරජාණන් වහන්සේට කටුක ආහාර වැළඳීමට සිදුවිය. එයින් මතුවන බුදුරජාණන් වහන්සේගේ ගුණාංගය වනුයේ,
(1) කරුණා ගුණයයි. (2) ඉවසීමේ ගුණයයි.
(3) තාදී ගුණයයි. (4) අසරණ සරණ ගුණයයි.

(29) බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ සේක. එයට කදිම උදාහරණයකි,
(1) මට්ටකුණ්ඩලීට උපස්ථාන කිරීම. (2) මුගලන් තෙරුන්ට උපස්ථාන කිරීම.
(3) මහලු සීයෙකුට උපස්ථාන කිරීම. (4) පූතිගත්තතිස්ස තෙරුන්ට උපස්ථාන කිරීම

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

30) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා උපත ලැබුවේ,
(1) 1864 සැප්තැම්බර් 17 දින ය. (2) 1964 සැප්තැම්බර් 14 දින ය.
(3) 1865 සැප්තැම්බර් 17 දින ය. (4) 1765 සැප්තැම්බර් 17 දින ය.

(31) ලෝවැඩ සඟරාව ලියූ කතුවරයා වන්නේ,
(1) රණසගල්ලේ හිමි ය. (2) වීදාගම මහා මෛත්‍රේය හිමි ය.
(3) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය. (4) වැත්තැවේ හිමි ය.

(32) මෙලොව හිතසුව පිණිස උපකාර වන්නා වූ ධර්මයක් දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,
(1) සුභ නම් තරුණයා ය. (2) කාලාම වැසියන් ය.
(3) දීඝජානු කෝලිය පුත්‍රයා ය. (4) ද්‍රෝණ නම් බමුණා ය.

(33) මහා මංගල සූත්‍රයේ ඇතුළත් කරුණු ගණන වන්නේ,
(1) 30 කි. (2) 34 කි. (3) 35 කි. (4) 38 කි.

(34) පුද්ගලයාගේ සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ සඳහන් වන සූත්‍රයකි,
(1) කාලාම සූත්‍රය. (2) රතන සූත්‍රය.
(3) සිඟාලෝවාද සූත්‍රය. (4) කරණීය මෙත්ත සූත්‍රය.

(35) සතර සංග්‍රහ වස්තු නිවැරදිව ඇතුළත් පිළිතුර වන්නේ,
(1) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා
(2) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව.
(3) ඡන්ද, චිත්ත, වීර්ය, විමංසා.
(4) ඡන්දය, ද්වේශය, භය, මෝහය.

(36) පුද්ගල විෂමතා 14 ක් ගැන චූල්ලකම්ම විභංග සූත්‍රයේ දක්වේ. එයින් " දුප්පඤ්ඤා" යනු,
(1) පහත් යැයි සම්මත අයයි. (2) නුවණින් යුත් අයයි.
(3) දුප්පත් අයයි. (4) නුවණින් අඩු අයයි.

(37) බුදු දහමට අනුව අන් සැපතට ඊර්ෂ්‍යා කරන්නා,
(1) අල්පේශාක්‍යව උපදී. (2) මහේශාක්‍යව උපදී.
(3) දුර්වර්ණව උපදී. (4) අල්පභෝගීව උපදී.

(38) "විනයෝ නාම සාසනස්ස ආයු" යන්නෙහි සරල තේරුම වන්නේ,
(1) නාමය කිසිදා නොදිරයි. (2) සාසනය සුරැකිය යුතුයි.
(3) විනය සසුනේ ආයුෂයයි. (4) විනයේ ගරුත්වය සාසනයයි.

(39) ආබද්ධ හිටි පිළිමයකට උදාහරණයකි,
(1) පොළොන්නරු හිටි පිළිමය. (2) සමාධි බුද්ධ ප්‍රතිමාව.
(3) තොලුවිල බුද්ධ ප්‍රතිමාව. (4) අවුකන බුද්ධ ප්‍රතිමාව.

(40) පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියන ලද්දේ,
(1) දඹදෙණිය සාහිත්‍ය යුගයේ දී ය. (2) කුරුණෑගල සාහිත්‍ය යුගයේ දී ය.
(3) කෝට්ටේ යුගයේ දී ය. (4) මහනුවර සාහිත්‍ය යුගයේ දී ය.

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | |
|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය 03 | |
| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය |

II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

i. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය කුමක්දැයි ලියා එහි ඇතුළත් ගාථා ගණන කොපමණ දැයි ලියන්න.
ii. "පඤ්ඤා විරියේන පඤ්චමං" යන ගාථා පාඨයෙන් දැක්වෙන පාරමිතා දෙක ලියන්න.
iii. පසේ බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේ පුරන පාරමිතා ගණන කීයද?
iv. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා දායකත්වය සැපයූ රජතුමා හා සහභාගී වූ රහතන් වහන්සේලා ගණන ලියන්න.
v. අප අවට පරිසරය බෙදන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
vi. සිදුහත් බෝසතුන් බුදුවීමෙන් පසු පළමු වස්කාලය ගත කළ ස්ථානය කුමක් ද?
vii. බෞද්ධ පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු බෞද්ධ දේශපාලන මූලධර්ම දෙකක් ලියන්න.
viii. සිව්බඹ විහරණවලින් දෙකක් නම් කරන්න.
ix. බුද්ධ දේශනාවට අනුව සිව්වනක් පිරිස නම් කරන්න.
x මහා සුතසෝම ජාතකයෙන් හෙළිවන පාරමිතාව කුමක් ද?

(02) i. බුද්ධකාරක ධර්මවලින් හතරක් නම් කරන්න.
ii. පාරමිතා ගුණධර්ම පුහුණු කරන්නෙක් අත්හළ යුතු කරුණු තුන ලියන්න.
iii. පාරමිතා පිරීම බෝසත්වරයකුට බුදුවීමට පමණක් නොව අපේ ජීවිතයද සාර්ථක කර ගැනීමට ඉවහල් කර ගත හැකිය. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(03) i "අත්තනාව කතං පාපං......" යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එහි සරල අර්ථය ලියන්න.
iii. ඕනෑම කෙනෙකුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට ලැබෙන උපදෙස් ධම්මපද ගාථා දෙකක් වත් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(04) i. සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපත හා බුදුරදුන්ගේ පිරිනිවන්පෑම සිදුවූ ස්ථාන මොනවාදැයි ලියන්න.
ii. බුදුරජාණන් වහන්සේ සොඳුරු බව ඇගයීමට ලක් කළ අවස්ථා තුනක් නම් කරන්න.

iii. මිහිතලයට ආදරය කරන මිනිසුන් ලෙස පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05) i. පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

ii. පළමු ධර්ම සංගායනාව පිළිබඳ පහත තොරතුරු සපයන්න.

- ප්‍රධානත්වය :-
- ස්ථානය :-
- අන්වර්ථ නාමයඃ-

iii. බුදුසසුනේ චිරස්ථිතිය සඳහා ධර්ම සංගායනා පැවැත්වීමේ වැදගත්කම විස්තර කරන්න

(06) i දසරාජ ධර්මවලින් හතරක් නම් කරන්න.

ii. ඉන් තුනක අර්ථය කෙටියෙන් දක්වන්න.

iii. ඕනෑම රාජ්‍ය පාලකයෙකු දසරාජ ධර්ම පිළිපැදීම මගින් උද්ඝෝෂණවලින් හා ජනතා අප්‍රාසාදයකින් තොරව දැහැමි පාලනයක් කරගෙන යා හැකි බව පෙන්වා දෙන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

i අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහ නාහිමි

ii දුමින්දාගමනය

iii අත්ථිසුබ

iv කව්සිළුමිණ

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 2 | 21. | 3 | 31. | 2 |
| 2. | 3 | 12. | 1 | 22. | 2 | 32. | 3 |
| 3. | 1 | 13. | 4 | 23. | 4 | 33. | 4 |
| 4. | 2 | 14. | 3 | 24. | 3 | 34. | 1 |
| 5. | 1 | 15. | 1 | 25. | 4 | 35. | 2 |
| 6. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 7. | 1 | 17. | 3 | 27. | 4 | 37. | 1 |
| 8. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 3 |
| 9. | 4 | 19. | 1 | 29. | 4 | 39. | 4 |
| 10. | 1 | 20. | 2 | 30. | 1 | 40. | 2 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01)
- i ධම්මපදය, ගාථා 423
- ii ප්‍රඥා පාරමිතාව, වීර්ය පාරමිතාව
- iii 20 යි
- iv අජාසත් රජු, රහතන් වහන්සේලා 500ක්
- v ජීවී හා අජීවී.
- vi බරණැස් නුවර ඉසිපතන මිගදාය
- vii දසරාජ ධර්ම, දස සක්විතිවත්, සතර බ්‍රහ්ම විහරණ, පන්සිල්, සතර සංග්‍රහ වස්තු, සතර අගතියෙන් තොර වීම, සප්ත අපරිහානීය ධර්ම (මින් දෙකක්)
- viii මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා (මින් 2 ක්)
- ix භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා.
- x සත්‍ය පාරමිතාව

(02)
- i දාන, ශීල, නෙක්ඛම්ම, ප්‍රඥා,වීර්යය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා (මින් 04 ක් ).
- ii තණ්හාවෙන් තොරව දාන, ශීලාදී ගුණ ධර්ම පිරීම.
  මානයෙන් තොරව එම ගුණ ධර්ම පිරීම.
  මිත්‍යා දෘෂ්ඨියෙන් තොරව එම ගුණ ධර්ම පිරීම.
- iii ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න.

(03)
- i අත්තනාව කතං පාපං -අත්තනා සංකිලිස්සති
  අත්තනා අකතං පාපං -අත්තනාව විසුජ්ඣති
  සුද්ධි අසුද්ධි පච්චත්තං -නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ
- ii යමෙකු පව් කළොත් ඔහු අපිරිසිදු වේ.
  යමෙකු පව් නොකළොත් ඔහු පිරිසිදු වේ.
  පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිමය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.
- iii වෙනත් ගාථා දෙකක් ඇසුරෙන් පිළිතුර ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(04) i උපත - රජගහ නුවර ලුම්බිණි සල් උයන
පිරිණිවන් පෑම - කුසිනාරානුවර උපවත්තන සල් උයන

ii රජගහ නුවර සිත් අලවන සුලුය.නිග්‍රෝධය සිත් කලුය.චෞර ප්‍රපාතය, වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාව විශාලා මහනුවර පිහිටි සුන්දර ස්ථාන (මේ සඳහා 10 පෙළ පොතේ 92 පිටුව කියවන්න.)

iii ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න.

(05) i සුභද්‍ර භික්ෂුවගේ අයහපත් වූ වචනය.

ii ප්‍රධානත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ.
ස්ථානය - රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණී ගුහාව
අනවර්ථ නාමය - පංචසතිකා සංගීතිය.

iii සංගායනා හතරේම ප්‍රතිඵලවලට අවධානය යොමුකර පිළිතුර ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(06) i දානය, සීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නොවීම (මින් 04ක්).

ii
- දානය - පූජාවක් වශයෙන් හෝ අනුග්‍රහයක් වශයෙන් ලබාදෙන දෙයකි.
- සීලය - කායික හා වාචික සංවරයෙන් යුක්ත වීම.
- පරිත්‍යාගය - රටවැසියාගේ යහපත සඳහා තම කාලය , ශ්‍රමය, ධනය, සුවපහසුව, යනාදිය කැප කිරීම.
- ඍජු බව - සතර අගතියෙන් තොරව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවංක වීම.
- මෘදු බව - හදවතේ ඇති මොළොක් බව හෙවත් තෙත් ගතිය.
- තපස - පසිඳුරන් පිනවීමට ගිජු නොවීම.
- අක්‍රෝධය - ක්‍රෝධ චේතනාවෙන් තොරව කටයුතු කිරීම.
- අවිහිංසාව - හිංසා සහගත කටයුතුවලින් ඈත් වීම.
- ඉවසීම - ඉවසිලිවන්ත බව/ ක්ෂණික තීරණ නොගැනීම.
- අවිරෝධතා - ගැටුම්වලින් තොරව කටයුතු කිරීමයි.

iii ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු පිරිනමන්න.

(07) i අතිපූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල නාහිමි (11 පෙළ පොත 41 පිටුව)

ii දුමින්දාගමනය - යනු දඹදිව බුද්ධාගයාවේ වැඩ සිටින ජය ශ්‍රී මහා බෝධීන්ගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම කිරීම යි. සංඝමිත්තා මහරහතන් මෙහෙණිය ප්‍රමුඛත්වය ගත් බව ද, දෙවන පැතිස් මහ රජු විසින් පිළිගෙන මහමෙව්නාවේ රෝපණය කළ ද බව සඳහන් වේ.
(11 පෙළ පොත 120 පිටුව)

iii අත්ථි සුඛ - යනු ධාර්මිකව උපයාගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යම් කෙනෙක් ලබන සතුටු වීමයි.(11 පෙළ පොත 146 පිටුව)

iv කව්සිළුමිණ - සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍යය යි.මෙහි කතුවරයා දඹදෙණියේ රජකම් කළ දෙවන පැරකුම්බා රජු ය. මෙම ග්‍රන්ථයට තේමාව වූයේ කුසජාතකයයි. මෙය සර්ග 15 කින් හා ගී 770 කින් යුක්තය (10 පෙළ පොත 122 පිටුව)

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 04

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

## 1 පත්‍රය

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

---

(01) මහල්ලෙකු ලෙඩෙකු හා මළ සිරුරක් දැක ජීවිතයේ යථා ස්වභාවය පිළිබඳ කළකිරී සිටි සිදුහත් බෝසතාණන්ගේ සිත දුකින් මිදීමේ අරමුණක් වෙතට යොමු වූයේ,

(1) නිබ්බුත පද ඇසීමෙනි. (2) උපශාන්ත වූ පැවිදි රුව දැකීමෙනි.
(3) රජ සැප තාවකාලික බව සිතීමෙනි. (4) රාහුල කුමරු ඉපදුණු පණිවිඩය ඇසීමෙනි.

(02) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම උදාන වාක්‍ය වූයේ ,

(1) ආරභථ නික්ඛමථ...... (2) අග්ගෝ හමස්මි ලෝකස්ස........
(3) සබ්බ පාපස්ස අකරණං........ (4) අනේක ජාති සංසාරං...........

(03) නව අරහාදී බුදුගුණ වර්ණනා කරමින් ලියවුණු "බුදුගුණ අලංකාරය" නම් වූ පද්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය. (2) වීදාගම මහා මෛත්‍රේය හිමි ය.
(3) වැලිවිට සරණංකර හිමි ය. (4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය.

(04) බුදු දහමට අනුව මිනිසාට ලබාගත හැකි උතුම්ම සැපය නම්,

(1) නීරෝගි බවයි. (2) සතුටයි. (3) ධනයයි. (4) නිවනයි.

(05) තමා විසින් ම පිළිපැද මෙලොවදී ම ප්‍රතිඵල දැන දැකගත හැකි බැවින් ධර්ම රත්නය,

(1) ස්වක්ඛාත නම් වෙයි. (2) සන්දිට්ඨික නම් වෙයි.
(3) අකාලික නම් වෙයි. (4) ඒහිපස්සික නම් වෙයි.

(06) මනා වූ පිළිවෙත් පුරණ මහා සංඝ රත්නය සතු සඟ ගුණය නම්,

(1) සුපටිපන්න ය. (2) උජුපටිපන්න ය.
(3) ඤායපටිපන්න ය. (4) සාමීචිපටිපන්න ය

(07) නිවන් මග යාමට අවශ්‍ය මග වියදම් සපයන උසස් ධනයක් මෙන්ම මිනිස් සිත තුළ වැපිරිය යුතු බීජයක් ලෙස ද දහමෙහි පෙන්වා දෙන්නේ,

(1) ශ්‍රද්ධාවයි. (2) ඉවසීමයි. (3) කරුණාවයි. (4) උපෙක්ෂාවයි

(08) "දානං සීලංච නෙක්ඛම්මං" .... යන ගාථාවෙහි ඇතුළත් ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය වනුයේ.

(1) දස පුණ්‍ය ක්‍රියා ය. (2) දස පාරමිතා ය.
(3) දසරාජ ධර්ම ය. (4) උපේක්ෂාව ය.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(09) තුන්තරා බෝධීන් අතරින් යම් බෝධියකින් නිවන් අවබෝධ කිරීමට ප්‍රාර්ථනා කරන බෝසත්වරු බුද්ධ කාරක ධර්ම සම්පූර්ණ කරන ත්‍රිවිධාකාර වූ පිළිවෙත

(A) පාරමී (B) උපපාරමී (C) පරමත්තපාරමී නම්

පසේ බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වරයෙකු විසින් පාරමිතා සම්පූර්ණ කළ යුතු ආකාරය අඩංගු පිළිතුර වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) AB හා C ය.

(10) බුදුරජාණන් වහන්සේ චූල්ල කම්ම විභංග සූත්‍රයෙහි පෙන්වා දී ඇති කර්ම ඵල විපාකයනට අනුව දුර්වර්ණව උපදිනු ලබන්නේ,

(1) ප්‍රාණඝාතය සිදුකරන්නා ය. (2) ද්වේශයෙන් කටයුතු කරන්නා ය.

(3) අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා කරන්නා ය. (4) ගරු කළ යුත්තාට ගරු නොකරන්නා ය.

(11) මනා වූ උපමා පහකින් පඤ්ච නීවරණ ධර්මයන් පිළිබඳව පැහැදිලි කර දෙන බුදුරජාණන් වහන්සේ රත් වී උතුරමින් බුබුළු නැගෙන ජලය උපමා කර ඇත්තේ,

(1) කාමච්ඡන්දයට ය. (2) ව්‍යාපාදයට ය. (3) ථීන මිද්ධයට ය. (4) විචිකිච්ඡාවට ය.

(12) උපතිස්ස හා කෝලිත දෙදෙනා බුද්ධ ශ්‍රාවකයින් බවට පත්වීමට පෙර ඔවුන් දෙදෙනාගේ ගුරුවරයා වූයේ,

(1) සකුළුදායි පිරිවැජියා ය. (2) උපාලි පිරිවැජියා ය.

(3) සංජය පිරිවැජියා ය. (4) පොට්ඨපාද පිරිවැජියා ය.

(13) කර්මයේ බලපෑම කොතරම් තීරණාත්මක වුවද ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් ක්‍රියා කිරීමෙන් ඇතැම් කර්ම විපාකවලින් මිදිය හැකිය, මෙය හඳුන්වන්නේ,

(1) ගති සම්පත්ති නමිනි. (2) කාල සම්පත්ති නමිනි.

(3) ප්‍රයෝග සම්පත්ති නමිනි. (4) උපධි සමපත්ති නමිනි.

(14) දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව යනු,

(1) සතර බ්‍රහ්මවිහරණයන් ය. (2) සතර ඍද්ධිපාදයන් ය.

(3) සතර සම්‍යක් ප්‍රධාන වීර්යයන් ය. (4) සතර සංග්‍රහ වස්තූන් ය.

(15) බුදුරජාණන් වහන්සේ "උදුම්බරඛාදික" පුද්ගලයෙකු ලෙස උපමා කර ඇත්තේ,

(1) අඩු ආදයමක් ඇතිව වැඩියෙන් වියදම් කරන්නාට ය

(2) වැඩි ආදායමක් ඇතිව අඩුවෙන් වියදම් කරන්නාට ය.

(3) අය වැය සමව පවත්වා ගනිමින් කටයුතු කරන්නාට ය.

(4) අය නොඉක්මවා වැය කරන්නාට ය.

(16) "මහණෙනි අනුන්ගේ සිත් පිළිබඳව නොදන්නා, විමසන සුළු භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ වුවද සම්මා සම්බුද්ධ වේද නොවේදැයි විමසා බැලිය යුතුවෙයි" බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරන ලද්දේ,

(1) මංගල සූත්‍රය මගිනි. (2) පරාභව සූත්‍රය මගිනි.

(3) වීමංසක සූත්‍රය මගිනි. (4) කාලාම සූත්‍රය මගිනි.

(17) ථේරවාදී බුදු දහම දේශ දේශාන්තරවල ව්‍යාප්ත කරලීම උදෙසා ධර්මාශෝක රජතුමා ආරම්භ කළ ධර්ම දූත මෙහෙයේ දී සෝණ හා උත්තර යන තේරුන් වහන්සේලා වැඩම කරන ලද්දේ,

(1) ස්වර්ණ භූමියට ය. (2) වනවාසී දේශයට ය.

(3) කාශ්මීර දේශයට ය. (4) අපරන්ත දේශයට ය.

(18) ශ්‍රී ලාංකික භික්ෂුණී ශාසනයට ඇතුළත් වූ ප්‍රථම කාන්තාව වූයේ
(1) අනුලා බිසවයි. (2) සෝමා බිසවයි.
(3) මල්ලිකා බිසවයි. (4) ඛේමා බිසවයි.

(19) බුද්ධ ප්‍රතිමා අතර මාළිගාවෙල බුදු පිළිමය,
(1) ආබද්ධ හිටි පිළිමයකි. (2) ආබද්ධ හිඳි පිළිමයකි.
(3) අනාබද්ධ හිටි පිළිමයකි. (4) අනාබද්ධ හිඳි පිළිමයකි. .

(20) බුදුරජාණන් වහන්සේ පත්ත කම්ම සූත්‍රයෙන් දේශිත පඤ්ච බලි සංකල්පය අනුව අතිථි බලි යනු,
(1) ඥාතීන්ට සංග්‍රහ කිරීම ය. (2) දෙවියන්ට පිං අනුමෝදන් කිරීම ය.
(3) මිය ගිය ඥාතීන්ට පිං දීම ය. (4) ආගන්තුකයින්ට සංග්‍රහ කිරීම ය.

(21) බුදුරජාණන් වහන්සේ අණන සූත්‍රයෙහි දේශනා කර ඇති පරිදි පුද්ගලයෙකුට ලබා ගත හැකි චතුර්විධ සුඛ අතරින්, ණය ගැති නොවීමෙන් ඇතිවන සුඛය නම්,
(1) අත්ථි සුඛයයි. (2) භෝග සුඛයයි.
(3) අණන සුඛයයි. (4) අනවජ්ජ සුඛයයි.

(22) දෙවියෙකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු පෙන්වා දුන් සූත්‍ර දේශනාවක් වනුයේ,
(1) පරාභව සූත්‍රයයි. (2) පත්ත කම්ම සූත්‍රයයි.
(3) වසල සූත්‍රයයි. (4) වාසෙට්ඨ සූත්‍රයයි.

(23) ශාසන ඉතිහාසයේ සඳහන් වන ආකාරයට ථේරවාදී ධර්ම සංගායනා අතර පුස්තකාරූඪ ධර්ම සංගායනාව ලෙස හඳුන්වන්නේ,
(1) පළමු ධර්ම සංගායනාවයි. (2) දෙවන ධර්ම සංගායනාවයි.
(3) තුන්වන ධර්ම සංගායනාවයි. (4) සතරවන ධර්ම සංගායනාවයි.

(24) සත්ත්වයෝ නිරන්තරයෙන් පාපයට නැඹුරුවන්නෝය. තමාට අහිතකර වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩ දායක ද යහපත පිණිස පවතීද ඒවැනි දේ කිරීම ඉතා අපහසු ය. මෙම අදහස දෙන ධම්ම පද ගාථාවේ මුල් පදය වන්නේ,
(1) අත්තනාව කතං පාපං.... (2) තංච කම්මං කතං සාධු...
(3) සුකරානි අසාධූනී.... (4) අචරිත්වා බ්‍රහ්මචරියං...

(25) "මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවෙයි. මාගේ පොතක් වෙන කවුරුත් හෝ මුද්‍රණය කළාට එහි කොටස් උපුටා ගත්තාට මාගේ කිසිම විරුද්ධත්වයක් නැහැ" ධර්ම දානය පිණිස ම පොත් රචනා කළ, ඉහත ප්‍රකාශය කළ හිමි නම වූයේ.
(1) පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල හිමිපාණන් වහන්සේ ය.
(2) පූජ්‍ය වැලිවිට සිරි සරණංකර හිමිපාණන් වහන්සේ ය.
(3) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් වහන්සේ ය.
(4) පූජ්‍ය සිරි දේවමිත්ත ධර්මපාල හිමිපාණන් වහන්සේ ය.

(26) ලක්දිව බුදුදහම ස්ථාපිත වීමත් සමග ම ගොඩ නැගුණු මුල්ම ස්ථූපය වන අනුරාධපුර ථූපාරාම ස්ථූපයෙහි නිධන් කර ඇත්තේ,
(1) ග්‍රීවා ධාතූන් වහන්සේ ය. (2) ලලාට ධාතූන් වහන්සේ ය.
(3) දකුණු දන්ත ධාතූන් වහන්සේ ය. (4) දකුණු අකු ධාතූන් වහන්සේ ය.

(27) අවිධිමත් හා ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු පිළිබඳ බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි. ඒ අනුව නැගිට ගැනීමටවත් බැරි තරමට කෑම ගෙන එහි ම පෙරළී සිටින තැනැත්තා හැඳින්වූයේ,

(1) ආහාර හත්ථක ලෙස ය. (2) තත්ථාවට්ටක ලෙස ය.
(3) අලංසාටක ලෙස ය. (4) කාකමාසක ලෙස ය.

(28) මෙතෙක් හමුවී ඇති පෞරාණික ඉදිකිරීම් අතර කලාත්මක බවින් උසස්ම බෝධිඝරයක් දක්නට ලැබෙන්නේ,

(1) අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි මිහින්තලයෙහි ය.
(2) පොළොන්නරු දිස්ත්‍රික්කයෙහි මැදිරිගිරියෙහි ය.
(3) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි තිරියායෙහි ය.
(4) කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි නිල්ලක්ගම ය.

(29) දඹදෙණි සාහිත්‍ය යුගයට අයත්, මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමිපාණන් විසින් රචිත පූජාවලිය නම් වූ දහම් කෘතියෙන් විස්තර කෙරෙන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) අරහං ගුණයයි. (2) සම්මා සම්බුද්ධ ගුණයයි.
(3) ලෝකවිදූ ගුණයයි. (4) පුරිස ධම්ම සාරථී ගුණයයි.

(30) "සද්ධර්මය නමැති මිණිකැට ඇමුණු මාලය"යන අරුත් දෙන සද්ධර්මරත්නාවලිය නම් කෘතිය රචනා කරන ලද්දේ,

(1) මයුරපාද හිමියන් ය. (2) ධර්මසේන හිමියන් ය.
(3) ගුරුළුගෝමී පඬිතුමා ය. (4) විද්‍යාචක්‍රවර්ති පඬිතුමා ය.

(31) සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය නිර්මාණය වූ කව් සිළුමිණ රචනා කළ දෙවන පැරකුම්බා රජ එයට පාදක කරගෙන ඇත්තේ,

(1) සස ජාකයයි. (2) කුස ජාතකයයි.
(3) සත්තුභත්ත ජාතකයයි. (4) උම්මග්ග ජාතකයයි.

(32) බුදු දහමෙහි ඉගැන්වෙන පරිදි තමාට මෙන්ම අනුන්ට ද අවැඩක් නොවන පරිදි දැහැමි ධනෝපායන මාර්ගයක නියැලෙමින් ජීවත්වීම හැඳින්වූයේ,

(1) සම්මා සංකප්ප යනුවෙනි ය. (2) සම්මා කම්මන්ත යනුවෙනි ය.
(3) සම්මා ආජීව යනුවෙනි ය. (4) සම්මා වායාම යනුවෙනි ය.

(33) දස අකුසල් අතර අභිධ්‍යාව යනු,

(1) වැරදි වැටහීමයි. (2) මසුරු බවයි.
(3) දැඩි ලෙස තරහ ගැනීමයි. (4) අනුන් බිඳවීමයි.

(34) පඤ්චස්කන්දය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව ඇස කණ ආදී ඉඳුරන් රූප ශබ්දා දී අරමුණු හමුවූ විට සිතෙහි ඇතිවන වින්දනය යනු,

(1) වේදනා ස්කන්ධයයි. (2) සඤ්ඤා ස්කන්ධයයි.
(3) සංඛාර ස්කන්ධයයි (4) විඤ්ඤාණ ස්කන්ධයයි.

(35) "මම සසර නැවත නැවතත් ඉපදෙමින් පීඩා විඳීමට හේතු වූ තෘෂ්ණාව මුලිනුපුටා දැමුවෙමි" යි බුදුරජාණන් වහන්සේ ප්‍රථම උදානයෙහි වදාළහ.මීට හේතු වූ තෘෂ්ණාව පිළිබඳ පැහැදිලි කර දෙන්නේ,

(1) දුක්ඛ ආර්ය සත්‍යයෙනි.
(2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙනි.
(3) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයෙනි.
(4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයෙනි.

(36) "පුද්ගලයෙකුගේ යසස වැඩීමට හේතු වන කරුණු සතක් පෙන්වා දෙන ධම්ම පද අප්පමාද වග්ග යෙහි ඇතුළත් වන"උට්ඨානවතෝ සතිමතෝ.. යනාදී ගාථාවෙහි"නිසම්ම කාරිනෝ" යනුවෙන් දක්වා ඇත්තේ,

(1) මනා සිහියෙන් යුතුව කටයුතු කිරීමයි. (2) මනා හික්මීමකින් යුතුව ක්‍රියා කිරීමයි.
(3) තිදොරින් ම පිරිසිදු ක්‍රියා කිරීමයි. (4) විමසා බලා කටයුතු කිරීමයි.

(37) සසර දුක් ඇතිවන ආකාරය පෙන්වා දෙන අනුලෝම පටිච්ච සමුප්පාද ධර්මයට අනුව "තණ්හාව" නිසා ඇතිවනුයේ,

(1) වේදනාව ස්කන්ධයයි. (2) උපාදාන ස්කන්ධයයි.
(3) සංඛාර ස්කන්ධයයි. (4) විඤ්ඤාණ ස්කන්ධයයි.

(38) තම ප්‍රතිවාදියා මිය ගිය පසු ඔහුගේ ආදාහන කටයුතු රාජකීය ගෞරව සහිතව සිදුකර සෑයක් තනවා නිශ්ශබ්දතාව දක්වා එයට ගරුකරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිමින් සමාජයට ආදර්ශයක් සැපයූයේ,

(1) දේවානම් පියතිස්ස රජතුමා ය. (2) වළගම්බා රජතුමා ය.
(3) දුටුගැමුණු රජතුමා ය. (4) සද්ධාතිස්ස රජතුමා ය.

(39) ඡන්ද, ද්වේශ, භය, මෝහ, යන අංශයන්ගෙන් යුතුව කටයුතු කරන්නාගේ යසස අවපක්ෂයේ සඳමෙන් පිරිහෙන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී වදාළහ. මෙම අංගයන් නම්,

(1) සතර අගතීන් ය. (2) සතර කර්ම ක්ලේශයන් ය.
(3) සතර සංග්‍රහ වස්තූන් ය. (4) සතර ආශ්‍රමයන් ය.

(40) බුද්ධ දේශනාවට අනුව ලොව පවත්නා බලවත්ම රෝගය වන්නේ,

(1) පිළිකාව ය. (2) ඩෙංගු ය.
(3) කෝවිඩ් 19 ය. (4) කුසගින්න ය.

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය 04

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

### II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

(01). i. සම්බුද්ධත්වයෙන් අනතුරුව ලෝක සත්ත්වයාගේ හිතසුව පිණිස ධර්මය දේශනා කිරීම සඳහා බුදුරජාණන් වහන්සේට ආරාධනා කර සිටියේ කවරෙකු විසින්ද?

ii. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව පැවැත්වූ ස්ථානය හා එම පසළොස්වක පොහොය නම් කරන්න.

iii. මංගල ධර්ම දේශනාව හා එහි ඇතුළත් බුදු දහමෙහි මූලික ඉගැන්වීම කුමක්ද?

iv. නිර්වානගාමී ප්‍රතිපදාවෙහි ගමන් කරන්නෙකු විසින් අත්හළ යුතු අන්ත දෙක මොනවාද?

v. තෙවන ධර්ම සංගායනාව පැවැත්වූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුද?

vi. ලක්දිවට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රථමයෙන් ම දේශනා කළ සූත්‍ර දේශනාව කුමක්ද?

vii. සිංහලයේ පැරණි ගී කාව්‍ය දෙකක් වන මුවදෙව්දාවත හා සසදාවත සඳහා වස්තු විෂය වී ඇති ජාතක කතා නම් කරන්න.

viii. බුදුරජාණන් වහන්සේ පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගි කර ගනිමින් සමාජ ගැටලු ඇති වන හා නැතිවන ආකාරය පහදාදීමට අදාළ කරගත් සූත්‍ර දේශනා දෙක මොනවාද?

ix. භද්දාලිය සූත්‍රයෙන් පෙන්වා දෙන "ආහාරේ මත්තඤ්ඤුතා" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?.

x "සත්හට වන බව දුකට වෙදාණන්" යන පද්‍ය පාඨය ඇතුළත් ග්‍රන්ථය සහ කතුවරයා නම් කරන්න.

(02) බෞද්ධයාගේ මුදුන්මල්කඩ ලෙස සැලකෙන හස්තසාර ග්‍රන්ථය ධම්මපදය යි

i ධම්මපදය සූත්‍ර පිටකයේ කුමන නිකායට ඇතුළත් වේ ද?

ii. "තංච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාවේ ඉතිරි පද තුනද සහිතව ගාථාව සම්පූර්ණ කරන්න.

iii. එම ගාථාවෙහි අදහස ලියා පසුතැවීමට සිදු නොවන යහපත් ක්‍රියා පිළිබඳව හඳුන්වා දෙන්න

(03) නිර්මල වූ ථේරවාදී බුදු දහම එදා සිට අද දක්වා ආරක්ෂා වීම සඳහා ධර්ම සංගායනා මගින් සිදුවූ මෙහෙය අමිල ය.

i ධර්ම සංගායනා යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?.

ii. තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය, මූලිකත්වය දැරූ තෙරුන් වහන්සේ හා අනුග්‍රහය දැක්වූ රජතුමා නම් කරන්න.

iii. බුදු සසුනෙහි ආරක්ෂාව මෙන් ම ව්‍යාප්තිය උදෙසා තෙවන ධර්ම සංගායනාව මගින් සිදුවූ මෙහෙය පැහැදිලි කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04). යමෙක් පටිච්ච සමුප්පාදය නුවණැසින් දකීද හෙතෙම ධර්මය නුවණැසින් දකියි.

i. "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යන බෞද්ධ ඉගැන්වීම උපතිස්ස පිරිවැජියාට හඳුන්වා දෙනු ලැබූ තෙරුන් වහන්සේ කවුරුන් ද?

ii. "ඉමස්මිං සති ඉදං හෝති" යනුවෙන් දැක්වෙන පටිච්ච සමුප්පාද සරල සූත්‍රයෙහි ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න.

iii. පසුගිය වාර විභාගයේදී ලකුණු අඩුවෙන් ලැබීම නිසා කලකිරී සිටින ඔබගේ යහළුවෙකු දිරිමත් කිරීම සඳහා ඔබ ලබා දෙන උපදෙස් හේතු ඵල දහම ඇසුරින් පැහැදිලි කරන්න.

(05) බණ කතා සාහිත්‍යයක් වශයෙන් දියුණු වූ සිංහල සාහිත්‍ය අද දක්වා ම පෝෂණය වෙමින් බුදු දහම පෝෂණය කරමින් දහම් රසයක් ගෙන ඒමට මහඟු දායකත්වයක් සපයයි.

i ධර්ම ප්‍රදීපිකාව හා බුත්සරණ යන බෞද්ධ සාහිත්‍ය කෘති රචනා කළ කතුවරුන් දෙදෙනා නම් කරන්න.

ii. ගම්පොළ යුගයේදී රචිත බෞද්ධ සාහිත්‍ය කෘති තුනක් නම් කරන්න.

iii. දඹදෙණි යුගයේදී බෞද්ධ සාහිත්‍ය පෝෂණයට සිදුවූ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

(06) සියලු මානසික රෝගාබාධයන් දුරු කොට අති උතුම් ආරෝග්‍ය වූ විමුක්ති සුවය උදාකර ගැනීමට මගපෙන්වීම බුදු දහමෙහි පරම අපේක්ෂාවයි.

i ගිහියාගේ නිත්‍ය සීලය වන පඤ්ච සීලයෙහි ඇතුළත් ශික්ෂා පද අතර කායික හා මානසික නීරෝගිතාව පිණිස ම හේතුවන ශික්ෂා පද දෙක මොනවාද?

ii. මනස රෝගී වන කෙලෙස් හෙවත් අකුසල මූල තුන මොනවාද?

iii. කායික හා මානසික නීරෝගිතාව උදෙසා බුදුදහම පෙන්වා දෙන පිළිවෙත් පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i පළමු දම් දෙසුම

ii. දම්පල්තුමා

iii. සමජීවිකතා

iv මුරගල

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 2 |
| 2. | 4 | 12. | 3 | 22. | 1 | 32. | 3 |
| 3. | 2 | 13. | 3 | 23. | 4 | 33. | 2 |
| 4. | 4 | 14. | 4 | 24. | 3 | 34. | 1 |
| 5. | 2 | 15. | 1 | 25. | 1 | 35. | 2 |
| 6. | 1 | 16. | 3 | 26. | 4 | 36. | 4 |
| 7. | 1 | 17. | 1 | 27. | 2 | 37. | 2 |
| 8. | 2 | 18. | 1 | 28. | 4 | 38. | 3 |
| 9. | 1 | 19. | 3 | 29. | 1 | 39. | 1 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 4 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01) i සහම්පති මහා බ්‍රහ්මයා
ii බරණැස ඉසිපතනාරාමය, ඇසළ පසළොස්වක පොහොය
iii ධම්මචක්කපවත්තන සූත්‍රය, චතුරාර්ය සත්‍යය
iv කාමසුඛල්ලිකානුයෝගය, අත්තකිලමථානුයෝගය
v වසර 236 කට පසු
vi චූල්ලහත්ථිපදෝපම සූත්‍රය
vii මුවදෙව්දාවත - මඛාදේව ජාතකය
සසදාවත - සස ජාතකය
viii මහානිධාන සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය
ix පමණ දැන ආහාර ගැනීම.
x ලෝවැඩ සඟරාව - පූජ්‍යපාද වීදාගම මෛත්‍රේය හිමි

(02) i ඛුද්දක නිකාය
ii තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ- විපාකං පටිසේවති.
iii 11 ශ්‍රේණියේ පිටු අංක 51 නිවැරදි ප්‍රමාණවත් පිළිතුරට

(03) i ධර්මධර විනයධර මහතෙරුන් වහන්සේලා රැස්ව ශාසන අභිවෘද්ධිය අපේක්ෂාවෙන් බුද්ධ වචනය ඒකරාශි කොට සජ්ඣායනා කිරීමකි.
ii පැළලුප්නුවර අශෝකාරාමය, මොග්ගලී පුත්ත තිස්ස තෙරුන් වහන්සේ, ධර්මාශෝක රජතුමා
iii 11 ශ්‍රේණිය පෙළපොත පිටු 111-114 නිවැරදි ප්‍රමාණවත් පිළිතුරට.

(04) i අස්සජී මහ රහතන් වහන්සේ
ii ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති.
iii විභාගය අසමත් වීමට අදාළ හේතු පෙළ ගස්වා ඒවා නැති කිරීමට උපදෙස් ඇතුළත් පිළිතුරට ලකුණු ලබාදෙන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05) i ● ධර්මප්‍රදීපිකාව- ගුරුළුගෝමී පඬිතුමා.
● බුත්සරණ- අමෘතවාහ විද්‍යා චක්‍රවර්ති පඬිතුමා.

ii මයුර සංදේශය, තිසර සංදේශය, ශාසනාවතාරය, එළු අත්තනගළු වංශය,සද්ධර්මාලංකාරය

iii 10 ශ්‍රේණිය පෙළපොත පිටු අංක 120-123 ඇසුරින් ප්‍රමාණවත් පිළිතුරක්

(06) i ● කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම ● මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීම

ii රාග, ද්වේශ. මෝහ

iii 11 ශ්‍රේණියේ පිටු අංක 103-105 නිවැරදි ප්‍රමාණවත් පිළිතුරට

(07) i පළමු දම් දෙසුම -10 ශ්‍රේණිය 15 පාඩම

ii දම්පල්තුමා -11 ශ්‍රේණිය 05 පාඩම

iii සමජීවිකතා -11 ශ්‍රේණිය 20 පාඩම

iv මුරගල -10 ශ්‍රේණිය 20 පාඩම

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 05

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

## 1 පත්‍රය

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

(01) බෝධිසත්වයෙකුගේ පරම අභිලාශය වනුයේ,
- (1) බුද්ධත්වයට පත්වීමයි.
- (2) ආගමික වාද කිරීමයි.
- (3) අන්‍ය ආගම් මැඩලීමයි.
- (4) පුරුෂයින් දමනයයි.

(02) බුදුරජාණන් වහන්සේ සමඟ වාදයකට පැමිණ සූර්යාලෝකය හමුවේ කණාමැදිරි එළිය නැතිවන්නාසේ පරාජයට පත්වූයේ කවුද?
- (1) සංජය පරිබ්‍රාජකයා ය.
- (2) මක්ඛලී ගෝසාල ය.
- (3) සච්චක නම් නිගණ්ඨයා ය.
- (4) පූර්ණ කස්සප ය.

(03) අප මහා බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව පිරූ ආකාරයට නිදසුන් ලෙස දැක්විය හැකි ජාතක කතාව වනුයේ,
- (1) ලෝමහංස ජාතකයයි.
- (2) වට්ටක ජාතකයයි.
- (3) තේමිය ජාතකයයි.
- (4) මහාකපි ජාතකයයි.

(04) සාමඤ්ඤඵල සූත්‍රයේදී නොසන්සුන්වූ සිත සිරගෙයක දුක්විඳින අයකු වැනිය යනුවෙන් දැක්වෙන නීවරණ ධර්මය වනුයේ,
- (1) උද්ධච්ච කුක්කුච්චයයි.
- (2) විචිකිච්ඡාවයි.
- (3) ථීනමිද්ධයයි.
- (4) ව්‍යාපාදයයි.

(05) රේරුකානේ චන්දවිමල හිමියන් විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමක් ද?
- (1) ධර්ම විනිශ්චය
- (2) පොහොය දින ග්‍රන්ථය.
- (3) සාරාර්ථ සංග්‍රහය.
- (4) අභිධර්ම මාර්ගය.

(06) තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය. තමාට වැඩ දායක යහපත් දේ කිරීම අපහසුය යන අදහස දෙන ධම්ම පද ගාථාව කුමක් ද?
- (1) අත්තනාව කතං පාපං.....
- (2) සුකරානි අසාධුනී.....
- (3) අචරිත්වා බ්‍රහ්ම චරියං.....
- (4) තංච කම්මං කතං සාධු......

(07) වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසින් පානදුරා වාදය සිදු කළ වසර වූයේ මින් කුමක් ද?
- (1) ක්‍රි.ව. 1873 ය.
- (2) ක්‍රි.ව. 1837 ය.
- (3) ක්‍රි.ව. 1876 ය.
- (4) ක්‍රි.ව. 1883 ය.

(08) පුද්ගලයාගේ දියුණුවට හේතුවන කරුණු 38 ක් ඔස්සේ පෙන්වාදෙනු ලැබූ සූත්‍ර දේශනාව වූයේ,
- (1) පරාභව සූත්‍රයයි.
- (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයි.
- (3) අනණ සූත්‍රයයි.
- (4) මහා මංගල සූත්‍රයයි.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(09) "ස්වාමීන් වහන්ස, බොහෝ මහණ බමුණෝ පැමිණ තමන්ගේ ආගමික මතය පවසති, එයට ම ප්‍රශංසා කරති. අනුන්ගේ මතයට ගරහති" යනුවෙන් ප්‍රකාශ කළේ,
(1) ජෛනයන් ය. (2) වජ්ජීන් ය.
(3) කාලාමයන් ය. (4) උදය බමුණා ය.

(10) සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ, කර්මය දායාද කොට ඇත්තාහ, කර්මය කරණ කොට ඇත්තාහ. බුදුරජාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,
(1) යසකුල පුත්‍රයාටයි. (2) සුභ මානවකයාටයි.
(3) දීඝජාණු කෝලිය පුත්‍රයාටයි. (4) කාලාමයන්ටයි.

(11) චුල්ලකම්ම විභංග සූත්‍රයේ දැක්වෙන ආකාරයට ද්වේෂයෙන් කටයුතු කරන තැනැත්තා,
(1) දුර්වර්ණව උපදී. (2) දීර්ඝායුෂ විඳී.
(3) අල්පභෝගී වේ. (4) වර්ණවත්ව උපදී.

(12) සංජය පිරිවැජියා අතහැර සත්‍ය සොයා ගිය උපතිස්ස පරිබ්‍රාජකයාට අතරමඟ දී හමුවූයේ,
(1) භද්දිය තෙරුන් ය. (2) වප්ප තෙරුන් ය.
(3) මහානාම තෙරුන් ය. (4) අස්සජි තෙරුන් ය.

(13) අනුලෝම පටිච්චසමුප්පාද න්‍යායට අනුව සළායතන හේතුකොට ගෙන,
(1) වේදනාව ඇති වේ. (2) තණ්හාව ඇති වේ.
(3) ස්පර්ශය ඇති වේ. (4) උපාදානය ඇති වේ.

(14) පටිලෝම පටිච්චසමුප්පාදයට අනුව වේදනාව නැතිවී යාම නිසා,
(1) සළායතන පහළ නොවේ. (2) තණ්හාව ඇති නොවේ.
(3) නාම රූප ඇති නොවේ. (4) උපාදානය ඇති නොවේ.

(15) දැඩි චේතනාවක් නොමැතිව සිදුවන අසම්පූර්ණ කුසලාකුසල කර්ම හැඳින්වෙනුයේ,
(1) කටත්තා කර්ම ලෙසයි. (2) ආචිණ්ණ කර්ම ලෙසයි.
(3) ආසන්න කර්ම ලෙසයි. (4) ගරුක කර්ම ලෙසයි.

(16) බුදුරජාණන් වහන්සේ ගේ පන්සාළිස් වසක ශාසන සේවාව අතරතුර දී දහනමවන වස් කාලය ගත කළේ,
(1) මකුල පර්වතයේ ය. (2) පාරිලෙය්‍ය වනයේ ය.
(3) චාලිය පර්වතයේ ය. (4) භේෂකලා පර්වතයේ ය.

(17) අනිච්චාවත සංඛාරා උප්පාද වයධම්මිනෝ..... යන ගාථාව ඇතුළත් සූත්‍ර දේශනාව වූයේ,
(1) මංගල සූත්‍රයයි. (2) රතන සූත්‍රයයි.
(3) පරිනිබ්බාන සූත්‍රයයි. (4) ධම්මික සූත්‍රයයි.

(18) "මහණෙනි ඔබට මවෙක් නැත,පියෙක් නැත, එහෙයින් එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය" බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළේ,
(1) පූතිගත්ත තිස්ස තෙරුන් අසනීප වූ විට ය. (2) උදරාබාධයකින් පෙළුණු භික්ෂුවක් අරභයා ය.
(3) මහා කාශ්‍යප තෙරුන් රෝගී වූ විට ය. (4) ආනන්ද තෙරුන් රෝගී වූ විට ය.

(19) බුදුරජාණන් වහන්සේ ශාසනික තනතුරු ප්‍රදානය කිරීමේදී සැලකිලිමත් වූයේ,
(1) කුසලතාව පිළිබඳවයි. (2) ගෝත්‍රය පිළිබඳවයි.
(3) කුලය පිළිබඳවයි. (4) නිලය පිළිබඳවයි.

(20) බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට වස් තුන් මාසය පුරාවට ම සිව්පසය නොලැබුනේ,

, (1) භේෂකලා පර්වතයේ දී ය. (2) මකුල පර්වතයේ දී ය.

(3) චාලිය පර්වතයේ දී ය. . (4) වේරංජනාවේ දී ය.

(21) උප්පාද, ඨිති, භංග යනු ලෝකයේ ස්වභාවය යි මෙහි "ඨිති" යන්නෙහි අදහස,

(1) ඇති වීමයි. (2) දිරා යාමයි.

(3) පැවතීමයි. (4) නැති වීමයි.

(22) සත්ත්වයා නිර්මාණය වී ඇත්තේ නාම රූප ධර්මයන් ගෙනි. මෙහි "නාම"කොටසට අයත් වන්නේ,

(1) රූප, වේදනා, සංඥා, සංඛාර ය. (2) වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ය.

(3) රූප, සංඛාර, විඤ්ඤාණ, කම්ම ය. (4) කාය, වේදනා, රූප, සංඛාර ය.

(23) ගෙඩිගේ සම්ප්‍රදායට නිර්මාණය කළ ප්‍රතිමාඝරයකට උදාහරණයක් නොවන්නේ,

(1) ථූපාරාමය පිළිමගෙය වේ. (2) තොළුවිල පිළිමගෙය වේ.

(3) තිවංක පිළිමගෙය වේ. (4) ලංකාතිලක පිළිමගෙය වේ.

(24) විනය පිටකය කොටස් 05 කි, ඉන් විනය පිටකයට අයත් වන්නේ,

(1) දීඝ නිකාය වේ. (2) මහාවග්ග පාලිය වේ.

(3) අංගුත්තර නිකාය වේ. (4) යමක ප්‍රකරණය වේ.

(25) මහින්දාගමනය සිදුවූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන්,

(1) 210 වසරෙහි ය. (2) 223 වසරෙහි ය.

(3) 236 වසරෙහි ය. (4) 253 වසරෙහි ය.

(26) ලක්දිව භික්ෂුණී සාසනයේ ප්‍රථමයෙන් ම පැවිදි වූ ලාංකේය කාන්තාව වූයේ,

(1) අනුලා බිසවයි. (2) සෝමා දේවීයයි.

(3) ලීලාවතී බිසවයි. (4) සුගලා බිසවයි.

(27) අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේ,

(1) ආබද්ධ හිටි පිළිමයකි. (2) ආනාබද්ධ හිටි පිළිමයකි.

(3) ආබද්ධ ඔත් පිළිමයකි. (4) ආනාබද්ධ ඔත් පිළිමයකි.

(28) බෞද්ධ සිතුවම් කලාවට අයත් චිත්‍ර සහිත අනුරාධපුර යුගයට අයත් ස්ථානයක් වන්නේ,

(1) තිවංක පිළිමගෙය ය. (2) දිඹුලාගල ලෙන ය.

(3) දඹුලු ලෙන ය. (4) සීගිරි පර්වතය ය.

(29) පත්ත කම්ම සූත්‍රයේ "පංචබලි" නමින් ඉටුකළ යුතු යුතුකම් පහකි. එහි "අතිථි බලි" යනුවෙන් දැක්වෙන්නේ,

(1) ආගන්තුක සත්කාරය ය. (2) මියගිය ඥාතීන්ට පින් දීම ය.

(3) දෙවියන්ට පින් දීමය ය. (4) රජයට බදු ගෙවීම ය.

(30) නිවැරදි කාය කර්මයෙන්, නිවැරදි වූ වචී කර්මයෙන් හා නිවැරදි වූ මනෝ කර්මයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් ඇතිවන සැපය වන්නේ,

(1) අත්ථි සුඛයයි. (2) භෝග සුඛයයි.

(3) අනණ සුඛයයි. (4) අනවජ්ජ සුඛයයි.

(31) ලෝකයේ සියල්ල ත්‍රිලක්ෂණය අනුව දැකීම නිසා ඇතිවන සම්මා දිට්ඨිය,
(1) ධ්‍යාන සම්මා දිට්ඨිය නම් වේ. (2) විදර්ශනා සම්මා දිට්ඨිය නම් වේ.
(3) මාර්ග සම්මා දිට්ඨිය නම් වේ. (4) ඵල සම්මා දිට්ඨිය නම් වේ.

(32) විපාක දෙන කාලය අනුව සතර ආකාරවන කර්ම අතුරෙන් විපාක දීමට අවස්ථාවක් නොලබන කර්මය ධර්මයේ විස්තර වන්නේ,
(1) ජනක කර්මය ලෙසයි. (2) අහෝසි කර්මය ලෙසයි.
(3) උපපජ්ජවේදනීය කර්මය ලෙසයි. (4) දිට්ඨධම්මවේදනීය කර්මය ලෙසයි.

(33) තිදොරින් කරන දස අකුසල කර්ම අතර මනෝ කම්ම ගණයට අයත් නොවන කරුණක් වන්නේ,
(1) අභිධ්‍යාවයි. (2) ව්‍යාපාදයයි.
(3) අදත්තාදානයයි. (4) මිථ්‍යාදෘෂ්ටියයි.

(34) බුදුරජාණන් වහන්සේ සසර දුක් ඇතිවන ආකාරයත් නැතිවන ආකාරයත් පෙන්වා දීමට උපයෝගී කරගත්තේ,
(1) අනාත්ම වාදයයි. (2) පුබ්බේකත හේතු වාදයයි.
(3) පටිච්චසමුප්පාදයයි (4) ආත්ම වාදයයි.

(35) රජු විසින් සියලු රට වැසියන් තම දරුවන් සේ සලකා කටයුතු කිරීමේ ලක්ෂණය ඇතුළත් රාජ ධර්මය හැඳින්වෙන්නේ,
(1) අවිරෝධතා නමිනි. (2) තපස නමිනි.
(3) අවිහිංසා නමිනි. (4) අක්‍රෝධය නමිනි.

(36) ස්තූපයේ අලංකාරය හා ආරක්ෂාව සඳහා තොරණක ආකාරයෙන් සතර දිශාවේ ඉදි කළ ශ්‍රී ලංකාවේ ස්තූපවලට පමණක් ආවේණික නිර්මාණය හැඳින්වූයේ,
(1) වාහල්කඩ නමිනි. (2) පියගැටපෙළ නමිනි.
(3) කොරවක්ගල නමිනි. (4) වටදාගෙය නමිනි.

(37) කුරුණෑගල යුගයේදී රචිත බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයක් වන්නේ,
(1) සද්ධර්මරත්නාවලියයි. (2) බුදුගුණ අලංකාරයයි.
(3) ලෝවැඩ සඟරාවයි (4) සිංහල බෝධිවංශයයි.

(38) සිංහල කැටයම් ශිල්පියාගේ විශිෂ්ට කලා කුසලතාවයන් පෙන්නුම් කෙරෙන නිර්මාණයන් සඳහා දැක්විය හැකි හොඳම නිදසුනක් වන්නේ,
(1) සමාධි බුද්ධ ප්‍රතිමාවයි. (2) අවුකන බුද්ධ ප්‍රතිමාවයි.
(3) බිසෝ මාලිගයේ සඳකඩපහණයි. (4) ගල් විහාරයේ සැතපෙන පිළිමයයි.

(39) කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් සිදු කළ ධර්ම සංගායනාවේ දී ප්‍රධානත්වය ගනු ලැබුයේ,
(1) පාර්ශව තෙරුන් විසිනි. (2) වසුමිත්‍ර තෙරුන් විසිනි.
(3) මහානාම තෙරුන් විසිනි (4) සබ්බකාමී තෙරුන් විසිනි.

(40) බුදු දහමට අනුව රටක් දියුණුවට වඩාත් අවශ්‍ය වන්නේ ,
(1) පාලකයන්ගේ ධනවත් බවයි.
(2) පාලකයන්ගේ සිල්වත් බවයි.
(3) පාලකයන්ගේ උගත් බවයි. .
(4) පාලකයන්ගේ බලවත් බවයි.

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 05

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

### II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

(01). i. සමථ භාවනාවේ දී යටපත් වන පංච නීවරණවලින් දෙකක් සඳහන් කරන්න.

ii. සියලු පුද්ගලයින් චරිත ලක්ෂණ අනුව වර්ග 06 කට බෙදා ඇත.ඉන් වර්ග දෙකක් නම් කරන්න.

iii. බුදු ගුණ දෙකක් නම් කරන්න.

iv. " හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣතී " මෙම පාඨයේ තේරුම ලියන්න.

v. "නතං කම්මං කතං සාධු -යං කත්වා අනුතප්පතී
යස්ස අස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවතී" යන ධම්මපද ගාථාවේ අදහස ලියන්න.

vi. ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාවට අනුව පුද්ගලයාගේ මෙලොව දියුණුව පිණිස දේශනා කළ කරුණු දෙකක් නම් කරන්න.

vii. පළමු ධර්ම සංගායනාවේ දී ධර්මය හා විනය කරුණු පිළිබඳව මූලිකත්වය දැරූ මහරහතන් වහන්සේලා නම් කරන්න.

viii. දසරාජ ධර්මවල ඍජු බව යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

ix. දෙගල්දොරුව, රන්ගිරි දඹුළු විහාරය, රිදී විහාරය යනාදී ස්ථානවල දැකිය හැකි සිතුවම් කුමන යුගයට අයත් වේ ද?

x දැනට ලෝකයේ පවතින පැරණිම සමාජ සංවිධානය නම් කරන්න.

(02) i බුදු දහමට අනුව භාවනාව බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ii. විපස්සනා භාවනාවේ දී අවබෝධ වන ත්‍රිලක්ෂණය නම් කරන්න.

iii. සමථ භාවනාව වැඩීමෙන් අකුසල් සිතිවිලි යටපත් වන බව පැහැදිලි කරන්න.

(03) i ධම්මපදය ග්‍රන්ථය ගාථා කීයකින් හා වග්ග කීයකින් සමන්විත වේ ද?

ii. "අසවලා මට බැන්නේය.......... මා සතු දේ පැහැර ගත්තේය. යනුවෙන් නැවත නැවත වෛර නොකරන අයගේ වෛරය සංසිඳේ" මෙම අදහස ඇති ධම්මපද ගාථාව කුමක්ද ?

iii. වෛර නොකිරීමෙන් සමාජය දියුණු සමාජයක් බවට පවත්වන ආකාරය පහදා දෙන්න.

(04) i පරාභව සූත්‍රයේ පුද්ගල පරිහානියට හේතුවන කරුණු ගාථා කීයකින් දේශනා කොට තිබේ ද?

ii පරාභව සූත්‍රය අනුව පිරිහීමේ කරුණු තුනක් නම් කරන්න

iii පරාභව සූත්‍රයේ උපදේශයන්ට අනුව ඔබගේ ජීවිතය දියුණුව කරා මෙහෙවීමට ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05). i පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට මුල් වූ ප්‍රධාන හේතුව ලියන්න.

ii. එම ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය දැක්වූ රජතුමා, හා සම්බන්ධ වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව සඳහන් කරන්න.

iii. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල සම්බුදු සසුනේ ඉදිරි පැවැත්මට හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

(06) i දස සක්විතිවත් පිළිබඳ තොරතුරු ඇතුළත් වන සූත්‍ර දේශනාව කුමක් ද?

ii. දස සක්විතිවත්වලින් තුනක් සඳහන් කරන්න.

iii. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා දස සක්විතිවත්වල ඇති වැදගත්කම සක්විතිවත් පහක් ඇසුරින් දක්වන්න.

(07) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i අංගුලිමාල දමනය.

ii සතර අගතිය.

iii මහනුවර යුගයේ චිත්‍ර.

iv රේරුකානේ චන්දවිමල හිමි.

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 1. 1 | 11. 1 | 21. 3 | 31. 2 |
| 2. 3 | 12. 4 | 22. 2 | 32. 2 |
| 3. 4 | 13. 3 | 23. 2 | 33. 3 |
| 4. 1 | 14. 2 | 24. 2 | 34. 3 |
| 5. 3 | 15. 1 | 25. 3 | 35. 4 |
| 6. 2 | 16. 3 | 26. 1 | 36. 1 |
| 7. 1 | 17. 3 | 27. 1 | 37. 4 |
| 8. 4 | 18. 2 | 28. 4 | 38. 3 |
| 9. 3 | 19. 1 | 29. 1 | 39. 1 |
| 10. 2 | 20. 4 | 30. 4 | 40. 2 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01) i කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා (මින් දෙකක්)

ii නව අරහාදී බුදු ගුණවලින් ඕනෑම දෙකක්

iii රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත (මින් දෙකක්)

iv "හේතු නිසා ඇතිවන දේ හේතු නැති විට නැති වී යයි"

v යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේ ද දුක් විපාක කඳුළු පිරි දෙනෙතින් හඬමින් විඳින්නට සිදුවේද එවැනි ක්‍රියා නොකළ යුතුයි.

vi උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා (මින් දෙකක්)

vii ධර්මය - ආනන්ද මහ රහතන් වහන්සේ
විනය - උපාලි මහ රහතන් වහන්සේ

viii අගතිගාමී නොවී යුක්තිය සාධාරණත්වය උදෙසා අවංක වීම

ix මහනුවර යුගය.

x බෞද්ධ භික්ෂු සංවිධානයයි.

(02) i සමථ භාවනා, විපස්සනා භාවනා

ii අනිත්‍ය, දුක්ඛ, අනාත්ම.

iii පංච නීවරණවලට අයත් අකුසල සිතිවිලි විස්තර කොට, සමථ භාවනා මගින් ඒවා යටපත් කළ හැකි බව පෙන්වා දී තිබිය යුතු ය.

(03) i ගාථා 423 කි , වග්ග 26 කි.

ii අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං න උපනයිහන්ති
වේරං තේසූපසම්මති

iii වෛරයෙන් වෛරය නොසන්සිඳෙන බව බුදු දහමේ ඉගැන්වීමයි. එබැවින් වෛර කිරීමෙන් සමාජය විනාශ වන ආකාරයත් වෛර නොකොට මෛත්‍රියෙන් ජීවත් වීමෙන් සමාජය දියුණු වන ආකාරයත් දක්වා තිබිය යුතුය.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04) i ගාථා දොළහකි.

ii 11 ශ්‍රේණිය 08 වන පාඩම පිටු 66/ 67 කරුණුවලින් ඕනෑම තුනක්.

iii පරාභව සූත්‍රයේ ප්‍රමාණවත් කරුණු ගණනක් ඇසුරෙන් ඒවා චරිත ලක්‍ෂණ කොට ගත් අය පිරිහී දුකට පත්වන ආකාරයත් එම ලක්ෂණ අතහැර ධර්මානුකූලව කටයුතු කිරීමෙන් ජීවිතය දියුණුවන ආකාරයත් දක්වා තිබිය යුතු ය.

(05) i සුභද්‍ර නම් භික්ෂුවගේ අදැහැමි වචන

ii ස්ථානය - රජගහ නුවර වේභාර පර්වත පාමුල සප්තපර්ණී ගුහා ද්වාරය
අනුග්‍රහය - අජාසත්ත රජතුමා
සහභාගී වූ රහතන් වහන්සේලා ගණන - 500 නම යි.

iii විසිරී තිබූ ධර්මය එක් රැස් කිරීමෙන් ද විනය වෙනස් නොකිරීමෙන් ද භාණක පරම්පරා ධර්මය විනය රැක ගෙන ඉදිරියට යාමට වගකීම් භාරගැනීමෙන්ද සිදු වූ මෙහෙය විස්තරකොට තිබිය යුතු ය.

(06) i චක්කවත්ති සීහනාද සූත්‍රය.

ii 10 ශ්‍රේණිය 22 පාඩම 124, 125 පිටු.

iii තෝරාගත් කරුණු පහක් වර්තමානයට ගළපමින් එම කරුණුවල වැදගත්කම ඉස්මතු වන අයුරින් පිළිතුරු සංවිධානය කොට තිබිය යුතු ය.

(07) i 11 ශ්‍රේණිය 02 පාඩම 11 පිටුව.

ii 10 ශ්‍රේණිය 22 පාඩම 129 පිටුව

iii 11 ශ්‍රේණිය 18 පාඩම 132 පිටුව.

iv 11 ශ්‍රේණිය 05 පාඩම 41 පිටුව

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය 06 | | |
| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |

## 1 පත්‍රය

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

(01) බුදු දහම අනුව මිනිසාට වැළඳෙන මානසික රෝග සඳහා හේතු වන කරුණක් වන්නේ,
(1) සෙමෙහි බලපෑමයි. (2) වාතයෙහි බලපෑමයි.
(3) පිතෙහි බලපෑමයි. (4) ද්වේෂයෙහි බලපෑමයි.

(02) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා වූයේ,
(1) වා,පිත්,සෙම් රෝග සමනයටයි. (2) වකුගඩු,අක්මා රෝග සමනයටයි.
(3) ගෙඩි,දද,කුෂ්ඨ රෝග සමනයටයි. (4) රාග,ද්වේෂ,මෝහ කෙලෙස් රෝග සමනයටයි

(03) භාරතයේදී සිදු කළ සිව්වන මහායාන ධර්ම සංගායනාවට අනුග්‍රහය දක්වන ලද්දේ,
(1) අජාසත් රජු විසිනි. (2) කණිෂ්ක රජු විසිනි.
(3) ධර්මාශෝක රජු විසිනි. (4) කාලාශෝක රජු විසිනි.

(04) අනුරාධපුර යුගයේ රචනා වූ සාහිත්‍යකරණයට යොමු වන්නන්ට උපදෙස් සපයන ග්‍රන්ථය වන්නේ,
(1) සිඛවළඳ හා සිඛවළඳවිනිසයයි. (2) සියබස්ලකරයි.
(3) ධම්පියා අටුවා ගැටපදයයි. (4) සීහලට්ඨ කථායි.

(05) මිනිස් තිරිසන් ආදී සෑම කොටසකම ආරක්ෂාව තහවුරු කෙරෙන පාලන මූල ධර්ම වනුයේ,
(1) දසරාජ ධර්ම ය. (2) සප්ත අපරිහානීය ධර්ම ය.
(3) දස සක්විතිවත් ය. (4) සතර සංග්‍රහ වස්තු ය.

(06) ජීවිතය හා ලෝකය ත්‍රිලක්ෂණයට අනුව බලන භාවනාව හඳුන්වන්නේ,
(1) සමථ භාවනාව ලෙස ය. (2) විපස්සනා භාවනාව ලෙස ය.
(3) චිත්ත භාවනාව ලෙස ය. (4) සමාධි භාවනාව ලෙස ය

(07) පූජ්‍ය රේරුකානේ හිමි විසින් උපාසක උපාසිකාවන්ට අෂ්ඨාංග සීලය රකිමින් කල් ගත කළ යුතු ආකාරය ගැන උපදෙස් ලබා දෙන ග්‍රන්ථය වනුයේ,
(1) පොහොය දිනයයි. (2) ධර්ම විනිශ්චයයි.
(3) බෞද්ධයාගේ අත් පොතයි. (4) පාරමිතා ප්‍රකරණයයි.

(08) යමෙක් පව් කළොත් තමාම කෙළෙසෙන බවත් එසේ නොකළහොත් පිරිසිදු වන බවත්, එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි බවත් ප්‍රකාශ කෙරෙන ධම්ම පද ගාථාවේ මුල් පදය වන්නේ,
(1) "නතං කම්මං කතං සාධු " ය. (2) "තංච කම්මං කතං සාධු" ය.
(3) "අත්තනාව කතං පාපං" ය. (4) "අචරිත්වා බ්‍රහ්ම චරියං" ය.

(09) කාලාම සූත්‍රයේ දේශිත කරුණු අතරින් යමක් පිළිගැනීමට සුදුසු කරුණක් වන්නේ, එම කරුණ
(1) කටකතා මගින් පැවත ආ නිසා ය. (2) ආරංචි මාත්‍රයක් වූ නිසා ය.
(3) තර්කයට ගැළපීම නිසා ය. (4) කුසල් බව ප්‍රත්‍යක්ෂ වීම නිසා ය.

(10) අඩු ආදායමක් ඇතිව වැඩියෙන් වියදම් කරන්නා හැඳින්වෙන්නේ,
(1) අජද්ධුමාරික ලෙස ය. (2) උදුම්බරඛාදික ලෙස ය.
(3) ආහාර හත්ථක ලෙස ය. (4) අලංසාටක ලෙස ය. .

(11) පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දැකිය හැක්කේ,
(1) මහියංගන ධාතු ගර්භයේ ය. (2) හිඳගල විහාරයේ ය.
(3) තිවංක පිළිම ගෘහයේ ය. (4) දිඹුලාගල ලෙන්වල ය.

(12) තෙරුවන් ගුණ දැන දැක අවබෝධයෙන් ඇති කර ගනු ලබන හිතේ පැහැදීම,
(1) ප්‍රසාදය නම් වේ. (2) අමූලිකා සද්ධා නම් වේ.
(3) ආකාරවතී සද්ධා නම් වේ. (4) භක්තිය නම් වේ.

(13) පුද්ගලයන්ගේ මෙලොව හා පරලොව දියුණුවට හේතු වන කරුණු අටක් ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රයයි. (2) පත්තකම්ම සූත්‍රයයි.
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (4) කාලාම සූත්‍රයයි.

(14) චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව සත්වයා දීර්ඝායුෂ ලැබීමට හේතු වන්නේ,
(1) ප්‍රාණඝාත නොකිරීම නිසා ය. (2) අන් සැපතට සතුටු වීම නිසා ය.
(3) දන් දීම නිසා ය. (4) ද්වේෂ නොකිරීම නිසා ය.

(15) බුද්ධ රත්නය හා ධම්ම රත්නය වෙසක් පෙහෝ දිනක ලොව පහළ වූ අතර සංඝ රත්නය ලොව පහළ වූයේ,
(1) පොසොන් පුන් පොහෝ දිනක ය. (2) නිකිණි පුන් පොහෝ දිනක ය.
(3) ඇසළ පුන් පොහෝ දිනක ය. (4) බිනර පුන් පොහෝ දිනක ය.

(16) සබඳතා රකින මිනිස් යුතුකම් පිළිබඳ බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
(1) මංගල සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) කරණීය මෙත්ත සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

(17) තමා උපමා කොට අනුන් ගැන සිතන්නට බුදු දහමේ උගන්වා ඇති දහම වන්නේ,
(1) සිව් සඟරාවතයි. (2) සිව් බඹ විහරණයි.
(3) අත්තූපනායික ධර්මයයි. (4) පද්මාකාර ජීවිතයයි.

(18) විපාක දෙන ආකාරය අනුව කර්මය බෙදෙන සතර ආකාරයට අයත් නොවන්නේ,
(1) අහෝසි කර්මයයි. (2) කටත්තා කර්මයයි.
(3) ගරුක කර්මයයි. (4) ආචිණ්ණ කර්මයයි.

(19) මනෝකර්මවලට අයත් නොවන්නේ,
(1) අභිධ්‍යාවයි. (2) ව්‍යාපාදයයි.
(3) අවිහිංසාවයි. (4) මිත්‍යාදෘෂ්ටියයි.

(20) දුගී පවුලක උපත ලැබුවද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ,
(1) උපධි සම්පත්තිය නිසා ය. (2) කාල සම්පත්තිය නිසා ය.
(3) ප්‍රයෝග සම්පත්තිය නිසා ය. (4) ජාති සම්පත්තිය නිසා ය.

(21) සහජීවනය යනු,
  (1) විවාද නොකර ජීවත් වීමයි.
  (2) පන්සිල් රකිමින් ජීවත් වීමයි.
  (3) සමගියෙන් සහයෝගයෙන් ජීවත් වීමයි.
  (4) ලද දෙයින් සතුටු වී ජිවත් විමයි.

(22) සිත තුළ උපදින සටහන් හඳුනා ගැනීම අයිති වන්නේ පංචස්කන්ධයේ කුමන ස්කන්ධයකටද,
  (1) රූප ස්කන්ධයට ය.  (2) සඤ්ඤා ස්කන්ධයට ය.
  (3) සංඛාර ස්කන්ධයට ය.  (4) විඤ්ඤාණ ස්කන්ධයට ය.

(23) පහත ඒවායින් භෝග විනාශයට හේතුවක් නොවන්නේ,
  (1) නැටුම් ගැයුම් හි ලොල් වීම ය  (2) සිහි මුලා නොවී කටයුතු කිරීම ය.
  (3) පව්ටු මිතුරන් ඇසුරු කිරීම ය.  (4) අලස කමින් කල් ගෙවීම ය.

(24) වැලිවිට අසරණ සරණ සරණංකර හිමිගේ ගිහි නාමය,
  (1) විමලවීර බණ්ඩාර ය.  (2) කුලතුංග සරණසිරි ය.
  (3) කුලතුංග බණ්ඩාර ය.  (4) වැලිවිට බණ්ඩාර ය.

(25) බුදු බව ලැබීමට උපකාරී වු බෝධි වෘක්ෂය දෙස ඇසිපිය නොසලා බලා සිටීම මගින් ලබා දුන් ආදර්ශය වන්නේ,
  (1) ප්‍රඥාවන්ත භාවයයි.  (2) කළ ගුණ සැලකීමේ ගුණයයි.
  (3) කාරුණික භාවයයි.  (4) පරිසරයට ආදරය දැක්වීමයි.

(26) තමා විසින් සිදු කරන සියලු යහපත් ක්‍රියා පින් පොතෙහි සටහන් කළ දුටු ගැමුණු රජතුමා වෙසක් උත්සව,
  (1) 28 ක් පවත්වා ඇත.  (2) 10 ක් පවත්වා ඇත.
  (3) 24 ක් පවත්වා ඇත.  (4) 22 ක් පවත්වා ඇත.

(27) "ලෝ වැඩ සඟරාව" නම් වූ උපදේශනාත්මක කාව්‍ය සංග්‍රහය රචනා කරන ලද්දේ,
  (1) වීදාගම මෛත්‍රේය හිමි ය.  (2) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
  (3) වැලිවිට ශ්‍රී සරණංකර හිමි ය.  (4) වැත්තෑවේ හිමි ය.

(28) ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදිය අයත් වන්නේ චතුරාර්ය සත්‍යයේ,
  (1) සමුදය සත්‍යයට ය.  (2) නිරෝධ සත්‍යයට ය.
  (3) දුක්ඛ සත්‍යයට ය.  (4) මාර්ග සත්‍යයට ය.

(29) ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස යන සළායතන හේතුකොට ගෙන ඇති වෙන්නේ,
  (1) ඵස්ස හෙවත් ස්පර්ශයයි.  (2) සංඛාර හෙවත් කුසලා කුසල කර්මයයි.
  (3) නාම රූප හෙවත් පංචස්කන්ධයයි.  (4) ජාති හෙවත් සසර ඉපදීමයි.

(30) "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ" මෙම ගාථාවෙන් පැහැදිලි කර ඇත්තේ,
  (1) කර්මය පිළිබඳවයි.  (2) චතුරාර්ය සත්‍යය පිළිබඳවයි.
  (3) ත්‍රිලක්ෂණය පිළිබඳවයි.  (4) පටිච්චසමුප්පාදය පිළිබඳවයි.

(31) පටිලෝම පටිච්චසමුප්පාදය අනුව අවිද්‍යාව ඉතිරි නොකොට සපුරා ක්ෂය කිරීමෙන්,
  (1) කුසලාකුසල කර්ම රැස් නොවේ.  (2) තණ්හාව නැති වේ.
  (3) භවය නැතිවේ.  (4) ජාතිය නැති වේ.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(32) බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ චුල්ලවග්ග පාලියේ "වත්තක්ඛන්ධකයෙහි" විස්තර කර ඇත්තේ,
   (1) භික්ෂූන් වහන්සේලා සෙනසුන් පවත්වා ගෙන යා යුතු ආකාරය පිළිබඳවයි.
   (2) භික්ෂූන් වහන්සේලා ආහාරයෙහි පමණ දැන වැළඳිය යුතු ආකාරය පිළිබඳවයි.
   (3) භික්ෂූන් වහන්සේලා ගමෙහි හැසිරිය යුතු ආකාරය පිළිබඳවයි.
   (4) භික්ෂූන් වහන්සේලා ධර්මය දේශනා කළ යුතු ආකාරය පිළිබඳවයි. .

(33) භද්දාලි සූත්‍රයේ සඳහන් ආකාරයට පමණ දැන ආහාර අනුභව කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල පහත දැක්වේ, එයට ඇතුළත් නොවන කරුණක් වන්නේ,
   (1) රූප සම්පත්තිය වර්ධනය වීම ය.  (2) රෝගාබාධ අඩු වීම ය.
   (3) නිදුක් බව ය.  (4) කාය බලය වර්ධනය ය.

(34) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ඇසුරේ වස් විසූ අවස්ථා බොහෝ ඇත. ඉන් පළමු වස් කාලය ගත කළේ,
   (1) මකුල පර්වතයේ ය.  (2) බරණැස ඉසිපතනයේ ය.
   (3) පාරිලෙය්‍ය වනයේ ය.  (4) සිංසපා වනයේ ය.

(35) බුදුරජාණන් වහන්සේ පොට්ඨපාද පිරිවැජියාගේ ආරාමයට වැඩම කරන විට එම පිරිවැජියා විසින් සෙසු පිරිවැජියන් නිශ්ශබ්ද කරනු ලැබීය. මින් පැහැදිලි වන්නේ,
   (1) බුදු රජාණන් වහන්සේ වැඩම කරන විට ගරු කළ යුතු බවයි.
   (2) බුදු රජාණන් වහන්සේ නිහඬ බව අගය කළ බවයි.
   (3) බුදු රජාණන් වහන්සේ ඉවසීමේ ගුණයෙන් යුක්ත බවයි.
   (4) බුදු රජාණන් වහන්සේ අන් අයගේ ගෞරවය අපේක්ෂා කළ බවයි.

(36) පළමු හා දෙවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථාන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
   (1) රජගහ නුවර සප්ත පණ්ණි ගුහාව අසල සහ අශෝකාරාමය යි .
   (2) විශාලා මහනුවර වාලුකාරාමය සහ රජගහ නුවර සප්ත පණ්ණි ගුහාව යි.
   (3) රජගහ නුවර සප්ත පණ්ණි ගුහාව සහ විශාලා මහනුවර වාලුකාරාමය යි.
   (4) පැළලුප් නුවර අශෝකාරාමය සහ විශාලා මහනුවර වාලුකාරාමය යි.

(37) තුන්වන ධර්ම සංගායනාවෙන් පසු බුදු සසුනේ චිරස්ථිතිය සඳහා ගත් ක්‍රියා මාර්ගයක් නොවන්නේ,
   (1) දුසිල් මහණුන් 60000 ක් සසුනෙන් නෙරපා සසුන පිරිසිදු කිරීමයි.
   (2) බුද්ධානුබුද්ධක ශික්ෂා පද වෙනස් නොකිරීමට තීරණය කිරීමයි.
   (3) කථාවත්ථුප්පකරණය අභිධර්ම පිටකයට ඇතුළත් කිරීමයි.
   (4) නැවත ශාසනික පිළිවෙත් ආරම්භ කිරීමයි.

(38) "විද්වතුන්ගේ අදහස අනුව ප්‍රථමයෙන් බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය වී ඇත්තේ,
   (1) ධර්මාශෝක රජ සමයේ ය.  (2) කණිෂ්ක රජ සමයේ ය.
   (3) කාලාශෝක රජ සමයේ ය.  (4) අජාසත්ත රජ සමයේ ය.

(39) සෝලියස් මෙන්දිස් චිත්‍ර ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ දැකිය නොහැකි ස්ථානයක් වන්නේ ,
   (1) කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ ය.
   (2) මැද්දේපොල විහාරයේ ය.
   (3) කැලණි විහාරයේ පැරණි විහාර මන්දිරයේ ය.
   (4) රණස්ගල්ල විහාරයේ ය.

(40) සම්මා දිට්ඨිය පස් ආකාරයකින් යුක්ත වේ. ඉන් " කම්මස්සකතා සම්මා දිට්ඨිය " යනු
   (1) සෝවාන් ආදී මාර්ග සිත්වල ඇති වන සම්මා දිට්ඨියයි.
   (2) තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරාම පැමිණෙන බව දකින සම්මා දිට්ඨියයි.
   (3) සියල්ල ත්‍රිලක්ෂණයෙන් දැකීමේ සම්මා දිට්ඨියයි.
   (4) සෝවාන් ආදී මාර්ග සිත්වල පහළ වන සම්මා දිට්ඨියයි.

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 06

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

## II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

.(01) කෙටි පිළිතුරු සපයන්න.

i. ත්‍රිලක්ෂණ ධර්ම අතරින් දෙකක් නම් කරන්න.

ii. පහත පාලි වචන දෙකෙහි තේරුම් ලියන්න.

1 සතිමතෝ

2 සුචිකම්මස්ස

iii. අනණ සූත්‍රයේ සඳහන් චතුර්විධ සැප අතරින් 02 ක් ලියන්න.

iv. අප උපයන ධනය විනාශ වී යා හැකි ක්‍රම හතරක් පිළිබඳව ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ය. ඒ අතරින් දෙකක් ලියන්න.

v. අයට වඩා වැය අඩුවෙන් පවත්වා ගැනීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වන්නේ කෙසේද?

vi. අලුවිහාර සංගායනාව හැඳින්වීමට තවත් නමක් ලියන්න.

vii. "විනයෝ නාම සාසනස්ස ආයු" යන පාලි පාඨයේ තේරුම ලියන්න.

viii. "වචනයෙන් සිදුවන වැරදි හතරකි" ඒ අතරින් දෙකක් ලියන්න.

ix. සිංහල භාෂාවෙන් රචනා වූ පැරණිම ගී කාව්‍ය දෙක නම් කරන්න.

x වැලිවිට සරණංකර හිමිපාණන් වහන්සේගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(02) i. බුදු දහමට අනුව සත්ත්වයා, ලෝකයා යනුවෙන් හඳුන්වා ඇති ධර්ම දෙක නම් කරන්න.

ii. පංචස්කන්ධය අතරින් ස්කන්ධ තුනක් නම් කරන්න.

iii. ත්‍රිලක්ෂණය අවබෝධ කරගැනීමෙන් පුද්ගලයාට මෙලොව හා පරලොව වශයෙන් ලැබෙන ප්‍රයෝජනය පැහැදිලි කරන්න.

(03) i උට්ඨානවතෝ සතිමතෝ යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ සරල අදහස ලියන්න.

iii. එම ගාථාවේ සඳහන් ධර්ම කරුණු ඇසුරෙන් පුද්ගල ජීවිතයේ යසස වර්ධනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(04) i. රැකියාවක් ලෙස වෙළෙඳාම තෝරාගන්නා අය විසින් නොකළ යුතු වෙළෙඳාම් 03 ක් නම් කරන්න.

ii. බුද්ධ දේශනාවට අනුව කළ යුතු ධාර්මික රැකියා 03 ක් නම් කරන්න.

iii. උසස් ගුණ ධර්ම අනුව තම චරිතය සකසා ගැනීමටත් ආර්ථික දියුණුව පිණිසත් "කල්‍යාණ මිත්තතා" යන දහම් උපදේශයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05) i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

ii. එම සංගායනාවෙන් ලැබුණු ප්‍රතිඵල තුනක් ලියන්න.

iii. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන චිරස්ථිතිය සඳහා ඉවහල් වූ ආකාරය සාකච්ඡා කරන්න.

(06) i. බුදුරජාණන් වහන්සේ සප්ත අපරිහානීය ධර්ම දේශනා කොට වදාළේ කාටද?

ii. එම රාජ්‍ය පාලන ධර්ම හතෙන් තුනක් නම් කරන්න.

iii. ඔබ නම් කරන ලද එම ධර්ම තුන යහපත් රාජ්‍ය පාලනයක් උදෙසා වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමි

ii. මෙහෙණි සසුන

iii. සතර සංග්‍රහ වස්තු

iv. ප්‍රතිමාසර

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 1 |
| 2. | 4 | 12. | 3 | 22. | 2 | 32. | 1 |
| 3. | 2 | 13. | 3 | 23. | 2 | 33. | 1 |
| 4. | 2 | 14. | 1 | 24. | 3 | 34. | 2 |
| 5. | 3 | 15. | 3 | 25. | 2 | 35. | 2 |
| 6. | 2 | 16. | 2 | 26. | 3 | 36. | 3 |
| 7. | 1 | 17. | 3 | 27. | 1 | 37. | 2 |
| 8. | 3 | 18. | 1 | 28. | 3 | 38. | 2 |
| 9. | 4 | 19. | 3 | 29. | 1 | 39. | 3 |
| 10. | 2 | 20. | 1 | 30. | 4 | 40. | 2 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01) i අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

ii සතිමතෝ - එළඹ සිටි සිහිය, යහපත් කල්පනාව, සිහිය, හරි වැරැද්ද දැක කටයුතු කිරීම, මතක ශක්තිය.

සුචිකම්මස්ස- පිරිසිදුව කටයුතු කිරීම, කයින්, වචනයෙන් හා සිතින් නිවැරදි දේ කිරීම, පව්කම් නොකර පින්කම් කුසල් කිරීම.

iii
- අත්ථි සැප - ධාර්මිකව උපයාගත් ධනයක් තමන්ට ඇතැයි සිතා සතුටු වීම.
- භෝග සැප - ධාර්මිකව උපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලබන සැපය
- අණන සැප - ණය නැතැයි සිතා සතුටු වීම
- අනවජ්ජ සැප - සිත, කය, වචනය, තුන්දොර හික්මවාගෙන සතුටු වීම.

iv
- සොරුන් විසින් පැහැර ගැනීම
- ගින්නෙන් හෝ ජලයෙන් විනාශ වීම.
- තමා අප්‍රිය අයෙකුට අයිති වීම.

v "සමජීවිකතා" යන නමිනි.

vi "පුස්තකාරූඪ සංගායනාව"

vii ශාසනයේ ආයුෂ විනයයි.

viii
- බොරු කීම - මුසාවාද
- කේලාම් - පිසුණාවාචා
- හිස් වචන - සම්පප්ඵලාප
- පරුෂ වචන කීම - පරුෂාවාචා

ix මුවදෙව්දාවත , සසදාවත.

x
- ත්‍රිවිධ රත්නය පිළිබඳ අපිරිමිත ශ්‍රද්ධාවෙන් යුක්තවීම
- ශික්ෂාකාමී හා අල්පේච්ඡව ජීවත්වීම.
- නිරහංකාරබව
- ස්ථිර අධිෂ්ඨානය

(02) i නාම ධර්ම හා රූප ධර්ම

ii රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සඤ්ඤා ස්කන්ධය,
සංඛාර ස්කන්ධය, විඤ්ඤාණ ස්කන්ධය

iii කාලය, දේශය කුමක් වුවද සසර දුකින් එතෙර වීමට අවබෝධ කරගත යුතු විශ්ව සාධාරණ ධර්මතාව ත්‍රිලක්ෂණයයි. එම දහම මෙලොව ඕනෑම අභියෝගයක් හමුවේ නොසැලී කටයුතු කොට ජය ලැබීමට ශක්තිය ලබා දෙයි. (යනාදී අදහස් ඇතුළත් සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න.)

(03) i උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති.

ii උත්සාහවන්ත මනා සිහිය ඇති, නිවැරදි ක්‍රියා කරන, නුවණින් විමසා බලා කටයුතු කරන , හික්මීමෙන් යුතුව, දැහැමින් ජීවත්වන අප්‍රමාදී පුද්ගලයාගේ යසස වර්ධනය වන්නේය.

iii උත්සාහය, සිහි කල්පනාව, පිරිසිදු ක්‍රියා කිරීම, දොස් නිදොස් බලා කුසල කර්ම සිදු කිරීම තුන් දොරින් යහපත් ක්‍රියා කිරීම සීලයෙන් කය හා වචනය සංවර කරගැනීම මිච්ඡාජීවයෙන් වැළකී සම්මා ආජීවයෙන් යුතුව කටයුතු කිරීම සහ අප්‍රමාදීව කටයුතු කිරීම වැනි කරුණු ඉස්මතු වන ආකාරයෙන් ලියා තිබීම අවශ්‍යය.

(10 ශ්‍රේණිය 07 පාඩම 43/44පිටු)

(04) i අවි ආයුධ වෙළඳාම
සත්ත්ව වෙළඳාම
මස් වෙළඳාම
වස විස වෙළඳාම
මත් ද්‍රව්‍ය වෙළඳාම

} මේ අතරින් 02 ක්

ii කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, ගවයන් රැක බලා ගැනීම,
රාජ්‍ය සේවය, අනෙකුත් ශිල්ප කර්මාන්ත

iii කල්‍යාණ මිත්තතා යනු යහපත් මිතුරන් ඇසුරු කිරීමයි. යහපත් මිතුරන් පස්පව් දස අකුසල් සිදුකරන්නේ නැත. ඔවුන් තුළ සද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා ආදී ගුණ ධර්ම ඇත, එවැනි මිතුරන් සමඟ කල්‍යාණ මිතුරු ඇසුරෙන් චරිත සංවර්ධනය සහ ආර්ථික දියුණුව සැලසෙන අයුරු පෙන්වා දිය යුතු ය.

(11 ශ්‍රේණිය 08 පාඩම)

(05) i වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව

ii විනය විරෝධිව කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම
අකැප දස වස්තුව ප්‍රතික්ෂේප කිරීම.
ශික්ෂාපද ලිහිල් නොකර ඉදිරියට පවත්වාගෙන යාම
නිකාය හෙවත් කොටස් වශයෙන් 18 කට බෙදී යාම.

iii උක්ත සඳහන් කළ අවසන් ප්‍රතිඵලය හැර ඉතිරි ඒවා ශාසනයේ චිරස්ථිතිය සඳහා උපකාරී වූ බව පැහැදිලි වන ලෙස ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කිරීම සුදුසු ය. විනයෝ නාම සාසනස්ස ආයු.... විනය සසුනේ ආයුෂ බවත්, දසවස්තුව ප්‍රතික්ෂේප කිරීම මඟින් සසුනේ විනය ස්ථාපිත වූ බවත් පැහැදිලි කර තිබිය යුතුයි.

(06) i වජ්ජී රජ දරුවන්ටය.

ii 10 ශ්‍රේණිය 22 පාඩම 126 පිට, එම කරුණු හතෙන් සුදුසු තුනක් ලියා තිබිය යුතුය.

iii ii හි සඳහන් කරුණු යහපත් රාජ්‍ය පාලනයට උදව්වන ආකාරය හේතු සහිතව පෙන්වා දී තිබිය යුතුය.

(07) කෙටි සටහන් ලිවීම

i වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමි (10 ශ්‍රේණිය 06 පාඩම 34/35/36/37 පිටු)

ii මෙහෙණී සසුන (11 ශ්‍රේණිය 17 පාඩම 119/120/121 පිටු)

iii සතර සංග්‍රහ වස්තුව (10 ශ්‍රේණිය 22 පාඩම 127/128 පිටු)

iv ප්‍රතිමාඝර (11 ශ්‍රේණිය 18 පාඩම 131/132 පිටු)

(ලකුණු 2 x 5 = 10 යි)

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය 07 | | |
| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |

## 1 පත්‍රය

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

(01) බරණැස ඉසිපතන මිගදායේ දී බුදුරජාණන් වහන්සේ කළ මංගල ධර්ම දේශනාව අයත් සූත්‍රය වන්නේ,
(1) මහා මංගල සූත්‍රයයි. (2) දම්සක්පැවතුම් සූත්‍රයයි.
(3) අනන්ත ලක්ඛණ සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

(02) පූතිගත්තතිස්ස හා මොග්ගල්ලාන වැනි භික්ෂූන්ට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරදුන්ගේ,
(1) අසරණ සරණ ගුණයයි. (2) ගිලනුන්ට උවටැන් කිරීමේ ගුණයයි.
(3) යථාවාදී තථාකාරී ගුණයයි. (4) පුරිසදම්මසාරථී ගුණයයි.

(03) චතුරාර්ය සත්‍යය ධර්මයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්වා ඇත්තේ,
(1) දුක්ඛ ආර්ය සත්‍යයේ ය.
(2) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයේ ය.
(3) දුක්ඛ නිරෝධාර්ය සත්‍යයේ ය.
(4) දුක්ඛ නිරෝධගාමිණී පටිපදා ආර්ය සත්‍යයේ ය.

(04) සිදුහත් බෝසතාණන් වහන්සේ මුහුණ දුන් අතිශය දුෂ්කර අභියෝගයක් වන්නේ,
(1) ලොව්තුරා බුද්ධත්වයට පත්වීමයි. (2) ශ්‍රාවක ශ්‍රාවිකාවන් සොයා ගැනීමයි.
(3) දුෂ්කර ක්‍රියාවන් සිදුකිරීම අත් හැරීමයි. (4) පස්වග තවුසන්ගේ උදවු නොමැති වීමයි.

(05) බුදුරජාණන් වහන්සේ සමාජ සම්බන්ධතා පෙන්වමින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ
(1) මහා මංගල සූත්‍රයයි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) පත්තකම්ම සූත්‍රයයි.

(06) වැසිකිළි පරිහරණයේදී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම මුල් කොටගෙන ධර්මධර හා විනයධර භික්ෂූන් වහන්සේලා දෙපිරිසක අතර ඇති වූ කලහකාරී හැසිරීමට හේතු වූ විහාරය වන්නේ,
(1) සැවැත් නුවර ජේතවනාරාමයයි. (2) කොසැඹෑ නුවර ඝෝෂිතාරාමයයි.
(3) මගධයේ වේළුවනාරාමයයි. (4) කෝසලයේ රාජකාරාමයයි.

(07) බුදුරජාණන් වහන්සේගේ බාහිර රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය කෙරෙහි ඇති වූ ප්‍රසාදය හේතු කොට ගෙන උන්වහන්සේ අනුගමනය කිරීමට පෙළඹුනේ,
(1) අනුරුද්ධ හිමි ය. (2) නාගිත හිමි ය.
(3) නන්ද හිමි ය. (4) වක්කලී හිමි ය.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(08) හිඳීම, සිටීම, ඇවිදීම, ආදී සියලු ක්‍රියාවන්හි දී අවබෝධයෙන් යුතු වීම,
(1) සති සම්පජඤ්ඤයයි. (2) සුභරතාවයි.
(3) සන්තුට්ඨිතාවයි. (4) ඉන්ද්‍රිය සංවරයයි.

(09) වැලිවිට අසරණ සරණ සිරි සංඝරාජ හිමියන් විසින් රචනා කළ ග්‍රන්ථයක් නොවන්නේ,
(1) සාරාර්ථ සංග්‍රහයයි. (2) බුදුගුණාලංකාරයයි.
(3) සතර බණවර සන්නයයි. (4) මුනිගුණාලංකාරයයි.

(10) සමාජයක වැදගත්ම ඒකකය වන පවුල් ඒකකය පිළිබඳව කතා කිරීමේ දී සැමියා විසින් බිරිඳට ඉටු කළ යුතු යුතුකමක් වන්නේ,
(1) ගරු කිරීම ය. (2) මැනැවින් හික්මවීම ය.
(3) සමානාත්මතාව දැක්වීම ය. (4) පවින් වැළැක්වීම ය.

(11) සාරධා සෑම කරුණක් පිළිබඳව ම තර්කානුකූලව විමසීමෙන් යුතුව සොයා බලයි. මේ අනුව සාරධා අයත් වන්නේ,
(1) සද්ධා චරිතයටයි. (2) බුද්ධි චරිතයටයි.
(3) මෝහ චරිතයටයි. (4) විතර්ක චරිතයටයි.

.

(12) "ජිඝච්ඡා පරමා රෝගා".... යන පාලි පාඨයෙන් අදහස් වන්නේ,
(1) කුසගින්න ලොව බලවත්ම රෝගය බවයි.
(2) පිපාසය ලොව බලවත්ම රෝගය බවයි.
(3) නිදිමත ලොව බලවත්ම රෝගය බවයි.
(4) අලසකම ලොව බලවත්ම රෝගය බවයි.

(13) භික්ෂූන් වහන්සේලාගේ කායික නිරෝගීතාවය සඳහා සක්මන් මළුව අනුමත කරන ලද්දේ,
(1) අනේපිඬු සිටුතුමාගේ ඉල්ලීමකට අනුව ය.
(2) විශාකා මහා උපාසිකාවගේ ඉල්ලීමකට අනුව ය.
(3) කොසොල් රජතුමාගේ ඉල්ලීමකට අනුව ය.
(4) ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීමකට අනුව ය.

(14) හස්තසාර ග්‍රන්ථයක්වන ධම්මපදය සූත්‍ර පිටකයේ කිනම් නිකායට අයත්ද?
(1) දීඝ නිකායටයි. (2) මජ්ජිම නිකායටයි.
(3) අංගුත්තර නිකායටයි. (4) ඛුද්දක නිකායටයි.

(15) "සතිමතෝ" යන්නෙහි අදහස වන්නේ,
(1) එළඹ සිටි සිහියයි. (2) අප්‍රමාදයයි.
(3) උත්සහවන්ත බවයි. (4) යහපත්ව කටයුතු කිරීමයි.

(16) වයසට ගිය කල්හි පසු තැවීම නාකි කොස්වා ලිහිණියෙකු මසුන් නැති විලක් දෙස බලා සිටින්නාක් වැනි නිෂ්ඵල ක්‍රියාවක් බැව් ප්‍රකට වන ගාථා ධර්මය වන්නේ,
(1) සූකරානි අසාධූනී...යන්නයි. (2) උට්ඨානවතෝ සතිමතෝ...යන්නයි.
(3) අචරිත්වා බ්‍රහ්ම චරියං...යන්නයි. (4) අත්තනාව කතං පාපං...යන්නයි.

(17) අනිමිස ලෝචන පූජාව තුළින් බුදුරජාණන් වහන්සේලා ලොවට දුන් ආදර්ශය වන්නේ,
(1) සමාධිය වැඩීම සඳහා රුක් සෙවන තිබිය යුතු බවයි.
(2) තුරුලතාවලට ආදරය කළ යුතු බවයි.
(3) කෙළෙහිගුණ දැක්විය යුතු බවයි.
(4) සිටි ඉරියව්වෙන් භාවනා කළ යුතු බවයි.

(18) "මහා සංඝ රත්නය මනා වූ පිළිවෙත් පුරණ නිසා"
(1) උජුපටිපන්න වේ (2) ඤායපටිපන්න වේ.
(3) ආහුනෙය්‍ය වේ. (4) සුපටිපන්න වේ.

(19) බුදුරජාණන් වහන්සේට වේරඤ්ජාවෙහි "යව" නැමැති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදුවූයේ,
(1) දහවන වස් කාලයේ දී ය. (2) දොළොස්වන වස් කාලයේ දී ය.
(3) පහළොස්වන වස් කාලයේ දී ය. (4) විසිඑක්වන වස් කාලයේ දී ය.

(20) දෙවන ධර්ම සංගායනාව සඳහා සහය වූ පිරිසට අයත් වන්නේ,
(1) ආනන්ද තෙරණුවෝ ය. (2) උපාලි තෙරණුවෝ ය.
(3) රේවත තෙරණුවෝ ය. (4) මහාදේව තෙරණුවෝ ය.

(21) විශේෂ පුද්ගලයෙකු හෝ පිරිසක් අරභයා පිහිටවීමට බුදුරජාණන් වහන්සේ වැඩම කිරීම හඳුන්වන්නේ,
(1) සදහම් චාරිකා ලෙස ය. (2) සම්බුද්ධ චාරිකා ලෙස ය.
(3) නිබද්ධ චාරිකා ලෙස ය. (4) ධර්ම චාරිකා ලෙස ය.

.

(22) මහින්දාගමනයෙන් පසු ඉදි වූ මුල්ම ස්තූපය වන්නේ,
(1) මහියංගන ස්තූපයයි. (2) ථූපාරාමය ස්තූපයයි.
(3) ලංකාරාම ස්තූපයයි. (4) ජේතවනාරාම ස්තූපයයි.

(23) "මම පොත් රචනා කළේ මුදල් හම්බ කිරීමේ අදහසින් නොවේ" මෙම ප්‍රකාශය කරන ලද්දේ,
(1) සරණංකර හිමි ය. (2) රේරුකානේ චන්ද්‍රවිමල හිමි ය.
(3) වෑත්තෑවේ හිමි ය. (4) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.

(24) ගිහියෙකු ධනය පරිහරණය කළ යුතු ආකාරය ප්‍රාප්ත කර්ම සතරක් ඇසුරු කරගෙන දේශනා කරනු ලැබුයේ,
(1) පුණ්ණවර්ධන සිටුතුමාට ය. (2) අනේපිඬු සිටුතුමාට ය.
(3) බරණැස් සිටුතුමාට ය. (4) ධනංජය සිටුතුමාට ය.

(25) බෞද්ධ විහාරස්ථානයකට ගොස් මුලින් ම වන්දනාමාන කළ යුතු ස්ථානය වන්නේ,
(1) බෝධියටයි. (2) චෛත්‍යයටයි. (3) බුදු පිළිමයටයි. (4) දේවාලයටයි.

(26) උත්සාහයෙන්, දැතේ දෙපයේ මහන්සියෙන්, දහඩිය හෙළා ධාර්මික රැකියාවක නිරතවීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දක්වෙන්නේ,
(1) ආරක්ඛ සම්පදා නමිනි. (2) උට්ඨාන සම්පදා නමිනි.
(3) කල්‍යාණ මිත්තතා නමිනි. (4) සමජීවිකතා නමිනි.

(27) බුදුරජාණන් වහන්සේගේ "පුරිසදම්ම සාරථී ගුණය" වර්ණනා කොට රචනා කළ කෘතිය වන්නේ,
(1) බුත්සරණයි. (2) අමාවතුරයි. (3) පූජාවලියයි. (4) දහම් සරණයි.

(28) මෙරට පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදාහැරීම සිදු කළේ,
(1) මැක්සිම් ගෝර්කි පඬිවරයා ය. (2) රොබට් නොක්ස් පඬිවරයා ය.
(3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාය ය. (4) රිස් ඩේවිඩ්ස් පඬිවරයා ය.

(29) ශ්‍රී ලංකාවේ දනට දක්නට ලැබෙන කලාත්මක බව්න් අනූන සඳකඩපහණ පිහිටා ඇත්තේ,
(1) රත්නප්‍රසාද ගොඩනැගිල්ල සමීපයෙහි ය.
(2) අභයගිරියේ බිසෝ මාලිගය අසල ය.
(3) රුවන්වැලි දාගැබෙහි බටහිර දොරටුවෙහි ය
(4) ජේතවරාම පියගැටපෙළ පාමුල ය.

(30) වැලිවිට අසරණ සරණ සිරිසරණංකර සංඝරාජ හිමිපාණන් වහන්සේ විසින් රචිත ශාස්ත්‍රීය ධර්ම ග්‍රන්ථයක් වනුයේ,
(1) ධර්ම විනිශ්චයයි. (2) සරාර්ථ සංග්‍රහයයි.
(3) පොහෝ දිනයයි. (4) අභිධර්ම මාර්ගයයි.

(31) ත්‍රිශික්ෂාවේ ප්‍රඥාවට අයත් වන්නේ,
(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා වාචායි.
(3) සම්මා කම්මන්තයි. (4) සම්මා ආජීවයි.

(32) දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ලංකාවේ සිටි පාලකයා වූයේ,
(1) වළගම්බා රජු ය. (2) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.
(3) ගෝඨාභය රජු ය. (4) කිත්සිරිමෙවන් රජු ය.

(33) භාරතයේ පැවති සතරවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් නොවන්නේ,
(1) මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූත පිරිස් යැවීමයි.
(2) ත්‍රිපිටකයම අංග සම්පූර්ණ වීමයි.
(3) මහායාන සම්ප්‍රදාය ආරම්භ වීමයි.
(4) පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය වීමයි. .

(34) කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ චිත්‍ර නිර්මාණය කරමින් නව චිත්‍ර සම්ප්‍රදායක් හඳුන්වාදුන් චිත්‍ර ශිල්පියා වන්නේ,
(1) සෝමබන්දු විද්‍යාපති මහතා ය. (2) සෝලියස් මෙන්ඩිස් මහතා ය.
(3) ඇල්බට් ධර්මසිරි මහතා ය. (4) ජෝර්ජ් කීට් මහතා ය.

(35) බුදු දහමේ "චතු අප්පමඤ්ඤා" ලෙස දක්වා ඇත්තේ,
(1) සතර සංග්‍රහ වස්තු ය. (2) සතර බ්‍රහ්ම විහරණ ය.
3) සතර අගති ය. (4) සතර කර්ම ක්ලේශ ය.

(36) ජලය කැළඹී ඇත්නම් එහි කිසිවක් නොපෙනේ එමෙන් ම සිත කැළඹුණු විට, නොසන්සුන් වූ විට, මතකය අවධි නොවේ. මෙම සිතේ ස්වභාවය හැඳින්වෙන්නේ,
(1) කාමච්ඡන්ද යනුවෙනි. (2) ව්‍යාපාද යනුවෙනි.
(3) උද්ධච්ච කුක්කුච්ච යනුවෙනි. (4) ථීනමිද්ධ යනුවෙනි.

(37) ජීවක අඹ උයනේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
(1) සෝණදණ්ඩ සූත්‍රයයි. (2) ධනිය ගෝපාල සූත්‍රයයි.
(3) කසීභාරද්වාජ සූත්‍රයයි. (4) සාමඤ්ඤඵල සූත්‍රයයි.

(38) ශ්‍රී ලාංකික කැටයම් කලාවේ "අඩ්ඩචන්ද්‍රපාසාණ" යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) මුරගලයි. (2) සඳකඩපහණයි
(3) කොරවක්ගලයි. (4) පියගැටපෙළයි.

(39) කලාත්මක බවින් උසස් ම බෝධිඝරය පිහිටා ඇත්තේ,
(1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම ය.
(2) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටවෙහෙරෙහි ය
(3) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කණ්ඨක චෛත්‍යයේ ය.
(4) අනුරාධපුර දිස්ත්‍රික්කයේ අභයගිරියේ රත්නප්‍රාසාදයේ ය.

(40) ලෝකයේ වෙසෙන සියල්ලට ම කායික හා මානසික රෝගාබාධවලට මුහුණ දීමට සිදුවේ.මෙය බුදු දහමේ හැඳින්වෙන්නේ,
(1) ජාති දුක ලෙස ය. (2) ව්‍යාධි දුක ලෙස ය.
(3) ජරා දුක ලෙස ය. (4) මරණ දුක ලෙස ය.

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020

උපකාරක ප්‍රශ්න පත්‍රය 07

11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය

## II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

(01). i. ත්‍රිශික්ෂාව ලියා දක්වන්න.

ii. බෞද්ධයාගේ අත් පොත ලෙස හැඳින්වෙන්නේ කුමන කෘතිය ද?

iii. සිගාලෝවාද සූත්‍රයේ දෙමාපියන් හැඳින්වීමට යොදාගෙන ඇති විශේෂ පද දෙකක් ලියන්න.

iv. ඝණ්ටාකාර චෛත්‍ය දැකිය හැකි ස්ථාන දෙකක් ලියන්න.

v. මහින්දාගමනයෙන් පසු ලංකාවේ ඉදිවූ ප්‍රථම ස්තූපය කුමක් ද?

vi. දෙවන සංගායනාව පැවැත්වූ ස්ථානය ලියන්න.

vii. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමියන් පිහිටුවාගත් සමාගම කුමක් ද?

viii. අනුරාධපුර යුගයෙහි "සඳකඩපහණෙහි" දක්නට ලැබෙන සත්ත්ව රූප හතර නම් කරන්න.

ix. "සර්වාස්තිවාදී" සංගායනාව යනුවෙන් හැඳින්වෙන්නේ කුමන සංගායනාව ද?

x සතර සතිපට්ඨානයෙන් දෙකක් ලියන්න.

(02) i ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීලයට අයත් අංග ලියන්න.

ii. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

iii. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳ අවබෝධය ශිෂ්‍යයෙක් ලෙස ඔබට වැදගත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(03) i නතං කම්මං කතං සාධු........ ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ තේරුම ලියන්න.

iii. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය පෙන්වා දිය හැක මෙම කියමන සනාථ කිරීමට කරුණු පෙන්වා දෙන්න.

(04) i සිගාල ගෘහපති පුත්‍රයාට ගෘහ ජීවිතය පිළිබඳ කරුණු පැහැදිලි කරමින් දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?

ii. එම සූත්‍රයට අනුව අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කළ යුතු සමාජ කණ්ඩායම් 03 ක් ලියන්න.

iii. සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට ඉහත සඳහන් සූත්‍ර දේශනාව වැදගත් වන ආකාරය සමාජ කණ්ඩායම් දෙකක් ඇසුරු කොට පැහැදිලි කරන්න.

(05) i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකවින් දක්වන්න.

ii. එම ධර්ම සංගායනාව පැවැත්වීමට දායකත්වය දැක්වූ රජතුමා, එය හැඳින්වූ වෙනත් නමක්, හා මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේලා ලියා දක්වන්න.

iii. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න.

(06) i ගර්භයේ හැඩය අනුව ස්තූපය ප්‍රධාන වශයෙන් බෙදා දැක්විය හැකි ආකාර දෙකක් ලියන්න.

ii. ස්තූපයක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

iii. ස්තූපය හා එහි අංග නිර්මාණයේදී අතීත කලා ශිල්පීන් දැක්වූ කුසලතාවය ඇගයීමට ලක් කරන්න.

(07) සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i වැලිවිට අසරණ සරණ සිරි සංඝරාජ හිමි.

ii. කණිෂ්ක ධර්ම සංගායනාව.

iii. සතර බ්‍රහ්ම විහරණ.

iv සඳකඩපහණ.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 4 | 21. | 3 | 31. | 1 |
| 2. | 2 | 12. | 1 | 22. | 2 | 32. | 4 |
| 3. | 4 | 13. | 4 | 23. | 2 | 33. | 2 |
| 4. | 1 | 14. | 4 | 24. | 2 | 34. | 2 |
| 5. | 3 | 15. | 1 | 25. | 2 | 35. | 2 |
| 6. | 2 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 7. | 4 | 17. | 3 | 27. | 2 | 37. | 4 |
| 8. | 1 | 18. | 4 | 28. | 4 | 38. | 2 |
| 9. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 2 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

**II පත්‍රය**

(01) i ශීල, සමාධි, ප්‍රඥා.
ii ධම්මපදය.
iii පුබ්බ දේව, බ්‍රහ්ම, පුබ්බාචරිය.
iv ථූපාරාම චෛත්‍යය, මහියංගන චෛත්‍යය.
v ථූපාරාම චෛත්‍යය.
vi විශාලා මහ නුවර වාලුකාරාමයේ.
vii සිල්වත් සමාගම
viii ඇත්, අස්, ගව, සිංහ.
ix භාරතයේ පැවති කණිෂ්ක ධර්ම සංගායනාව.
x කායානුපස්සනාව, වේදනානුපස්සනාව, ධම්මානුපස්සනාව, චිත්තානුපස්සනාව

(02) i සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව.
ii සම්මා වාචා - වචනයෙන් සිදුවන බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම යන අකුසල් සතරින් වැළකීම.
සම්මා ආජීව - අවි ආයුධ වෙළඳාමෙන් වැළකීම, මස් මාංශ වෙළඳාමෙන් වැළකීම, වස විස වෙළඳාමෙන් වැළකීම, මත්ද්‍රව්‍ය වෙළඳාමෙන් වැළකීම. යන අකුසල්වලින් වැළකී නිවැරදි දිවි පැවැත්මක් ගත කිරීම.
ආදී පිළිතුරුවලින් එකක් ලියා තිබීම.
iii ආර්ය අෂ්ටාංගික මාර්ගය හා තේරුම් පෙන්වා දෙමින් එය ශිෂ්‍යයෙකුට වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම

(03) i නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්සඅස්සුමුඛෝ රෝදං - විපාකං පටිසේවති
ii යම් ක්‍රියාවක් කිරීමෙන් පසුතැවෙන්නට සිදුවේ ද යම් ක්‍රියාවක විපාකය කඳුළු පිරි මුහුණින් යුතුව අඬමින් විඳින්නට සිදු වේ ද එබඳු දේ නොකිරීම යහපත් ය.

iii ගාථා දෙකක්වත් ඇසුරින් පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදය ඉවහල් වන ආකාරය පෙන්වා දීම.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(04) i සිගාලෝවාද සූත්‍රය

ii නැගෙනහිර දිසාව - මවු පියන්
දකුණු දිසාව - ගුරුවරුන්
බටහිර දිසාව - ස්වාමි භාර්යාවන්
උතුරු දිසාව - හිත මිතුරන්
යට දිසාව - සේවකයන්
උඩ දිසාව - පැවිදි උතුමන්.

iii සිගාලෝවාද සූත්‍රයේ සමාජ කණ්ඩායම් දෙකක් ගෙන එම කණ්ඩායම් යුතුකම් පෙන්වා දෙමින් ගෘහ ජීවිතය සාර්ථක කර ගැනීමට එම කරුණු ඉවහල්වන ආකාරය පෙන්වා දෙමින් පිළිතුරු ලියා තිබීම.

(05) i වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව.

ii රජතුමා - කාලාශෝක, හැඳින්වූ වෙනත් නම - සත්තසතිකා
මූලිකත්වය - සබ්බකාමී මහරහතන් වහන්සේ

iii
- විනය විරෝධී කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම
- අකැප වස්තුව ප්‍රතික්ෂේප කිරීම
- ශික්ෂා පද ලිහිල් නොකොට ඉදිරියට පවත්වාගෙන යාම
- අටලොස් නිකාය බිහිවීම

ආදී ප්‍රතිඵල විස්තරාත්මකව ලියා තිබීම

(06) i සන්ටාකාර, ඝටාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර, ආමලකාකාර

ii




iii ස්තූපය හා එහි අංග ලියා ඒවායේ කලාත්මක බව පිළිබඳ ව විස්තර කර පිළිතුරු ලියා තිබීම.

(07) i 10 ශ්‍රේණිය 06 පාඩම 34 පිටුව

ii 10 ශ්‍රේණිය 19 පාඩම 105 පිටුව

iii 11 ශ්‍රේණිය 22 පාඩම 161 පිටුව

iv 10 ශ්‍රේණිය 20 පාඩම 113 පිටුව

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය 08

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය | කාලය පැය 03 යි |
|---|---|---|

1 පත්‍රය

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න

(01) බෝසත්වරයෙකු තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම යනු,
(1) සත්‍ය සොයා යාමයි. (2) පංච මහා විලෝකනයයි.
(3) දුෂ්කර ක්‍රියා කිරීමයි. (4) අභිනිෂ්ක්‍රමණයයි.

(02) බුදුරජාණන් වහන්සේ අසරණ වූ පිරිස් සොයාගෙන වැඩම කිරීම හැඳින්වෙන්නේ,
(1) සදහම් චාරිකා නමිනි. (2) ධර්ම දූත චාරිකා නමිනි.
(3) නිබද්ධ චාරිකා නමිනි. (4) උදාන චාරිකා නමිනි.

(03) "තමා විසින් ම පිළිපැද ඇස් පනාපිටම මෙලොව දී ම " ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්මය,
(1) සන්දිට්ඨික වේ. (2) අකාලික වේ.
(3) ඒහිපස්සික වේ. (4) ස්වාක්ඛාත වේ.

(04) තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව පංච කාම සම්පත්තියෙන් ඉවත්වීම හැඳින්වෙන්නේ,
(1) සීල පාරමිතාව ලෙසයි. (2) පඤ්ඤා පාරමිතාව ලෙසයි.
(3) අධිෂ්ඨාන පාරමිතාව ලෙසයි. (4) නෙක්ඛම්ම පාරමිතාව ලෙසයි.

.

(05) "දිවා රෑ දෙකෙහිම භාවනාවට යොමු කළ සිත් ඇති බුදු සව්වෝ නිරතුරුව ප්‍රබුද්ධ ජීවිතයක් ගත කරති යි" යන්න බුදුන් වහන්සේ දේශනා කළහ. එහිදී ප්‍රබුද්ධ ජීවිතය යනුවෙන් අදහස් කර ඇත්තේ,
(1) අලසකමින්, උදාසීනකමින් හා අසහනයෙන් තොර ජීවිතයයි.
(2) සියලු කර්මයන් ක්ෂය කරමින් ගෙවන ජීවිතයයි
(3) දන් පින්කම්වල නිරත වෙමින් ගතකරන ජීවිතයයි.
(4) විරමණ සීලය රකිමින් ගත කරන ජීවිතයයි.

(06) දුර ගමන් කරන, තනිව හැසිරෙන, ශරීරයක් නැති ගුහාවක වෙසෙන සිත දමනය කරගන්නා තැනැත්තා මාරයාගේ බැල්මෙන් මිදේ, යන අදහස දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පදය

(1) සුකරානි අසාධූනි.....ය. (2) වාරිජෝව ථලේ ඛිත්තෝ.....ය.
(3) දූරංගමං ඒකචරං....ය. (4) කායේන සංවරෝ සාධූ.....ය.

(07) වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් "පිණ්ඩපාතික සරණංකර" යනුවෙන් හැඳින්වූයේ,
(1) ඉවසිලිවන්ත වූ බැවිනි.
(2) පැවිදි වූ දා සිටම පිඬුසිඟා වැඩීමෙන්ම යැපුණ බැවිනි.
(3) ස්වෝත්සාහයෙන් ඉගෙනගත් බැවිනි.
(4) ගමින් ගමට වඩිමින් ධර්ම දේශනා කළ බැවිනි.

(08) සීලයෙහි ආනිසංස අතරට අයත් නොවන්නේ,
   (1) කීර්තිය පැතිරවීමයි.
   (2) සිහි මුලාවී කළුරිය කිරීමට හැකිවීමයි.
   (3) මරණින් මතු සුගතියෙහි උපත ලැබීමයි.
   (4) මහත් වූ භෝග සම්පත් අත්පත් කරගත හැකි වීමයි.

(09) සිගාලෝවාද සූත්‍රයේ සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය වශයෙන් පැවතිය යුතු සාරධර්ම පද්ධතියක් දක්වා ඇත. එහි දැක්වෙන සම්පූර්ණ යුතුකම් සංඛ්‍යාව,
   (1) 54 කි. (2) 58 කි. (3) 60 කි. (4) 61 කි.

(10) අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කන් දීම යන යුතුකම,
   (1) ගුරුවරයා ශිෂ්‍යයා වෙනුවෙන් ඉටුකරන යුතුකමකි.
   (2) ගිහියා පැවිදි පක්ෂය වෙනුවෙන් ඉටුකරන යුතුකමකි.
   (3) ශිෂ්‍යයා ගුරුවරයා වෙනුවෙන් ඉටුකරන යුතුකමකි.
   (4) දරුවන් දෙමාපියන් වෙනුවෙන් ඉටුකරන යුතුකමකි.

(11) "සමග්ගා හෝථ මා විවදථ" යන පාඨයේ අදහස වන්නේ,
   (1) සමගිය ම යහපති යන්නයි. (2) සමගිවන්න විවාද නොකරන්න යන්නයි.
   (3) සිත සන්සුන් කරන්නේ සමථයයන්නයි. (4) සාසනයේ අයුෂය විනයයි යන්නයි.

.

(12) සතර සංග්‍රහ වස්තු අතරට අයත් නොවන කරුණ තෝරන්න,
   (1) දානයයි (2) ප්‍රිය වචනයි.
   (3) සමානාත්මතාවයි. (4) සීලයයි.

(13) කිසියම් පුද්ගලයෙකුගේ මරණයෙන් පසු පළමු ආත්ම භාවයේදී විපාක දෙන කර්මය හැඳින්වෙන්නේ,
   (1) දිට්ඨධම්මවේදනීය කර්මය ලෙසනි. (2) උපපජ්ජවේදනීය කර්මය ලෙසිනි.
   (3) අපරාපරියවේදනීය කර්මය ලෙසිනි. (4) අහෝසි කර්මය ලෙසිනි.

(14) පුද්ගල හා සමාජ ගැටලු ඇතිවන ආකාරය හා ඒවා විසඳාගත හැකි ආකාරය විමසා බැලීමට සුදුසු බෞද්ධ ඉගැන්වීම් වන්නේ,
   (1) පටිච්චසමුප්පාදයයි. (2) පුනර්භවයයි.
   3) ත්‍රිලක්ෂණයයි (4) කර්මයයි.

(15) සත්ත්ව, පුද්ගල ද්‍රව්‍ය ආදී ඕනෑම ජීව අජීව පදාර්ථයකටම සනාතනික වූ පොදු ධර්මතාවක් වන්නේ,
   (1) සුඛ ලක්ෂණයයි. (2) අනිත්‍ය ලක්ෂණයයි.
   (3) ආත්ම ලක්ෂණයයි. (4) ප්‍රකෘති ලක්ෂණයයි.

(16) බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන ධම්මපදය අයත් වන්නේ,
   (1) අංගුත්තර නිකායට ය. (2) දීඝ නිකායට ය.
   (3) ඛුද්දක නිකායට ය. (4) සංයුක්ත නිකායට ය.

(17) මේ අතරින් මංගල කරුණක් නොවන්නේ
   (1) නුවණැත්තන් ඇසුරු කිරීමයි. (2) පිදිය යුත්තන් පිදීමයි.
   (3) සුදුසු ප්‍රදේශයක වාසය කිරීමයි. (4) අනුවණයන් ඇසුරු කිරීමයි.

(18) බුදුරජාණන් වහන්සේ මිනිසාගේ මෙලොව හිතසුව පිණිසද පරලොව හිතසුව පිණිසද හේතුවන කරුණු සහිතව දීඝජානුකෝලිය පුත්‍රයාට දේශනා කළ සූත්‍රය වන්නේ,
(1) මහාමංගල සූත්‍රයයි. (2) වසල සූත්‍රයයි.
(3) කරණීය මෙත්ත සූත්‍රයයි. (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.

(19) පුද්ගලයන් සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට නම් නොකළ යුතු කාර්යය වන්නේ,
(1) සියලුම ආගම් ඇදහීමයි.
(2) අන්‍යාගමික උත්සවවලට උදවු උපකාර කිරීමයි.
(3) අන්‍ය ආගමිකයන් සමඟ මතවාද ගැටුම් ඇතිකර නොගැනීමයි.
(4) විවිධ ආගමික සංස්කෘතීන්ට ගරු කිරීමයි.

(20) චුල්ලකම්ම විභංග සූත්‍රය අනුව සත්ත්ව හිංසාව සිදු කරන්නා,
(1) අඩු වයසින් මිය යයි. (2) පහත් යැයි සම්මත කුලවල උපදියි.
(3) බොහෝ ආබාධ සහිතව උපදියි. (4) විරූපීව උපදියි.

(21) භික්ෂූන් වහන්සේලාට කායික නීරෝගිකම සඳහා බුදුරජාණන් වහන්සේ සක්මන් මළුව අනුමත කරන ලද්දේ,
(1) ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම හේතුවෙනි.
(2) විශාඛා උපාසිකාවගේ ඉල්ලීම හේතුවෙනි.
(3) බිම්බිසාර රජුගේ ඉල්ලීම හේතුවෙනි.
(4) කොසොල් රජුගේ ඉල්ලීම හේතුවෙනි.
.
(22) අවිධිමත් ලෙස,එමෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි.ඒ අනුව අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාරයට ගන්නා තරමට කෑමට ගිජු වූ තැනැත්තා,
(1) කාකමාසක නම වේ. (2) භුත්තවමිතක නම් වේ.
(3) අලංසාටක නම් වේ. (4) තත්ථාවට්ටක නම් වේ.

(23) බෞද්ධයකු වීමේ පළමු පියවර වශයෙන් සැලකෙන්නේ,
(1) බුදුන් සරණ යාමයි. (2) දහම් සරණ යාමයි.
(3) පන්සිල් සමාදන් වීමයි. (4) තෙරුවන් සරණ යාමයි.

(24) භෝජනයේ පමණ නොදන්නා තැනැත්තා දුර්වල ගසක් සුළඟින් ඇද වැටෙන්නා සේ මරු වසඟයට ඇද වැටෙන බව සඳහන් වන්නේ,
(1) ධම්ම පදයේ ය. (2) ලෝවැඩ සඟරාවේ ය.
3) සිරිත් මල්දමෙහි ය. (4) කාව්‍යශේඛරයේ ය.

(25) බුදුන් වහන්සේ දහවන වස් කාලය ගත කළේ කුමන ස්ථානයේද?
(1) විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි ය. (2) මකුල පර්වතයෙහි ය.
(3) පාරිලෙය්‍ය වනයෙහි ය. (4) භේෂකලා පර්වතයෙහි ය.

(26) පළමු, දෙවන, තෙවන සංගායනා සඳහා දායකත්වය ලබාදුන් රජවරු පිළිවෙළින් සඳහන්වන ප්‍රකාශය තෝරන්න.
(1) අජාසත්ත රජු, දේවානම් පියතිස්ස රජු, ධර්මාශෝක රජු.
(2) කාලාශෝක රජු, අජාසත්ත රජු, ධර්මාශෝක රජු,
(3) අජාසත්ත රජු, ධර්මාශෝක රජු, කාලාශෝක රජු.
(4) අජාසත්ත රජු, කාලාශෝක රජු, ධර්මාශෝක රජු.

(27) අටුවා ග්‍රන්ථ තඹපත් ඉරුවල ලියා සෙල්මුවා මංජුසාවල දමා ස්තූපයක තැන්පත් කරමින් ඒවායෙහි සුරක්ෂිතභාවය තහවුරු කිරීම කුමන සංගායනාවේ ප්‍රතිඵලයක්ද?,
   (1) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (2) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (3) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (4) සිව්වන භාරත ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි.

(28) ලාංකේය කැටයම් ශිල්පියාගේ විස්මිත කලා කෞශල්‍යය ලොවට හෙළි කරන "අඩ්ඩදන්දපාෂාණ"සුවිශේෂි කලා නිර්මාණය වන්නේ,
   (1) චෛතියඝරයයි. (2) සඳකඩපහණයි.
   (3) වාහල්කඩයි. (4) පටිමාඝරයයි

(29) බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ වර්ණනා කරන බුත්සරණ නම් කෘතිය රචනා කළ කතුවරයා,
   (1) විද්‍යා චක්‍රවර්තී පඬිතුමා ය. (2) ගුරුළුගෝමී පඬිතුමා ය.
   (3) වෑත්තෑවේ හිමියන් ය. (4) බුද්ධපුත්‍ර හිමියන් ය.

(30) දුමින්දාගමනය යනුවෙන් හැඳින්වෙන්නේ,
   (1) ශ්‍රී දළදාවහන්සේ ලක්දිවට වැඩම වීමයි.
   (2) ශ්‍රී මහාබෝධින් වහන්සේ රැගෙන සංඝමිත්තා තෙරණියගේ වැඩමවීමයි .
   (3) මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූතයන් වහන්සේලා බුදුදහම රැගෙන ලක්දිවට වැඩම කිරීමයි.
   (4) දෙවන පැතිස් රජුගේ බෑණනුවන් වූ අරිට්ඨ කුමරු පැවිදිවීමයි.

(31) ලෝක සත්ත්වයාට උරුම වී ඇති සසර බිය දුරු කීරීම සංකේතවත් කරන අවුකන බුද්ධ ප්‍රතිමාවේ දක්නට ඇති මුද්‍රාව,
   (1) අභය මුද්‍රාවයි. (2) විතර්ක මුද්‍රාවයි.
   (3) ධ්‍යාන මුද්‍රාවයි. (4) ධර්මචක්‍ර මුද්‍රාවයි.

(32) ලක්දිව බුදුදහම ස්ථාපිත වීමෙන් පසු ගොඩනැගුණු මුල්ම ස්තූපය වන්නේ,
   (1) මහියංගන චෛත්‍යයයි. (2) ථූපාරාම චෛත්‍යයයි.
   (3) ගිරිහඬු සෑයයි. (4) කැලණි චෛත්‍යයි.

(33) "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවායි" යනුවෙන් ප්‍රාර්ථනා කළේ කවුද?
   (1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය. (2) රේරුකානේ චන්දවිමල නාහිමියන් ය..
   3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය. (4) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා ය.

(34) බුදුරදුන් දේශනා කළ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති අතරට අයත් නොවන්නේ,
   (1) දස සක්විතිවත් ය. (2) සතර සංග්‍රහ වස්තු ය.
   (3) සතර ඍද්ධිපාද ය. (4) සප්ත අපරිහානීය ධර්ම ය.

(35) දිවා රාත්‍රී පින් වැඩෙන පිංකමක් ලෙස හැඳින්විය හැක්කේ,
   (1) අට පිරිකර පූජාවයි (2) සාංඝික දානමය පුන්‍යකර්මයයි.
   (3) මල් පලතුරුඋයන් වැවීමයි (4) මල් පහන් පූජා කිරීමයි.

.

(36) මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි කරුණක් නොවන්නේ,
- (1) ලංකාවේ භික්ෂු ශාසනය ආරම්භ වීම ය.
- (2) මහා විහාරය හේතු කොට ගෙන අධ්‍යාපනය ආරම්භ වීම ය.
- (3) චිත්‍ර, මූර්ති,කැටයම් කලාවන් බිහිවීම ය.
- (4) රාජ්‍ය පාලනය භික්ෂූන් යටතට ගැනීම ය.

(37) බෞද්ධ භික්ෂූන් වහන්සේලා දන් වැළඳිය යුතු වන්නේ,
- (1) කඩවසම් බව රැකගැනීම පිණිස ය. (2) මද වඩනු පිණිස ය.
- (3) ශරීරය පුෂ්ටිමත් කරගැනීම පිණිස ය. (4) පිළිවෙත් පිරීමට උපකාර වනු පිණිස ය.

(38) දස රාජ ධර්මයෙහි ඇතුළත් තපස යනුවෙන් හැඳින්වෙන්නේ,
- (1) පාලකයාගේ හදවතෙහි ඇති මොලොක් බවයි.
- (2) ක්‍රෝධයෙන් තොරව කටයුතු කිරීමයි.
- (3) ඉන්ද්‍රිය සංවරව හා තැන්පත් සිතින් ක්‍රියා කිරීමයි.
- (4) ඉවසිලිවන්තව ක්‍රියා කිරීමයි.

(39) සම්මා දිට්ඨිය පිළිබඳව අසත්‍ය ප්‍රකාශය වන්නේ,
- (1) ආර්ය මාර්ගය ආරම්භ වන්නේ සම්මා දිට්ඨියෙනි.
- (2) සිවුසස් දහම් අවබෝධයට වැදගත් වන්නේ සම්මා දිට්ඨියයි
- (3) ලෝක ස්වභාවය ඇති සැටියෙන් දැකීම සම්මා දිට්ඨියෙන් සිදුවේ.
- (4) සම්මා දිට්ඨිය ත්‍රිවිධ ශික්ෂාවන්හි සීල ශික්ෂාවට අයත්වේ..

(40) බුද්ධ වන්දනාවේදී අප සිහියට නගා ගත යුතු බුදුගුණ සංඛ්‍යාව,
- (1) 9 යි. (2) 8 යි.
- (3) 7 යි. (4) 6 යි.

.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2020
උපකාරක ප්‍රශ්න පත්‍රය 08

| 11 ශ්‍රේණිය | විෂයය : බුද්ධ ධර්මය |
|---|---|

### II පත්‍රය

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් **ප්‍රශ්න හතරක්** ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයට ලකුණු **10** බැගින් ද හිමි වේ.

(01). i. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

ii. අංගුලිමාල දමනයෙන් ප්‍රකට වන බුදු ගුණය ලියන්න.

iii. බුදු දහමෙහි සිත කිළිටි කරන අකුසල මූල 3 ලියන්න.

iv. බුදුන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපයක් බවට පත් කරගත් අවස්ථා සඳහා උදාහරණ 2 ක් ලියන්න.

v. ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද 2 ක් ලියන්න.

vi. දස අකුසලයෙහි දැක්වෙන කයෙන් සිදුවන අකුසල් දෙකක් ලියන්න.

vii. අණන සූත්‍රයේ දැක්වෙන චතුර්විධ සැප අතුරින් දෙකක් ලියන්න.

viii. සිගාලෝවාද සූත්‍රයේ ගුරු සිසු සබඳතාව සහ සේව්‍ය සේවක සබඳතාව ඇතුළත් දිසා දෙක පිළිවෙළින් සඳහන් කරන්න.

ix. සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු දෙකක් ලියන්න.

x දාන පාරමිතාව සහ සීල පාරමිතාව පූරණය කළ අයුරු දැක්වෙන ජාතක කතා දෙක ලියන්න

(02) i සීලය නිවැරදිව අර්ථ දක්වන්න.

ii. සිල් පද ගණන අනුව සීලයෙහි ප්‍රභේද තුනක් ලියන්න.

iii. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට සඳහා උපකාරීවන යහ ගුණ දම් වර්ධනයට සීලය ප්‍රයෝජනවත් වන ආකාරය පෙන්වා දෙන්න.

(03) i "සුකරානි ආසාධූනි " ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ තේරුම ලියන්න.

iii. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදයේ වැදගත්කම ගාථා ඇසුරින් පෙන්වා දෙන්න.

(04) i රැකියාවක් ලෙස වෙළෙඳාම තෝරා ගන්නා අයට නොකළ යුතු වෙළෙඳාම් පහක් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත. ඒ අතරින් දෙකක් ලියන්න.

ii. සමජීවිකතාව යන්න කෙටියෙන් විස්තර කරන්න.

iii. ධනය විධිමත් කළමනාකරණයකින් යුතුව පරිහරණය කිරීමට බුදු දහම නිවැරදිව මග පෙන්වීම ලබා දී ඇති අන්දම බෞද්ධ උපදේශ ඇසුරින් පෙන්වා දෙන්න.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(05). i. මහින්දාගමනය කෙටියෙන් අර්ථ දක්වන්න.

ii. මහින්දාගමනයෙන් පසු සිංහල බෞද්ධ ජනතාව තුළ වර්ධනය වූ සාරධර්ම තුනක් ලියන්න.

iii. මහින්දාගමනයෙන් ඔපවත් වූ ලාංකික ජන ජීවිතය යන මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

(06) i සිව්වන ථේරවාදී ධර්ම සංගීතිය හැඳින්වීමට සුදුසු නම් දෙකක් ලියන්න.

ii. සිව්වන ධර්ම සංගායනාවට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න.

iii. ථේරවාද බුදුදහමේ පැවැත්මට මෙම ධර්ම සංගායනාව කොතෙක් දුරට වැදගත් වූයේ දැයි විස්තර කරන්න.

(07) මේ අතරින් මාතෘකා දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න

i දුටුගැමුණු රජතුමා.

ii. සතර පෙර නිමිති.

iii. සහජීවනය

iv චේතියසර

| | | | |
|---|---|---|---|
| 1. ① ② ③ ④ | 11. ① ② ③ ④ | 21. ① ② ③ ④ | 31. ① ② ③ ④ |
| 2. ① ② ③ ④ | 12. ① ② ③ ④ | 22. ① ② ③ ④ | 32. ① ② ③ ④ |
| 3. ① ② ③ ④ | 13. ① ② ③ ④ | 23. ① ② ③ ④ | 33. ① ② ③ ④ |
| 4. ① ② ③ ④ | 14. ① ② ③ ④ | 24. ① ② ③ ④ | 34. ① ② ③ ④ |
| 5. ① ② ③ ④ | 15. ① ② ③ ④ | 25. ① ② ③ ④ | 35. ① ② ③ ④ |
| 6. ① ② ③ ④ | 16. ① ② ③ ④ | 26. ① ② ③ ④ | 36. ① ② ③ ④ |
| 7. ① ② ③ ④ | 17. ① ② ③ ④ | 27. ① ② ③ ④ | 37. ① ② ③ ④ |
| 8. ① ② ③ ④ | 18. ① ② ③ ④ | 28. ① ② ③ ④ | 38. ① ② ③ ④ |
| 9. ① ② ③ ④ | 19. ① ② ③ ④ | 29. ① ② ③ ④ | 39. ① ② ③ ④ |
| 10. ① ② ③ ④ | 20. ① ② ③ ④ | 30. ① ② ③ ④ | 40. ① ② ③ ④ |

**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**
I **පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 1 | 31. | 1 |
| 2. | 3 | 12. | 4 | 22. | 2 | 32. | 2 |
| 3. | 1 | 13. | 2 | 23. | 4 | 33. | 4 |
| 4. | 4 | 14. | 1 | 24. | 1 | 34. | 3 |
| 5. | 1 | 15. | 2 | 25. | 3 | 35. | 3 |
| 6. | 3 | 16. | 3 | 26. | 4 | 36. | 4 |
| 7. | 2 | 17. | 4 | 27. | 4 | 37. | 4 |
| 8. | 2 | 18. | 4 | 28. | 2 | 38. | 3 |
| 9. | 4 | 19. | 1 | 29. | 1 | 39. | 4 |
| 10. | 3 | 20. | 3 | 30. | 2 | 40. | 1 |

(මුළු ලකුණු 01 **X**40 = 40)

---

II **පත්‍රය**

(01) i මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා.

ii පුරිසදම්මසාරථී ගුණය

iii ලෝභ, දෝස, මෝහ.

iv ඉසිපතනයේ මිගදායේ පළමු දම් දෙසුම, ගිජ්ජකූට පර්වතයෙහි සූකරකත ලෙන තුළදී වේදනා පරිග්‍රහ සූත්‍රය ජීවක අඹ උයනේදී සාමඤ්ඤඵල සූත්‍රය
(10 පෙළපොත 16 පාඩම 50-91පිටු)

v අකාරවතී ශ්‍රද්ධාව හා අමූලිකා ශ්‍රද්ධාව.

vi ප්‍රාණඝාතය, අදත්තාදානය (සොරකම), කාමමිථ්‍යාචාරය.

vii අත්ථිසුඛ, භෝග සුඛ, අණන සුඛ, අනවජ්ජ සුඛ

viii ගුරු සිසු - දකුණු දිසාව සේව්‍ය සේවක - යට දිසාව

ix අත දමාගසමින් ආහාර නොගැනීම, ආහාර ළං කිරීමට කලින්ම මුඛය විවෘත නොකිරීම
(10 පෙළ පොත 18 පාඩම 99 පිටු)

x වෙස්සන්තර ජාතකය - සීල විමංසා ජාතකය

(02) i පුද්ගලයන්ගේ කායික වාචසික සංවරයයි

ii පංච සීලය,උපෝසථ අෂ්ඨාංග සීලය, ආජීව අෂ්ටමක සීලය

iii සීලය යනු කායිකව හා වාචසිකව යහපැවැත්ම හා අර්ථ සම්පන්නව ක්‍රියා කිරීමයි.ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය සඳහා කය සහ වචනය සමාජ හිතකාමී ලෙස පවත්වා ගැනීම අතිශය වැදගත්ය. චරිත සංවර්ධනයෙහි ප්‍රමුඛ අවස්ථා හතක් සීලයෙන් ආරක්ෂාවේ. චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය කෙරේ මනා අවබෝධයක් ශිෂ්‍ය ජීවිතය තුළ ඇතිකර ගත යුතුය. නුවණැති පුද්ගලයන්ගේ පැසසුමට ලක්ව සැමට ප්‍රියශීලි අයෙක් ලෙස ක්‍රියාකරන්නට තම සීලයෙන් යුක්ත වීම අත්‍යවශ්‍යය. සීලයේ ආනිසංස ලබාගෙන, යහ ගුණදම් වර්ධනය කරගෙන සාර්ථක ජීවිතයක් ගත කිරීමට නම් සීලමය ගුණයෙන් පිරිපුන් ශිෂ්‍යයෙක් විය යුතුය.

(03) i "සුකරානි අසාධූනි -අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුංච- තං වේ පරම දුක්කරං"

ii තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුය යම් දෙයක් තමාට වාසිදායක යහපත පිණිස හෝ පවතීද එවැනි දේ කිරීම ඉතා අපහසුය.

iii ධම්මපද ගාථා තුනක් වත් ඇසුරෙන් පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් සනාථ වන ලෙස ලියන ලද පිළිතුරට උපරිම ලකුණු දෙන්න.

(04) i අවි ආයුධ වෙළඳාම, සත්ත්ව වෙළඳාම, මස් වෙළඳාම, වස විස වෙළඳාම,
මත් ද්‍රව්‍ය වෙළඳාම.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ii ධාර්මිකව උපයා තම ආදායමට සරිලන ආකාරයට වියදම් කිරීමයි. අයවැය ගැන සැලකිලිමත්ව කටයුතු කිරීමත් අය ඉක්මවා නොයන පරිද්දෙන් වැය පවත්වා ගැනීමත් මෙයින් අදහස් කෙරේ.

iii සිගාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, අනණ සූත්‍රය, මංගල සූත්‍රය, පත්තකම්ම සූත්‍රය වැනි සූත්‍ර තුළ විධිමත්ව කළමණාකරණය පිළිබඳව උපදෙස් ලබාදී ඇත. ගිහි බෞද්ධයාගේ ධන පරිහරණය තුළින් ආත්මාර්ථය හා පරාර්ථය සැලසීමත්, විවිධ උවදුරු වලින් ආරක්ෂා කර ගැනීමත් පංචබලි නම් වූ යුතුකම් ඉටු කිරීමත්, පැවිදි උතුමන්ට දානාදියෙන් සංග්‍රහ කිරීමත් කළ යුතු බව බෞද්ධ උපදේශනයයි. එමෙන්ම උපයන ධනය කොටස් හතරකට බෙදා පරිහරණය කළ යුතු අන්දමත් බෞද්ධ ඉගැන්වීම් තුළ ඇතුළත්ය. භෞතික ලෝකයේ පවත්නා සීමිත සම්පත් නිසි කළමනාකරණයකින් යුතුව පරිහරණයට යොමුවීම වැදගත් බැවින් බෞද්ධ උපදේශ අනුගමනය වැදගත් බව මෙහිදී අවධාරණය කෙරේ.

(05) i සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වැන්නෙහි දෙවනපැතිස් රජතුමාගේ රාජ්‍ය වර්ෂයේ මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස මිහින්තලය අම්බස්තලයට වැඩම කිරීමයි.

ii
- දානාදී පින්කම් පැවැත්වීමට, යොමු වීම
- වන්දනා හා වතාවත් කෙරෙහි නැඹුරුවීම.
- වැඩිහිටියන්ට සැලකීමට යොමු වීම.
- ආගන්තුක සකත්කාරය කෙරෙහි යොමුවීම.
- මව්පියන්ට උපස්ථාන කිරීම.
- චාම් සරල ජීවිතයකට යොමුවීම.

iii මහින්දාගමනයේ දායාද ඇතුළත් විය යුතුය. ථේරවාදී බුදු දහම, භාෂාව හා සාහිත්‍ය, අධ්‍යාපය, කලා ශිල්ප සාරධර්ම හා පුදසිරිත්, ආර්ථික හා දේශපාලන පිළිවෙත් ඇතුළත් කර ලියන ලද ලිපියකට සුදුසු ලෙස ලකුණු ලබා දෙන්න (11 ශ්‍රේණිය 17 පාඩම බලන්න)

(06) i
- අලුවිහාර සංගීතිය
- පුස්තකාරූඪ සංගීතිය

ii මහා විහාරික භික්ෂූන්ට අනාගතයේදී ථේරවාදී බුදු දහමට හානි පැමිණෙතැයි ඇතිවූ සැකය.
- බැමිණිතිසාය සාගතය නිසා උගත් ධර්මධර විනයධර භික්ෂූන් අපවත්වීම හා වෙනත් රටවලට වැඩම කිරීම නිසා මුඛ පරම්පාරාවෙන් ධර්මය පවත්වා ගෙන යාමට ඇතිවූ ගැටලු.
- වළගම්බා රජ සමයේ පැවති යුධ වාතාවරණය ශාසනික පැවැත්මට හානිකර ලෙස බලපෑම
- ලක්දිව ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ ශාසනික පිළිවෙත් පිරිහීයාම
- විදර්ශනා ධූරය වඩන භික්ෂූන්ට සමානව ග්‍රන්ථධූරය වැඩීමට ඇතිවූ අවශ්‍යතාවය

(10 ශ්‍රේණියේ 19 පාඩම)

iii ත්‍රිපිටක ධර්මය වාචෝත්ගතව පවත්වාගෙන යාමෙන් එහි ඇතිවීමට තිබූ විකෘතිතාවයන් අවම කර ගැනීමට මේ තුළින් හැකිවිය.භික්ෂූන් වහන්සේලා විවිධ නිකායාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හි පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථේරවාද බුදු දහම විෂයෙහි එල්ල වීමට තිබූ අභියෝගද මෙම ධර්ම සංගායනාව හේතුවෙන් අවම විය. පසුකාලීනව ථේරවාදී බුදු දහම අභාවයට ගිය කල්හි නැවත එය ස්ථාපිත කිරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාර වූ අතර වෙනත් රටවල ථේරවාදී බුදු දහම අභාවයට ගිය කල්හි එය නැවත ස්ථාපිත කිරීමට ලාංකේය ධර්ම ග්‍රන්ථ උපකාර විය. බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට පසු කාලයේ ඒ පිළිබඳ දැනුම බෙදා හැරීමට මෙම ධර්ම සංගායනාවෙන් සිදුවූ පුස්තකාරූඪ කිරීම ඉතාමත් වැදගත් ලෙස හේතු වූ බව කිව හැකිය.

(07) i දුටු ගැමුණු රජතුමා - 10 ශ්‍රේණිය 06 පාඩම 37 පිටුව

ii සතර පෙර නිමිති - 10 ශ්‍රේණිය 01 පාඩම 03 පිටුව

iii සහජීවනය - 10 ශ්‍රේණිය 11 පාඩම 62 පිටුව

iv චෛතියඝර - 10 ශ්‍රේණිය 20 පාඩම 111 පිටුව